සැ.යු.: (i) 2026.11.13 දින පළ වූ 2514 *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවී ය.

(ii) 2026.11.13 දින පළවන *ගැසට්* පත්‍රයේ VI කොටසේ 2026 වර්ෂය සඳහා හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්ගේ ලැයිස්තුවක් පළ වී ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,515 - 2026 නොවැම්බර් මස 13 සිකුරාදා - 2026.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
තනතුරු ඇබෑර්තු	-	විභාග, විභාග ප්‍රතිඵල ආදිය	-

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම් සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 දෙසැම්බර් මස 04 දින පළකෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2026 නොවැම්බර් මස 20 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ප්‍රසන්න ජයරත්න,
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82848 - (2026/11)
E - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබුවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මූදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මූදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම කැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්ව්ලෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යටෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම්, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යටෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම් ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසු නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මූදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මූදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මූදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මූදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මූදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මූදල් ප්‍රමාණය මෙන් 150%ක මූදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මූදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්ට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මූදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මූදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අනිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මූදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියක් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට වරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

විභාග අපේක්ෂකයින් සඳහා නීති සහ උපදෙස්

1976 අංක 19ත් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ විධිවිධානයන්ට සහ වරින්වර පනවනු ලබන නීති හා රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට සියලු විභාග අපේක්ෂකයින් බැඳී ඇත.

1976 අංක 19 සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 20 වගන්තිය මගින් විභාග කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත කොන්දේසි හා සීමා කිරීම් නියම කරනු ලැබේ.

සියලු විභාග අපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතු අතර මෙම නීති කිසිවක් උල්ලංඝනය කරන විභාග අපේක්ෂකයකුට විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි පහත දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකි ය.

(i) විමර්ශනයට භාජනය වූ මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම තහනම් කිරීම
(ii) විමර්ශනයට භාජනය වූ විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සක් කිරීම
(iii) මුළු ජීවිත කාලයටම විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන සියලු විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(iv) නිශ්චිත කාලවකවානුවක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවලට පෙනී සිටීම තහනම් කිරීම
(v) අත්හිටවූ විභාග තහනමක් සහිතව ලිපියක් නිකුත් කිරීම
(vi) සහතික පත්‍රය යම්කිසි කාලසීමාවක් තුළ තහනම් කිරීම
(vii) ප්‍රසිද්ධ විභාග පනත යටතේ අපරාධ නඩුවක් පැවරීම සඳහා විභාග අපේක්ෂකයා පොලිසියට භාරදීම හෝ එම ක්‍රියාව සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කිරීම
(viii) විභාග අපේක්ෂකයා රජයේ සේවකයකු වන අවස්ථාවකදී විභාග අපේක්ෂකයාගේ ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් අදාළ විභාග අපේක්ෂකයාගේ පත්වීම් බලධාරියා වෙත (විනය ක්‍රියා මාර්ග ගැනීම සඳහා) වාර්තා කිරීම

විභාගයට පෙර හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ මොනයම් අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

1. සියලුම විභාග අපේක්ෂකයින් විභාග ශාලාව තුළදී සහ විභාග පරිශ්‍රය තුළදී විභාග ශාලාධිපතිට සහ ඔහුගේ කාර්ය මණ්ඩලයට ද අනෙකුත් විභාග අපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස හැසිරිය යුතුය. එසේම, විභාග අපේක්ෂකයන් විභාග පරිශ්‍රයේ දේපළවලට හෝ විභාග කාර්ය මණ්ඩලයේ පොද්ගලික දේපලවලට කිසිදු අන්දමකින් හෝ අලාභ හානි නොකළ යුතු ය.

2. විභාග අපේක්ෂකයින් විභාගය පවත්වාගෙන යන කාලසීමාව තුළදීන්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතිගේ සහ ඔහුගේ කාර්ය මණ්ඩලයේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයට උත්තර ලිවීම ආරම්භ කර පැය භාගයක් ගත වුවාට පසු කිසිදු විභාග අපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කර ගනු නොලැබේ. විභාගය අවසන් වන තුරු ද කිසිම අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටව යාමට ඉඩ ලබා දෙනු නොලැබේ. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට නියමිත වේලාවට සහභාගී වීමට කටයුතු කළ යුතු ය.

4. සෑම විභාග අපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුය. තමන්ට නියම කරන ලද අසුන හැර වෙනත් තැනක අසුන් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදු වේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළතදී විභාග කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතා බස කිරීම හෝ පණිවිඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන් ම තහනම් වේ.

6. විභාග අපේක්ෂකයකුගේ උත්තර පත්‍රය භාරගනු ලබන්නේ අපේක්ෂකයාගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම ලිවීම, උත්තර පත්‍රය භාරගනුගත හැකි වන අයුරින් යම් සලකුණක් හෝ සටහනක් යෙදීම, උත්තර පත්‍රවල අසභ්‍ය හෝ අනවශ්‍ය දේ ලිවීම, උත්තර පත්‍ර සමග මුදල් නෝට්ටු ඇමිණීම සපුරා තහනම් වේ. අන්‍ය විභාග අපේක්ෂකයකුගේ විභාග අංකය තම උත්තර පත්‍රයේ ලිවීම ද වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. භාරගනුගත නොහැකි පරිදි විභාග අංක ලියා ඇති උත්තර පත්‍ර ද ප්‍රතික්ෂේප කිරීම සිදු කෙරෙනු ඇත.

7. තමන් වෙත විභාග ශාලාවේදී සපයන කඩදාසි (විභාගය පැවැත්වෙන දිනයට අදාළව නිරීක්ෂකගේ කෙටි අත්සන හා දිනය යොදා ඇති පිළිතුරු ලිවීමේ කඩදාසි) හැර ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙනත් තැනක හෝ කිසිවක් නොලිවිය යුතු ය. මෙම උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සලකනු ලැබේ.

8. විභාග අපේක්ෂකයින් වෙත සපයනු ලබන කඩදාසි හෝ පිළිතුරු ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක් ම පැහැදිලිව කපා හැර උත්තර පත්‍රයට ඇමිණීම හෝ විභාගය අවසානයේ පිළිතුරු පත්‍ර සමග භාරදීම හෝ ලබා දෙන උපදෙස් පරිදි සිදු කළ යුතුය. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටතට ගෙනයාම තහනම් වේ. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක නැවත ලියවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතු ය.

9. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම් ය. මෙම සියලු ද්‍රව්‍යයන් විභාග කොමසාරිස් ජනරාල් සතුවන අතර මෙම නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන ලිපි ද්‍රව්‍ය හා එක් එක් විභාගයේදී ළඟ තබා ගැනීමට ලිබිනව අවසරදී ඇති ද්‍රව්‍යයන් හැර වෙනත් සටහන් පොත්, සටහන් ඇතුළත් කොළ හෝ කොළ කැබලි යනාදිය විභාග ශාලාව තුළ විභාගයට පෙනී සිටින අවස්ථාවේදී තමා සන්තකයේ හෝ සම්පයෙහි හෝ තබා නොගත යුතු ය. එසේම විභාග ශාලාව තුළ දී ජංගම දුරකථන, විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) තමා සන්තකයේ හෝ සම්පයෙහි තබා ගැනීම සහ එම උපකරණ / උපාංග භාවිතා කර බාහිර පාර්ශ්වයන්ගේ උදව් ලබා ගැනීම හා විභාගය පැවැත්වෙන අතරතුර වෙනත් පාර්ශ්ව හා සමාජ මාධ්‍ය වෙත තොරතුරු යැවීම වංචනික ක්‍රියාවක් සේම දඬුවම් ලැබිය හැකි වරදක් වන්නේ ය.

11. විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග ඉහත 10 ඡේදයේ විස්තර කර ඇති කාර්යයන් සඳහා භාවිතා කර අසු වුවහොත් එම උපකරණ / උපාංග අදාළ විමර්ශන කටයුතු අවසන් වන තුරු විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයට ගැනීමට කටයුතු කරනු ලැබේ.

12. විභාග ශාලාවේ අසුන් ගැනීමෙන් පසු විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අවස්ථාවේදී කිසිම විභාග අපේක්ෂකයකු ළඟ, විභාගය සඳහා ගෙන ඒමට අවසර ලබාදී නොමැති කිසිදු ද්‍රව්‍යයක් හෝ උපකරණයක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන් ම තහනම් ය. විභාග ශාලාධිපති හෝ කාර්ය මණ්ඩලය නියම කළහොත් සෑම අපේක්ෂකයකුම තම සන්තකයේ තිබෙන දෑ සහතික කිරීමට සහ පරීක්ෂා කිරීමකට යටත් වන අතර මෙම අවශ්‍යතා කඩ කිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට උත්සහ දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. යම් අපේක්ෂකයකු වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ සංඥා මගින් හෝ වෙන කිසිවකින් හෝ කොපි කිරීම හෝ කොපි කිරීමට ප්‍රයත්න දැරීම හෝ වංචා සහගත ලෙස කටයුතු කිරීම හෝ වරදක් වන්නේ ය. වෙන අයදුම්කරුවකුට උදව් දීම ද වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් හෝ විභාග කාර්ය මණ්ඩලයෙන් හෝ උදව් ලබා ගැනීම ද වරදක් වන අතර උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසියට යටින් තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතු ය.

14. විභාගය ආරම්භ වී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයකුට ඉඩ දෙනු නො ලැබේ. එහෙත් වැසිකිළි/කැසිකිළි යාමට අවශ්‍යතාවයක් උදෙසා විභාග අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටතට යන්නට වුවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර කාර්ය මණ්ඩලයේ නිලධාරියකුගේ සුපරීක්ෂාකාරිත්වය යටතේ අපේක්ෂකයාට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එලෙස පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු/ඇය සෝදිසියකට භාජනය විය යුතු ය.

15. විභාග ශාලාවේ පිළිතුරු ලිවීමට පටන් ගැනීමට පෙර හෝ පසුව නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවක් වන්නේය. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ ව්‍යාජ අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීම වංචනික ක්‍රියාවක් ලෙස සලකනු ලැබේ.

16.විභාග අපේක්ෂකයකු හෝ විභාග අපේක්ෂකයකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

17. විභාග අපේක්ෂකයන් පහත උපදෙස් පරිදි ක්‍රියා කළ යුතු ය. :

(i) සෑම විභාග අපේක්ෂකයෙකුම තම ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කර ගැනීමත්, ඉල්ලුම් කරන ලද විෂයයන් හා ප්‍රවේශ පත්‍රයේ සඳහන් විෂයයන් අතර නොගැලපීමක් පවතින්නේ නම් විභාග දෙපාර්තමේන්තුව විමසා විභාගයට පෙර සංශෝධනය කර ගැනීමත් සිදු කළ යුතු ය.

(ii) විභාගය පටන් ගැනීමට පැය බාගයකට (1/2) පෙර විභාග ශාලාව වෙත පැමිණීම සුදුසු වන අතර විභාග ශාලාව නිශ්චිතව නොදන්නා විට විභාගය පටන් ගන්නා දිනට කලින් ඒ පිළිබඳ සොයා බලා නියම ස්ථානය නිශ්චිතව හඳුනා ගැනීම යෝග්‍ය වේ.

(iii) විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍රය ඉදිරිපත් කර තම අනන්‍යතාව තහවුරු කළයුතු ය.

(අ). අනන්‍යතාව ඔප්පු කිරීමට අවශ්‍ය ලේඛන විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට කටයුතු කරන අතර, යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ පිළිබඳ විභාග ශාලාධිපති දැනුවත් කර විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීම කටයුතු කළයුතු ය.

(ආ). සෑම අපේක්ෂකයකුම තම අනන්‍යතාව පැහැදිලිව පෙනෙන ලෙස සම්පූර්ණ මුහුණ හොඳින් හඳුනාගත හැකිවන අයුරින් විභාගය පැවැත්වෙන කාලසීමාව තුළ විභාග ශාලාවේ රැඳී සිටිය යුතු ය.

(iv) විභාග අපේක්ෂකයන් බිලූටූත් වැනි විද්‍යුත් සන්නිවේදන උපකරණ / උපාංග (Electronic Communication Devices) භාවිතා නොකරන බව සහතික කර ගැනීම සඳහා විභාග ශාලාවේදී තම දෙකන විවෘතව පැහැදිලිව පෙනෙන ලෙස තබාගත යුතු ය.

(v) විභාග ශාලාවේදී ඔබට ලබා දෙනු ලබන කඩදාසි හැර වෙන මොන ම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුය. ඉතිරිවන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ මේසය මත තබා යා යුතු ය.

(vi) විභාග අපේක්ෂකයන් තම තමන්ගේ පැන්, පැන්සල්, මකන, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතු ය.

(vii) තමන් භාවිතා කරන පිළිතුරු ලිවීමේ පොත සහ සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද, පිරිසිදුව ද උත්තර ලිවිය යුතු ය. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු එම ප්‍රශ්නයේ ම අනෙක් කොටස පටන් ගැනීමට පෙර එක් රුලක්වත් හිස්ව තිබිය යුතුය. සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

(viii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුය. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක නිවැරදිව යෙදීමට කටයුතු කළ යුතු ය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සැදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳින රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද, සෑහෙන පමණ විශාලව ද තිබිය යුතු ය.

(x) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරාගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් සඳහන් කර ඇති උපදෙස් හොඳින් කියවා බැලිය යුතුය. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුව පිළිතුරු ලබාදී නොමැති අවස්ථාවලදී ලකුණු ලබා දීම සිදු කරනු නොලැබේ.

(xi) එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද පොතට අමතරව ලියන කඩදාසි පිටු අංක පිළිවෙළ අනුව එකතුකර වම් පැත්තේ ඉහළ කෙළවරේ නොගැලවෙන සේ ගැටගැසීම / ඇමිණීම කළයුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර සියලුම පිළිතුරු ලියූ කොළ අමුණා තිබේද යන්න තහවුරු කරගත යුතුය. පිළිතුරු පත්‍ර භාරදුන් පසුව විභාග මධ්‍යස්ථානයෙන් බැහැරට ගෙන ගිය කිසිදු පිළිතුරු ලියූ කඩදාසියක් ඇගයීමට ලක් කරනු නොලැබේ.

(xii) ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්යය මණ්ඩලයේ නිලධාරියකුට භාරදිය යුතුය. උත්තර පත්‍ර එකතු කරන තුරු ඔබගේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම්විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවහු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකි ය.

(xiii) යම් කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතිට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට කරා කිරීමට අවශ්‍ය වූ විට අන් අයට බාධාවක් නොවන සේ දෙවරක් මේසයට තට්ටු කිරීමෙන් සංඥා කළ යුතු ය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

තනතුරු - ඇබෑර්තු

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

සිංහල මාධ්‍ය උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු

හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ උප්පැන්න, මරණ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරී ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරී කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02 ක් සහිතව විෂයයන් 06 කින් සමත්ව සිටිය යුතු ය. *නැනහොන්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

සැ. යු.- අ. පො. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැලකිය යුතු ය. එම විෂයය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.

06. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.
රෝහල් කොට්ඨාසයක උප්පැන්න, රෙජිස්ට්‍රාර්ධුරයකට බඳවා ගැනීමේ දී අයදුම්කරුවන්ට රජයේ රෝහල තුළ ප්‍රමාණවත් කාර්යාල පහසුකම් නොලැබෙන අවස්ථාවක රෝහලට කි. මී. 01ක් පමණ නුදුරින් කොට්ඨාසය තුළ පිහිටි සුදුසු වෙනත් ගොඩනැගිල්ලක තම කාර්යාලය පිහිටුවීමට හැකි විය යුතු ය.

07. අයදුම්පත් කැඳවනු ලබන උප්පැන්න, මරණ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

08. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

09. සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026 දෙසැම්බර් මස 14 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 නොවැම්බර් මස 03 දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
හම්බන්තොට	හම්බන්තොට	හම්බන්තොට නගර කොට්ඨාසයේ උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට

11 - 160

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ (සිංහල) රෙජිස්ට්‍රාර් තනතුරු

හම්බන්තොට දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන මනා පෞරුෂයකින් යුත් අය විය යුතු ය.

02. මෙම තනතුර වැටුප් නොලබන සේවාවක් වන අතර ඒ සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකි ය.

03. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට, අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය.

04. විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 වන අතර වයස අවුරුදු 65-70 දක්වා රෙජිස්ට්‍රාර්වරයාගේ රාජකාරි ඉටු කිරීමේ ස්වභාවය, කායික හා මානසික යෝග්‍යතාව අනුව වසරින් වසර සේවය දීර්ඝ කිරීම සිදු කෙරේ. එලෙස සේවය දීර්ඝ නොකරන ඕනෑම අවස්ථාවක අදාළ රෙජිස්ට්‍රාර්වරයාගේ සේවය අවසන් කරනු ලැබේ.

05. මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්ධුරයක් සඳහා අයදුම්කරන්නන් විවාහක අය විය යුතු අතර වැන්දඹු හෝ දික්කසාද නොවිය යුතු ය.

06. කොට්ඨාසයේ ජනතාවගේ භාෂා අවශ්‍යතා අනුව දෙවෙනි භාෂාවකින් රාජකාරි කිරීමේ හැකියාව සමග දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව (තනතුරට අදාළ භාෂා මාධ්‍ය) සඳහා සම්මාන සාමාර්ථයක් ඇතුළුව අ. පොෙ. ස. (සා. පෙළ) විභාගයෙන් අවම වශයෙන් සම්මාන 02ක් සහිතව විෂයයන් 06කින් සමත්ව සිටිය යුතු ය. *නැතහොත්* ඊට සමාන විභාගයකින් සමත්ව සිටිය යුතු ය.

සැ. යු.- අ. පොෙ. ස. (සා. පෙළ) හෝ ඒ සමාන විභාගයක දී එක් විෂයයක් කොටස් දෙකකින් සමන්විත අවස්ථාවල දී, එය එක් විෂයයක් ලෙස සැළකිය යුතු ය. එම විෂය කොටස් දෙකම සමත් නම් පමණක් විෂය සමත් ලෙස සැලකිය යුතු ය.
මවුලවි සහතිකය හෝ අරාබි ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, ඉහත සඳහන් මූලික සුදුසුකම් සපුරා තිබීම සේ සලකනු ලැබේ.

07. කොට්ඨාසයේ සියලු දෙනාට හෝ වැඩිදෙනෙකුට පහසුවෙන් ළඟා විය හැකි කොට්ඨාසයේ මධ්‍යගත ස්ථානයක පිහිටි තනතුරේ ගෞරවය රැකෙන ආකාරයේ ගොඩනැගිල්ලක කාර්යාලය පිහිටුවීමට හැකියාව තිබිය යුතු ය.

08. අයදුම්පත් කැඳවනු ලබන මුස්ලිම් විවාහ කොට්ඨාසයට ඇතුළත් වන ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම්, අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර පහත උපලේඛනයේ සඳහන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, සමෘද්ධි සංවර්ධන සමිති කාර්යාල හා තැපැල් කාර්යාල ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

09. මේ සඳහා අවශ්‍ය අයදුම්පත් හා ගම් ලැයිස්තුව/ග්‍රාම නිලධාරි වසම් ඇතුළත් ''ඇමුණුම I'' අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් හෝ අදාළ ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක. අයදුම්පත් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් ද (www.rgd.gov.lk) ලබා ගත හැක.

10. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් **2026 දෙසැම්බර් මස 14 දින** හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2026 නොවැම්බර් මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
හම්බන්තොට	තංගල්ල	තංගල්ල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ තංගල්ල කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට

11 - 161

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

උප්පැන්න, මරණ හා විවාහ/අතිරේක විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

අංක 2510 හා 2026.10.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* නිවේදනය කර තිබූ පුත්තලම දිස්ත්‍රික්කයට අදාළ රෙජිස්ට්‍රාර් ධුරයන්හි පහත සඳහන් පුරප්පාඩු තනතුරුවලට අදාළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.12.09 දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
පුත්තලම	පල්ලම	පල්ලම කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය)	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම

දිස්ත්‍රික්කය	*ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය*	*ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර*	*ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය*
පුත්තලම	ආණමඩුව	කරඹෑපත්තුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා දෙමළ හත්පත්තුව කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය)	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.
පුත්තලම	කල්පිටිය	සේතාපොල නාවක්කඩු කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා පුත්තලම් පත්තු කොට්ඨාසයේ විවාහ රෙජිස්ට්‍රාර් ධුරය (සිංහල මාධ්‍යය)	දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පුත්තලම.

02. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හැර අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද, කරුණාවෙන් සලකන්න.

එස්. ජලදීපන්,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 170

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

1.0. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) ට අයත් පෝෂණවේදී තනතුරේ II ශ්‍රේණියේ තනතුරු 29 ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0. **බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට යොමුකිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

3.0. පවත්නා පුරප්පාඩු මත පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

4.0. **භාෂා මාධ්‍ය :**

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0. **මෙම තනතුර සඳහා අයදුම් කරනු ලබන අයදුම්කරුවන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතු ය:**

5.1 මූලික සුදුසුකම් :

I. **අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.**
II. **අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.**
III. **අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.**

5.2 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආහාර විද්‍යාව හා පෝෂණවේදය පිළිබඳව විශේෂ උපාධියක් තිබීම.

5.3 **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

6.0. **වයස් සීමාව :**

ඉල්ලුම්කරුවන් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය.

7.0. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය

රු.58, 660 **– 10 x 1190 – 11 x 1360 x 15 x 1670 – රු. 110,570 (**MN– 05-**2025 (ඒ)) වේ.**

8.0. ලිඛිත පරීක්ෂණය :

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂයය නිර්දේශ*	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
01.විෂයානුබද්ධ පරීක්ෂණය	ඒ ඒ තනතුරට අදාළව ක්ෂේත්‍රගත සමාන්‍ය විෂයය කරුණු සහ ප්‍රායෝගික යෙදීම් යන කරුණු සම්බන්ධයෙන් හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.	පැය 01	100	40%
02.බුද්ධි පරීක්ෂණය	පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටලු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙන් අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.	පැය 01	100	40%

9.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතු ය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

IV. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද , ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-05 -2006 (ඒ) බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධාන වලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද යටත් වේ.

10.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස්කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

II. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.12.14 වේ. අයදුම්පත් 2026.12.14 වැනි දිනට හෝ එදිනට ප්‍රථම අධ්‍යක්ෂ (පාලන) 07, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙලවරේ "පෝෂණවේදී තනතුර (විවෘත) බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු යි.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපෑල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්යය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. විභාග ගාස්තුව රු.1000.00 කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. ලංකා බැංකුවේ තැප්‍රොබෙන් ශාඛාවේ " සෞඛ්‍ය ලේකම් " නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතු ය. (මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

VI. රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරී සේවයේ/ ක්‍රමසම්පාදන සේවයේ/ ඉංජිනේරු සේවයේ රු. 854,880/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතු ය.

VII. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

VIII. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

11.0. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12.0. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 31 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරට විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

විභාගය සඳහා ඉදිරිපත් වන මාධ්‍යය (සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ -T) [ ]

පදිංචි දිස්ත්‍රික්කය [ ]

01. 1.1 අයදුම්කරුගේ මුලකුරු සමග නම -: Mr./Mrs./Miss. .....
.....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: -: Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

1.2 සම්පූර්ණ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

1.3 සම්පූර්ණ නම :.....
(සිංහලෙන්/දෙමළෙන්) .....

02. 2.1 ලිපිනය(පෞද්ගලික) .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.2 ලිපිනය (පෞද්ගලික) .....
(සිංහලෙන්/දෙමළෙන්) .....

2.3 ලිපිනය(රාජකාරී) .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.4 ලිපිනය(රාජකාරී) .....
(සිංහලෙන්/දෙමළෙන්) .....
(ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික) :- .....

2.6 දුරකතන අංකය (කාර්යාලයීය) :- .....

2.7 විද්‍යුත් ලිපිනය(E-mail Address) :- .....

03. 3.1 උපන් දිනය-:

[ ][ ][ ][ ] [ ][ ] [ ][ ]

වර්ෂය මාසය දිනය

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස -: අවු:.....මාස:..... දින:.....

04. ජාතික හැඳුනුම්පත් අංකය -: .....

05. ස්ත්‍රී/පුරුෂ භාවය -: .....

06. සුදුසුකම්: -

6.1. අදාළ අධ්‍යාපන සුදුසුකම් :

.....
.....
.....
.....
.....
.....
.....

6.2. වෘත්තීය සුදුසුකම් :

.....
.....
.....
.....
.....
.....
.....

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර : .....

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය .....
7.2. ලදුපත් අංකය හා දිනය .....
7.3. ගෙවූ මුදල .....

ලංකා බැංකු ශාඛාවකට රු.1000.00ක මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න.

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුව හොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය-:..... .....,
අයදුම්කරුගේ අත්සන.

09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී.....දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.....,
සහතික කරන්නාගේ අත්සන.
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

සම්පූර්ණ නම - .....
තනතුර - .....
ලිපිනය - .....

10. දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ සහතිකය -: (රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අය සඳහා පමණි.)

මෙම ඉල්ලුම්කරු වන ..... මයා/ මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ පළාත් සභාවේ/ ආයතනයේ ..... වැනි දින සිට සේවය කරයි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/ නොහරින බව ද.....දින ඔහු/ ඇය මා ඉදිරිපිට දී අත්සන් කළ බවත් මින් සහතික කරමි.

.....,
දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම .....
පදවි නාමය .....
දිනය .....
දෙපාර්තමේන්තුව /ආයතනය .....
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

11 - 185

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

ක්ෂේත්‍රගත / කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 – 2006 A) පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරු සඳහා සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

1.0. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් හා ආයතන සඳහා ක්ෂේත්‍රගත/ කාර්යාලගත නිලධාරි ඛණ්ඩ - 02 සේවා ගණයේ (MN 05 –2006 A) ට අයත් පෝෂණවේදී තනතුරේ II ශ්‍රේණියේ තනතුරු 07 ක් සඳහා සීමිත පදනම්න් බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0. බඳවා ගැනීමේ ක්‍රමය :

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන අයදුම්කරුවන් අතුරින් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් කායික යෝග්‍යතාව සහ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමු කිරීමෙන් පසුව පුරප්පාඩු සංඛ්‍යාව අනුව බඳවා ගනු ලැබේ.

3.0. පවත්නා පුරප්පාඩු මත පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක දිනය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ

ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම සම්පූර්ණ කිරීමට/නොකිරීමට ද අමාත්‍යාංශ ලේකම් වෙත බලය ඇත.

4.0. භාෂා මාධ්‍ය :

මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

5.0. බඳවා ගැනීමේ මූලික සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආහාර විද්‍යාව හා පෝෂණවේදය පිළිබඳව විශේෂ උපාධියක් ලබා තිබීම;

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යාවේදී උපාධිය පළමු/දෙවන පන්තියේ සාමාර්ථයක් සමඟ ආහාර විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

5.2 පළපුරුද්ද :

සේවයේ ස්ථිර කර ඇති, ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරන MN-04-2006A වැටුප් කේතය යටතේ වැටුප් ලබන රාජ්‍ය සේවයේ නිලධාරියෙකු වීම.

5.3. කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

5.4. වෙනත් සුදුසුකම් :

I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවන නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට අයදුම්කරුවන් විසින් අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

සටහන :

1. පත්වීම සඳහා අයදුම්කරු/අයදුම්කාරිය තෝරා ගනු ලැබී නම් ඔහු/ඇය මුදා හැරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ එකඟතාව තිබිය යුතු ය.

2. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

6.0. වයස් සීමාව - අදාළ නොවේ.

7.0. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය -

රු.58, 660 **– 10 x 1190 – 11 x 1360 x 15 x 1670 – 110,570 (**MN– 05-20**25(ඒ)) වේ.**

8.0. සීමිත බඳවා ගැනීම :

8.1.0. ලිඛිත පරීක්ෂණය :

ප්‍රශ්න පත්‍රයේ නම	*විෂය නිර්දේශය*	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
01. විෂයානුබද්ධ පරීක්ෂණය	ඒ ඒ තනතුරට අදාළව ක්ෂේත්‍රගත සාමාන්‍ය විෂය කරුණු සහ ප්‍රායෝගික යෙදීම් යන කරුණු සම්බන්ධයෙන් හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.	පැය 02	100	40%
02. බුද්ධි පරීක්ෂණය	පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සහ සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.	පැය 01	100	40 %

8.2.0. **යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
01	අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද	40	අදාළ නොවේ.
02	අමතර අධ්‍යාපන සුදුසුකම්	30	
03	ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ප්‍රකාශන	25	
04	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා	05	
මුළු ලකුණු		**100**	

8.2.1. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට අදාළ විස්තරාත්මක ලකුණු පටිපාටිය පහත පරිදි වේ.

අනු. අංකය	*විෂයය*	*උපරිම ලකුණු*
01	අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද: 40 2026.12.14 දිනට ආශ්‍රිත සේවා ගණයේ වසර 05කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා පහත පරිදි ලකුණු ලබා දෙනු ලැබේ.	

අනු. අංකය	*විෂයය*	*උපරිම ලකුණු*
	I. 2026.12.14 දිනට වසර 5ට වැඩි සේවා කාලය වසරක් සඳහා ලකුණු 01 බැගින් II. 2026.12.14 දිනට ඉහත සේවා කාලය තුළ එක් එක් වසරට අදාළව වැටුප් වර්ධක උපයා ඇත් නම් එක් වැටුප් වර්ධකයක් සඳහා ලකුණු 01 බැගින් III. ඉහත I හා II ට අදාළව ලකුණු ලබා දීමේ දී විනය දඬුවමක් ලබා / විනය දඬුවමකට යටත් කොට / විනය පරීක්ෂණයකට ලක් නොවී තිබිය යුතුය. එසේ විනය සම්බන්ධ කටයුතුවලට යටත්ව ඇති වර්ෂ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.	20 20
02	අමතර අධ්‍යාපන සුදුසුකම් : 30 1. මාස 06ක් හෝ ඊට වැඩි සහතික පත්‍ර පාඨමාලා සඳහා 2. මාස 12ට නොඅඩු සහතික පත්‍ර පාඨමාලා සඳහා 3. උසස් ඩිප්ලෝමා / ඩිප්ලෝමා සඳහා 4. තනතුරට බඳවා ගැනීමට අදාළ උපාධි පාඨමාලාව හැර වෙනත් උපාධියක්/විශේෂ උපාධියක් සඳහා 5. ශාස්ත්‍රපති උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමක් සඳහා 6. දර්ශනපති උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමක් සඳහා 7. ආචාර්ය උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමක් සඳහා 8. ඉහත 3,4,5,6 සහ 7 සුදුසුකම් අතරින් ඕනෑම සුදුසුකමක් ආහාර විද්‍යාව හා පෝෂණවේදය විෂයය ධාරාව මගින් ලබා තිබීම. 9. ඉහත 1 සිට 7 දක්වා සුදුසුකම් අතරින් ඕනෑම සුදුසුකමක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරා තිබීම.	 1 2 3 4 5 6 7 1 1
03	ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ප්‍රකාශන : 25 1. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රය මගින් විද්‍යාපති උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමකට අදාළව වසරකට නොඅඩු පර්යේෂණ නිබන්ධනයක් සඳහා 2. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රය මගින් දර්ශනපති උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමකට අදාළව වසරකට නොඅඩු පර්යේෂණ නිබන්ධනයක් සඳහා 3. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රය මගින් ආචාර්ය උපාධියක් හෝ ඊට සමාන අධ්‍යාපන සුදුසුකමකට අදාළව වසරකට නොඅඩු පර්යේෂණ නිබන්ධනයක් සඳහා 4. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම නිබන්ධනයක්/ පර්යේෂණ පත්‍රිකාවක් විදේශ විශ්වවිද්‍යාලයක් හෝ පිළිගත් ජාත්‍යන්තර ආයතනයක් මගින් ඇගයීමට ලක් කර තිබීම 5. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම නිබන්ධනයක්/ පර්යේෂණ පත්‍රිකාවක් පිළිගත් ජාත්‍යන්තර වෙබ් අඩවියක/ සඟරාවක පළ වී තිබීම	 2 3 4 4 3

අනු. අංකය	*විෂයය*	*උපරිම ලකුණු*
	6. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම නිබන්ධනයක්/ පර්යේෂණ පත්‍රිකාවක් හෝ එහි කොටසක් පුවත්පතක/සඟරාවක පළ වී තිබීම	3
	7. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම නිබන්ධනයක/ පර්යේෂණ පත්‍රිකාවක තොරතුරු/නිරීක්ෂණ/ නිගමන රාජ්‍ය/ පෞද්ගලික ආයතනයක් විසින් තම ආයතනයේ කටයුතු සඳහා භාවිතා කර තිබීම	3
	8. ආහාර විද්‍යාව හා පෝෂණවේදී විෂය ක්ෂේත්‍රයට අදාළ ඕනෑම නිබන්ධනයක/ පර්යේෂණ පත්‍රිකාවක තොරතුරු/ නිරීක්ෂණ/ නිගමන වෙනත් ඕනෑම නිබන්ධනයක/ පර්යේෂණයක පත්‍රිකාවක දත්ත/ තොරතුරු ලෙස භාවිතා කර තිබීම	3
04	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා	5
	එකතුව	100

8.2.2. ලිඛිත විභාගයේ දී අපේක්ෂකයින් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ අවම වශයෙන් 05 දෙනෙකු යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.

8.2.3. ලිඛිත විභාගය සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ අපේක්ෂකයන් ලබා ගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල සලකා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගැනේ.

8.2.4. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කරනු ලැබේ.

9.0. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

I. බඳවා ගනු ලබන නිලධාරින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට එකඟ විය යුතුය.

II. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු ය.

IV. මෙම පත්වීම අවුරුදු 01 ක පරිවාස කාලයකට යටත් වේ.

V. මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, MN-05 -2006 ඒ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් විධිවිධානවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, යටත් වේ.

10.0. අයදුම්පත් ඉදිරිපත් කිරීම :

I. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. ඒ අනුව, අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

II. සෑම අයදුම්කරුවකු/ අයදුම්කාරියක් විසින්ම මුද්‍රණය කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් ආයතන ප්‍රධානියා වෙත භාර දිය යුතු අතර, ඔහු විසින් සෑම අයදුම්කරුවකු/අයදුම්කාරියකම ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය සහ නිවැරදි බවට පුද්ගලිකව සහතික කර ගැනීමෙන් පසු සියලු අයදුම්පත් අධ්‍යක්ෂ (පාලන) 07,සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය අංක

106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 ලිපිනයට ලියාපදිංචි තැපෑල මගින් **2026.12.14** දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "පෝෂණවේදී තනතුර (සීමිත) බඳවා ගැනීම සඳහා අයදුම් පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතු ය.

IV. මේ පිළිබඳ ඉදිරි ලිපි ගනුදෙනු විද්‍යුත් තැපෑල මගින් සිදු කිරීමට ද ඉඩ ඇත. එම නිසා ඔබගේ භාවිතයේ පවතින විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම අනිවාර්යය වන අතර ඒ පිළිබඳ අවධානයෙන් සිටිය යුතු වේ.

V. විභාග ගාස්තුව රු.1000.00 කි. විභාග ගාස්තුව කුමන හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ "සෞඛ්‍ය ලේකම්" නමින් ඇති ගිණුම් අංක **7041318** ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබා ගත් රිසිටිපත ආදර්ශ අයදුම්පතෙහි ඇති කොටුව තුළ නොගැළපෙන සේ ඇලවිය යුතු ය. (මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

11.0. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

12.0. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13.0. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තෝබර් මස 31 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

ආදර්ශ ඉල්ලුම් පත්‍රය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පෝෂණවේදී II ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම - 2026

විභාගය සඳහා ඉදිරිපත් වන මාධ්‍යය :
(සිංහල - S/ ඉංග්‍රීසි - E/ දෙමළ -T) ☐

පදිංචි දිස්ත්‍රික්කය : ☐

01. 1.1 අයදුම්කරුගේ මූලකුරු සමඟ නම -: Mr./Mrs./Miss. .....
.....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: -: Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

1.2 සම්පූර්ණ නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

1.3 සම්පූර්ණ නම :.....
(සිංහලෙන්/දෙමළෙන්) .....

02. 2.1 ලිපිනය(පෞද්ගලික) : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.2 ලිපිනය (පෞද්ගලික) : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....

2.3 ලිපිනය(රාජකාරී) : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) .....

2.4 ලිපිනය(රාජකාරී) : .....
(සිංහලෙන්/දෙමළෙන්) .....
(ලිපිනයෙහි වෙනසක් වේ නම් එය වහාම දැන්විය යුතු ය.)

2.5 දුරකථන අංකය (පෞද්ගලික : .....

2.6 දුරකතන අංකය (කාර්යාලයීය) : .....

2.7 විද්‍යුත් ලිපිනය(E-mail Address) : .....

03. 3.1 උපන් දිනය :

වර්ෂය				මාසය		දිනය		

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස -: අවු:..... මාස:..... දින:.....

04. ජාතික හැඳුනුම්පත් අංකය : .....

05. ස්ත්‍රී/පුරුෂ භාවය : .....

06. සුදුසුකම් :

6.1. අදාළ අධ්‍යාපන සුදුසුකම් :
.....
.....
.....
.....
.....
.....
.....

6.2. වෘත්තීය සුදුසුකම් :
.....
.....
.....
.....

.....
.....
.....

07. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

7.1. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය .....
7.2. ලදුපත් අංකය හා දිනය .....
7.3. ගෙවූ මුදල .....

ලංකා බැංකු ශාඛාවකට රු.1000.00ක මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න.

08. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයාගනු ලැබුව හොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බවද, තෝරා ගැනීමෙන් පසුව නම් යම්කිසි වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකරනු ලබන බවද පිළිගනිමි.

දිනය-:..... .....,
අයදුම්කරුගේ අත්සන.

09. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තර :-

I. නිලධරයාගේ නම : ..... මයා/මිය/මෙනවිය
II. නිලධරයාගේ ජාතික හැඳුනුම්පත් අංක : .....
III. විභාගයට අයදුම්කරන අවස්ථාවේදී දැරූ තනතුර : .....
IV. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අඛන්ඩ අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද?
.....
V. තනතුරේ ස්ථිර කරමින් ස්ථිර කිරීමේ ලිපියක් නිකුත් කර තිබේද? එසේ නම් එම ලිපියේ සහතික කරන ලද පිටපතක් අමුණන්න.....
VI. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05 ක කාලයේ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද?.....
එසේනම් එහි ස්භාවය..... .....
.....
VII. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පෙර වර්ෂ 05 ක කාලය තුළදී විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද?
..... (ඔව් නම් විස්තර සපයන්න) .....
VIII. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද? .....
(ඔව් නම් විස්තරය සපන්න) .....
IX. උසාවියක් ඉදිරියේ නිලධරයා කිසියම් චෝදනාවකට වරද කරු වී තිබේ ද ? .....
(ඔව් නම් විස්තර සපයන්න).....

10. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :

මෙම ඉල්ලුම්කරු වන ..... මයා/මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ / ආයතනයේ .....වැනි දින සිට සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. පසුගිය වසර .....ක කාලය තුල ඔහු/ ඇය චේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, ඔහු/ ඇය මොනයම් හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) යටත් කොට නොමැති බව ද ඉහත සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් පරීක්ෂා කර බැලූ බවද ඒවා නිවැරදි බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදවා හරින/ නොහරින බවද..... දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවද සහතික කරමි.

.....,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :-.....
තනතුර :-.....
දිනය : -.....
දෙපාර්තමේන්තුව / ආයතනය :-.....
(රබර් මුද්‍රාවකින් සනාථ කළ යුතු ය.)

11 - 186

විභාග - විභාග ප්‍රතිඵල ආදිය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -01) යටතේ මූලික තාක්ෂණ ශිල්පී තනතුරුවල III වන ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීම - 2026

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2017.09.07 දිනැතිව අනුමත කරන ලද ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -01) ප්‍රකාරව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මූලික තාක්ෂණ ශිල්පී III වන ශ්‍රේණියේ තනතුරුවලට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2026.12.14 දින වේ.

(2). මෙම විවෘත තරග විභාගය මඟින් බඳවා ගැනීම සිදු කරනුයේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණයේ - (MT -01) මූලික තාක්ෂණ ශිල්පී III වන ශ්‍රේණියේ පහත සඳහන් තනතුරු සඳහා වන පුරප්පාඩු සඳහා යි.

අනු. අංකය	*තනතුර*	*පුරප්පාඩු ගණන*
01	මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	16
02	මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	129
03	මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)	69
04	මූලික තාක්ෂණ ශිල්පී(පිංතාරු)	32
05	මූලික තාක්ෂණ ශිල්පී(බෙලෙක් වැඩ)	3
06	මූලික තාක්ෂණ ශිල්පී (පොරාදු)	4
07	මූලික තාක්ෂණ ශිල්පී (වාත්තු)	14
08	මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)	11
09	මූලික තාක්ෂණ ශිල්පී(කම්මල්)	33
	එකතුව	311

සටහන - ඔබ විසින් සම්පූර්ණ කර ඇති, හදාරා ඇති පාඨමාලාවන් අනුව ඉහත සඳහන් කරන ලද තනතුරු 03 ක් සඳහා ප්‍රමුඛතාවයක් ලබා දී තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ

හැකියාවක් ඔබට ඇත.එම ඉල්ලුම් කර ඇති තනතුරුවල ප්‍රමුඛතාවය අනුව ඔබට පත්වීම ලබා දෙන අතර කිසි විටක එම ප්‍රමුඛතාවය වෙනස් කිරීමට ඉඩ පහසුකම් ලබා දෙනු නොලැබේ.

3). **තනතුරුවලට අදාළ කාර්යයන්** :

අනු. අංකය	*තනතුර*	*තනතුරට පැවරෙන කාර්යයන්*
01	මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	දුම්රිය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර සූත්‍ර මෙවලම්, ඇතුළු ඒ ඒ උප දෙපාර්තමේන්තුවල අදාළ අළුත් වැඩියාවන් කිරීම, නිෂ්පාදනය කිරීම, ගැලවීම, සවි කිරීම, එකලස් කිරීම, යන සියළු කාර්යයන්හි තනතුරට අදාළ කටයුතු කිරීම,
02	මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	සියළුම එන්ජින්, මැදිරි, ගැල් හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමේදී හා අළුත්වැඩියා කිරීමේදීත් කාර්යාල හා කර්මාන්තශාලා පවත්වාගෙන යාමේදී හා සියළුම ඉදිකිරීම් ක්ෂේත්‍රයන් සඳහා අවශ්‍ය වන උපකරණ හා උපාංග තැනීම, ලී බඩු හා උපකරණ තැනීම, ලී බඩු නිෂ්පාදනය කිරීම, මැදිරි තැනීම හා අළුත්වැඩියා කටයුතු ලී ඉරුම්හල් මගින් කෙරෙන ලී ඉරීම්, යතුගෑම, පුලුක්කු කිරීම, වීදුරු කැපීම, හා සවි කිරීම, ඇතුළු සියළුම ආකාරයේ වඩු කාර්මික වැඩ කටයුතු කිරීම, හා උපකරණ නඩත්තු කිරීම සියළුම ආකාරයේ කියත් මුවහත් කිරීම හා අළුත්වැඩියාව
03	මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)	දුම්රිය දෙපාර්තමේන්තුවේ සියලුම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පෙදරේරු කටයුතු හා දුම්රිය මැදිරිවල බිම් තට්ටුවේ සහ වැසිකිළි වලවල්වල සිමෙන්ති දැමීම ඇතුළු නියම කරනු ලබන වෙනත් පෙදරේරු කාර්යයන් ඉටු කිරීම
04	මූලික තාක්ෂණ ශිල්පී (පිංතාරු)	දුම්රිය එන්ජින්, ගැල්, මැදිරි, වාහන, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවලද, කාර්යාල ලී බඩු, ගොඩනැගිලි, පාලම්, සංඥා උපකරණ හා වෙනත් උපකරණ අතින් හා ස්ප්‍රේ මගින් නිවැරදිව පින්තාරු කිරීම සහ සියළු ආකාරයේ පින්තාරු වැඩ කිරීම
05	මූලික තාක්ෂණ ශිල්පී (බෙලෙක් වැඩ)	දුම්රිය එන්ජින්, ගැල්, මැදිරි, වාහන, යන්ත්‍ර සූත්‍රවල නඩත්තු හා අලුත්වැඩියා කිරීම්වලදී අවශ්‍ය වන අමතර කොටස් නිෂ්පාදනය, ලෝහ සංයෝග, ඊයම් මිශ්‍රණ සංයෝග සෑදීම, පාස්සන ද්‍රව්‍යවල අමතර කොටස් කැපීම, යන්ත්‍රාගාර හා උපකරණ නඩත්තුව, ලෝහ ගල්වල හෝ පාස්සන ද්‍රව්‍යයන් නිසි පරිදි පිරිසිදු කර සවිකර අව්වු සාදාගැනීම, නොයෙක් ආකාරයේ හැඩ ඇති කොටස් අවශ්‍ය පරිදි වායුවෙන් ක්‍රියාකරන යන්ත්‍ර මගින් කපා ගැනීම හා කර්මාන්තශාලා නිලධාරීන් දෙන නියෝග අනුව කටයුතු කිරීම
06	මූලික තාක්ෂණ ශිල්පී(පොරාදු)	මැදිරි හා කාර්යාල පුටු, එන්ජින්වල ෂිට් කුෂන් කිරීම, මැදිරි හා කාර්යාලවල තිර රෙදි හා සිග්නල් කොඩිවල මැහුම් වැඩ හා ඇඳන් හා පුටු කුෂන් කිරීම
07	මූලික තාක්ෂණ ශිල්පී(වාත්තු)	දුම්රිය මාර්ග, පාලම් හා ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේදීත්, දුම්රිය ධාවනයට අවශ්‍ය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර සූත්‍ර නඩත්තුවට අවශ්‍ය අමතර කොටස් නිෂ්පාදනය කිරීම, නිෂ්පාදනයට සහාය වීම, යන්ත්‍ර සූත්‍ර පිරිසිදුව තබා ගැනීම මෝස්තර සැකසීම, එම ලේඛන ගබඩා කර තබා ගැනීම, වාත්තු අව්වු සැකසීම, පිරිසිදු කිරීම, ලෝහ උණු කිරීම, වැක්කිරීම, යන්ත්‍ර සූත්‍රවලට අවශ්‍ය තෙල්, ග්‍රීස් ආදිය යෙදීම හා සියළුම ආකාරයේ නඩත්තු කටයුතු
08	මූලික තාක්ෂණ ශිල්පී(කම්මල්)	

අනු. අංකය	*තනතුර*	*තනතුරට පැවරෙන කාර්යයන්*
09	මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)	දුම්රිය එන්ජින්, ගැල් හා මැදිරි, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය වන අමතර කොටස් හා අමුද්‍රව්‍ය ඇණවුම් තිබීම හා සැපයීමේ කාර්යයන් සොයා බලා අදාළ අංශවල සම්බන්ධීකරණය පවත්වා ගැනීමෙන් එම කාර්යයන්හි කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම

(4). **පුහුණු කාල සීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම් :**

4.1 **අධ්‍යාපන සුදුසුකම් :**

(a.) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අ.පොෙ.ස. (සා/පෙළ) විභාගය සමත් වී තිබීම.
(ක්ෂේත්‍රයට අදාළ NVQ 3 හෝ ඊට ඉහළ සුදුසුකම් ලබා ඇති නිළධාරීන් ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති ලෙස සලකනු ලැබේ.)

4.2 **වෘත්තිය සුදුසුකම් :**

තනතුරු නාමය	*වෘත්තිය සුදුසුකම්*	*පුහුණු කාලය*
මූලික තාක්ෂණ ශිල්පී (කම්බිකරු)	තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු NVQ 03/04 මට්ටමේ කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම	අවුරුදු 01
මූලික තාක්ෂණ ශිල්පී (පිංතාරු)		
මූලික තාක්ෂණ ශිල්පී (බෙලෙක් වැඩ)		
මූලික තාක්ෂණ ශිල්පී (පොරාදු)		
මූලික තාක්ෂණ ශිල්පී (වාත්තු)		
මූලික තාක්ෂණ ශිල්පී (ප්‍රගති)		
මූලික තාක්ෂණ ශිල්පී (කම්මල්)		
මූලික තාක්ෂණ ශිල්පී (වඩු)	මු.තා.ශි.(වඩු හා පෙදරේරු) තනතුරු සඳහා තෘතියික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් මාස 06කට නොඅඩු NVQ 03/04 මට්ටමේ කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම.	
මූලික තාක්ෂණ ශිල්පී (පෙදරේරු)		

4.3 **පළපුරුද්ද :**

අදාළ නොවේ

4.4 **කායික සුදුසුකම්**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු අතර, දුම්රිය රෙගුලාසි මාලාවේ දක්වා ඇති අක්ෂි දෘෂ්ඨියක් සහිත විය යුතු ය.

4.5 **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය;

ii. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය;

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* වෙබ් අඩවියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දින වන 2026.12.14 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

4.6 **වයස් සීමාව :**

(a). අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතු ය.

5). **බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයකට යොමුකර ලිඛිත තරග විභාගයේ සහ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුව අනුව වැඩිම ලකුණු ලැබූ අයගේ කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු ප්‍රමාණය අනුව ප්‍රථමයෙන් වසරක පුහුණු කාල සීමාවකට බඳවා ගනු ලබයි. සම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩුව පිරවීම පිළිබඳ තීරණය කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය වේ.

පුහුණුව අවසානයේ ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර සමත් වූ අය මූලික තාක්ෂණ ශිල්පී තනතුරුවල III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වූ අයට, නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණය සඳහා පෙනී සිටීමට අවස්ථා 02 ක් ලබාදෙන අතර, ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

(6) **වැටුප් පරිමාණය :**

පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණිය සඳහා

මෙම තනතුරුවලට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන I අනුව අදාළ වැටුප් පරිමාණය (MT-01-2025) රු.50,090-10X540-11X630-10X1010-10X1,190-84,420/- වේ.ඔබට වැටුප් ගෙවනුයේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන හි III සඳහන් පරිදි වේ.මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

පුහුණු කාල සීමාව සඳහා

මාසික දීමනාව - 2026.12.31 දින දක්වා මාසික දීමනාව රු. 38,863/-කි. 2027.01.01 දින සිට මාසික දීමනාව - රු. 40,000/- කි.

(7). **විභාග ගාස්තුව :**

මෙම විභාගය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරනු ලබන ආයතනය මගින් කොළඹ දී පවත්වනු ලැබේ. විභාග ගාස්තුව රු. 1,200/- කි. විභාග ගාස්තුව දුම්රිය සාමාන්‍යාධිකාරිගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැර වන ලෙස අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර දිවයිනේ පිහිටි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවා අයදුම්කරුගේ නම්න්ම ලබා ගන්නා රිසිට් පත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන සේ අලවන්න. එම රිසිට් පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

1. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.
2. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

(8). **අයදුම් කිරීමේ ක්‍රමය :**

(අ) අයදුම්පත මෙම නිවේදනයේ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසිය දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සෙ.මී.29.5 X 21 ප්‍රමාණයේ A4 කඩදාසියක සකස් කර තම අත් අකුරින් පිරවිය යුතු ය. අංක 01 සිට 2.4 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලට ද වන ලෙස ගෙන අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැළකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. සම්පූර්ණ කරනු ලැබූ අයදුම්පත කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් අයදුම්පත යොමු කිරීමට පෙර එය කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට

අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේ ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් විය යුතු ය.

(*ආ*) අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව, ඉංග්‍රිසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) අයදුම්පත දුම්රිය සාමාන්‍යාධිකාරිගේ හෝ දුම්රිය දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 03 සේවා ගණයේ මූලික තාක්ෂණ ශිල්පි 111 ශ්‍රේණියේ තනතුරු වලට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා වන පුහුණු කාලයට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය 2026 "**යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(*ඉ*) **අයදුම්පත් 2026.12.14 වැනි දිනට** හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරි,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
තැ.පෙ.355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(*ඊ*) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

9) විභාගයට ඇතුළුවීම :

(*අ*) මෙම ලිඛිත විභාගය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරනු ලබන ආයතනය විසින් කොළඹ දී පවත්වනු ලැබේ. *ගැසට්* නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය අත්සන සහතික කරවා ගෙන පළමුවෙන් එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. අයදුම්කරු තම අයදුම්පත්‍රයේ සඳහන් කළ ජාතික හැඳුනුම්පත් අංකයම විභාග ශාලාවේදී ද යෙදිය යුතු වන අතර, යම් හෙයකින් වෙනත් අංකයක් ඇතුළත් කර තිබුණහොත් එම අයදුම්කරුගේ ප්‍රතිඵල අත්හිටවනු ලැබේ. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත්වේ. එම නීති උල්ලංඝනය කළහොත් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

(*ඇ*) **අත්සන සහතික කිරීම :**

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසල් ප්‍රධානියෙකු/ විශ්‍රාමික නිලධාරියෙකු / කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයා/ සාමදාන විනිශ්චයකාරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු/රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු/ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති/ නායක ස්වාමීන් වහන්සේ නමක්/ අන්‍ය ආගමික පූජ්‍යස්ථානයක් භාර පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය.

සටහන :- අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10) අයදුම්කරුගේ අනන්‍යතාව :

අපේක්ෂකයන් විසින් තමන් ඉදිරිපත් වන එක් එක් විෂයය සඳහා විභාග ශාලාධිපති වෙත තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන්

තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11) සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම :

(i.) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර හෝ අවස්ථාවක දී වුව ද ඇයගේ හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ii.) අපේක්ෂකයකු විසින් සපයනු ලබන තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහු හෝ ඇය වෙත පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් තව දුරටත් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුව ද යටත් වේ.

12) විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :

මෙම විභාගය ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නියම කරන ආයතනයක් මගින් කොළඹ දී පමණක් පැවැත්වේ.

12.1 ලිඛිත විභාග මාධ්‍යය -

විභාගය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍යයන්ගෙන් පවත්වනු ලැබේ.

සටහන : (a.) අයදුම්කරුවකු විභාගයේ දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකට ම එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(b.) තම අයදුම්පතෙහි සඳහන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අයදුම්කරුවකුට අවසර දෙනු නොලැබේ.

12.2 ලිඛිත විභාග ප්‍රතිඵල :

ලිඛිත විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

12.3 ලිඛිත විභාගය පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සාමාන්‍ය දැනීම	පැය 01	100	40%
බුද්ධි පරීක්ෂණය	පැය 01	100	40%

12.4 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

★. **සාමාන්‍ය දැනීම**

ශ්‍රී ලංකාවේ සමාජ, දේශපාලන, සංස්කෘතික හා ආර්ථික පරිසරය ද ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත් වන නූතන කරුණු මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධනය සම්බන්ධයෙන්ද අපේකෂ්කයාගේ සාමාන්‍ය දැනීම පිරික්සීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි.

★. **බුද්ධි පරීක්ෂණය**

අපේක්ෂකයාගේ තර්කානුකූල විශ්ලේෂණ ශක්තිය ද, ක්ෂණිකව තීරණ ගැනීමේ හැකියාව ද, තක්සේරු කිරීමට හැකිවන අයුරු, සංඛ්‍යාමය ගැටළු හා භාෂා බණ්ඩ, වගු යනාදිය ඇතුළත්ව පින්තූර හා ප්‍රස්ථාර උපයෝගි කර ගනිමින් බහුවරණ ක්‍රමයට සැකසුණු ප්‍රශ්න පත්‍රයකි.

13) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර ලිඛිත විභාගයෙන් හා යෝග්‍යතා ඇගැයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා **අනුපිළිවෙළ අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවැති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.**

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*	*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
1	අතිරේක අධ්‍යාපන සුදුසුකම්	අ.පොස. උ.පෙළ විභාගයේ දී සමත් වී ඇති විෂයයක් සඳහා ලකුණු 01 බැගින් ද, සම්මාන සාමාර්ථ ලබා සමත් වී ඇති විෂයයක් සඳහා ලකුණු 02 බැගින් වන සේ විෂයයන් 03 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. (ඉංග්‍රීසි භාෂාව හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)	6	20
		ඉංග්‍රීසි විෂයය සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	5	
		පරිගණක හැකියාව සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	5	
		වෙනත් භාෂාවක් සම්බන්ධයෙන් ලබා ඇති සහතිකපත්‍ර/ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා	4	
2	අතිරේක වෘත්තීය සුදුසුකම්	**තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති නිපුණතාවය පිළිබඳ සලකා බලනු ලැබේ. (මූලික වෘත්තීය සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමක් සිදු නොවේ.)**	ලකුණු	30
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 6 පාඨමාලාවන් සඳහා	10	
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් වසර 1 පාඨමාලාවන් සඳහා	20	
		ක්ෂේත්‍රයට අදාළ පිළිගත් ආයතනයකින් ලබාගත් වසර 1 වැඩි පාඨමාලාවන් සඳහා	30	
3	තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද	**තනතුරට අදාළ ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද සලකා බලනු ලැබේ.**	ලකුණු	30
		සේවා පළපුරුද්ද වසර 03 හෝ ඊට වැඩි නම් එක් සේවා සහතිකයකට ලකුණු 15 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	30	
		සේවා පළපුරුද්ද වසර 02 හෝ ඊට වැඩි හෝ 03 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 10 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	20	
		සේවා පළපුරුද්ද වසර 01 හෝ ඊට වැඩි හෝ 02 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 5 බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	10	
		සේවා පළපුරුද්ද මාස 06 හෝ ඊට වැඩි හෝ වසර 01 ට අඩු නම් එක් සේවා සහතිකයකට ලකුණු 2.5බැගින් සේවා සහතික දෙකක් (2) සඳහා	5	
4	විශේෂ/බාහිර දක්ෂතා	ක්‍රීඩා/ශිෂ්‍යභට ආදී කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතිකපත් තුනකට ලකුණු 03 බැගින් උපරිම සහතික 03 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	9	15
		සෞන්දර්ය කුසලතා සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා උපරිම එක් සහතිකයක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	2	
		සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන්ලබා ඇති සහතික/දහම් පාසල් තරග විභාග සහතික එකක් සඳහා ලකුණු 1 බැගින් උපරිම සහතික 02 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.	2	
		ඉහත ලකුණු සඳහා ඉදිරිපත් කර නොමැති වෙනත් බාහිර කුසලතාවක් සම්බන්ධයෙන් ලබා ඇති පිළිගත හැකි සහතික එකක් සඳහා	2	

අනු. අංකය	*ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර*	*සලකා බැලෙන උප ක්ෂේත්‍ර*	*ලබා දෙන ලකුණු ප්‍රමාණය*	*උපරිම ලකුණු ප්‍රමාණය*
5	සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ආකල්ප හා පෞරුෂය	සන්නිවේදනය	2	5
		සවන් දීම	2	
		පෞරුෂය	1	
		එකතුව		**100**

14. පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ හා ප්‍රායෝගික පරීක්ෂණය

14.1 පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන්

විෂයය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂය	පැය 02	100	40%

විෂය නිර්දේශය :

තාක්ෂණ විෂය: තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණ දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

14.2 **පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්ෂණය :**

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
තාක්ෂණ විෂයය	100	40%

විෂය නිර්දේශය :

තාක්ෂණ විෂයය:තෝරාගත් විෂය පිළිබඳ නිපුණතාවය මැන බැලීම සඳහා තනතුරට අදාළ තාක්ෂණ විෂය සම්බන්ධයෙන් වූ න්‍යායික දැනුම ප්‍රායෝගිකව නිවැරදි භාවිතයට ගනු ලබන්නේ දැයි මැන බැලීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

15. සේවා කොන්දේසි :

මෙම තනතුර ස්ථීරය.විශ්‍රාම වැටුප් සහිත ය.

15.1 සේවා ගිවිසුම පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවකට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරින් III ශ්‍රේණියට පත්වීම් ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතුය.එසේ වසර 10 සේවයට පෙර ඉවත්වන නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතු ය.

III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

15.2 රාජ්‍ය භාෂාව :

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

අනෙක් රාජ්‍ය භාෂාව: රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක: PSC/EST/04-01-43/08/2016 හා 2017.09.07 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ-03 සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පටිපාටියට කර ඇති හෝ මින් මතු කරන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද අංක : 2310/29 හා 2022.12.14 වැනි දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලට ද, යටත් විය යුතු ය. තෝරා ගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත්වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුවේ උපදෙස් මාලාවට අනුව තනතුරට අදාළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතු ය.

16). සිංහල හා දෙමළ මාධ්‍යන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

17). කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීමට ද දුම්රිය සාමාන්‍යාධිකාරිට බලය ඇත.

රවින්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරි.

2026 නොවැම්බර් මස 02 වැනි දින,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
ඕල්කට් මාවත,
තැ. පෙ. 355,
කොළඹ 10.

ඇමුණුම II

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩය - 03 සේවා ගණය සඳහාවන බඳවා ගැනීමේ පටිපාටිය - (MT -01) යටතේ මූලික තාක්ෂණ ශිල්පි තනතුරුවල III වන ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීම සඳහාවන පුහුණු කාලයට බඳවා ගැනීම 2026

1. මාධ්‍යය : විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:
සිංහල - 2, දෙමළ - 3,
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

ඉල්ලුම් කරන ලද තනතුර : මූලික තාක්ෂණ ශිල්පි

ප්‍රමුඛතා 01

ප්‍රමුඛතා 02

ප්‍රමුඛතා 03

(*ගැසට් නිවේදනය* 02 අනුව සටහන් කළ යුතු ය)

2. **පෞද්ගලික තොරතුරු:**

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

.....

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDANE)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම:

.....

(උදා : GUNAWARDANE , H.M.S.K) :

2.3 සම්පූර්ණ නම: (සිංහලෙන් / දෙමළෙන්:

.....

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

.....

.....

(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :

2.5 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0, ස්ත්‍රී - 1 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

2.6 ජාතික හැඳුනුම්පත් අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2.7 ජංගම දුරකථන අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

2.8 විවාහක / අවිවාහක බව : විවාහක-1, අවිවාහක -2 [ ]

2.9 ජන වර්ගය : සිංහල -1, මුස්ලිම්-4, දෙමළ -2, වෙනත්-5, ඉන්දියන් දෙමළ-3 [ ]

2.10 උපන් දිනය : වර්ෂය : [ ] මාසය : [ ] දිනය : [ ]

2.11. අයදුම්පත් කැඳවීමේ දිනට වයස : අවුරුදු : [ ] මාස : [ ] දින : [ ]

3. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල විස්තරය :

3.1. විභාග අංකය:.....

3.2. විභාගයට පෙනී සිටි වසර:.....

විෂයය	*ලද ප්‍රතිඵලය*

විෂයය	*ලද ප්‍රතිඵලය*

3.3 තෘතික හා වෘත්තිය කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හදාරා ඇති පාඨමාලාවේ නම:.....
.....

පාඨමාලාවේ කාලය: වසර ☐

..... දින සිට ..... දක්වා

4. මුදල් ගෙවූ තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

5. **අයදුම්කරුගේ සහතිකය :**

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විවෘත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. විභාග නීති රීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පටිපාටිය අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම සම්බන්ධයෙන් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරි නියම කරනු ලබන ආයතනය මගින් පනවනු ලබන නීති රීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

....,
දිනය. අයදුම්කරුගේ අත්සන.

6. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම. (*ගැසට් නිවේදනයේ* 9 (ඇ) පරිදි විය යුතුය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ..... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත් නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත්..... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මා සහතික කරමි.

.....,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය: .....

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :.....
තනතුර : .....
ලිපිනය : .....
(නිල මුද්‍රාව)

7. ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .....මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ආයතනයේ .....ලෙස සේවය කරන අතර ඔහුගේ /ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයෙන් සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

.....,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :.....
පදවි නාමය : .....
දිනය : .....
(නිල මුද්‍රාව)

11 - 111

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 03 -2006 - ඒ) දෙපාර්තමේන්තුගත තනතුරුවල III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් හා ආයතනවල ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL–03) දෙපාර්තමේන්තුගත පහත තනතුරෙහි පවතින පුරප්පාඩු පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අ/අ	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*
01	විදුලි කාර්මික	19

02. අවශ්‍ය සුදුසුකම් :

2.1. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්

අ/අ	*තනතුර*	*අධ්‍යාපන සුදුසුකම්*	*වෘත්තීය සුදුසුකම්*
02	විදුලි කාර්මික	අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වී තිබීම.	තනතුරට අදාළව තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 4 වන මට්ටම (NVQ 4) නොඅඩු මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබිය යුතු ය.

2.2. කායික සුදුසුකම්: - සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

2.3. වෙනත් :-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ බවට අයදුම්පත්‍ර කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(iv) මෙම තනතුර සඳහා අයදුම් කළ හැක්කේ පිරිමි අයදුම්කරුවන්ට පමණි.

03. වයස : අවුරුදු 18ට නොඅඩු - අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

04. බඳවා ගැනීමේ ලිඛිත විභාගය:

ප්‍රශ්න පත්‍රය	*විෂය නිර්දේශය*	*කාලය*	*මුළු ලකුණු*	*සමත් ලකුණු*
1. බුද්ධි පරීක්ෂණය	පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයෝ දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය හා ප්‍රමාණීකරණය හා කාලය හා අවකාශය අතර සම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයෙකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.	පැය 01	100	40%
2. විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම	තනතුරට අදාළ රාජකාරි පිළිබඳ කරුණු ආශ්‍රයෙන් මෙම ප්‍රශ්න පත්‍රය සකස් වේ.	පැය 1 1/2	100	40%

05. බඳවාගැනීමේ වෘත්තීය පරීක්ෂණය

විෂයයන්	*කාලය*	*මුළු ලකුණු*	*සමත් ලකුණු*
ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනාගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම. ඒ සඳහා වන විෂය නිර්දේශය පහත දැක්වේ.	විනාඩි 30	100	40%

තනතුර	*වෘත්තීය පරීක්ෂණයෙහි විෂයය නිර්දේශය*
01. විදුලි කාර්මික	විදුලි උපකරණ සවි කිරීම, අළුත්වැඩියා කිරීම, විදුලි ඒකකවල/ යන්ත්‍රවල දෝෂ, විදුලි රැහැන් ඇදීම, ව්‍යාප්ත කිරීම, සැලසුම් කිරීම, ගොඩනැගිලිවල විදුලිය අළුත්වැඩියා කිරීම

06. බඳවා ගැනීමේ ක්‍රමය :

පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් අතුරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට බඳවා ගනු ලැබේ.

07. වැටුප් ව්‍යූහය හා වැටුප් පරිමාණය මාසික:

රුපියල් 42,780-10x490-10x540-10x590-12x630 -රු. 66,540/- (PL 3–2006 -(ඒ)) (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන (II) අනුව)

08. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(i) බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතු ය.

(ii) පත් කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(iii) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතු ය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි ප්‍රාථමික ශිල්පීය සේවා ගණය (PL 03–2006 -ඒ) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියටද සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

09. අයදුම් කළයුතු ක්‍රමය :

(*අ*) අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය (PL03 -2006 -ඒ) සේවා ගණය විදුලි කාර්මික තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" යනුවෙන් සඳහන් කර 2026.12.13 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන) 04 ශාඛාව, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(*ආ*) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: 2026.12.13

(*ඇ*) විභාග ගාස්තුව රු. 1000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබෙන් ශාඛාවේ සෞඛ්‍ය ලේකම් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි දක්වා ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවීමක් හා වෙනත් විභාගයක් හෝ කරුණක් සඳහා වලංගු සේ සලකා කටයුතු කරනු නොලැබේ. තව ද, අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවන ලද රිසිට්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය. (මුදල් ඇනවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(*ඈ*) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතු ය.

(*ඉ*) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

10. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග ශාලාවට ඇතුළු වීමේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාව වෙත ඇතුලු විය යුතු ය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙසක් වෙතොත් ඒ බව විභාග ප්‍රවේශ පත්‍රය මඟින් ඔබට

දන්වනු ලැබේ. විභාගය සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළු කර නොගැනීම/ විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතු වේ.

11. අත්සන සහතික කිරීම:

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ/ අධ්‍යාපන පරිපාලන සේවයේ/ රජයේ ගණකාධිකාරී සේවයේ රු.854880/- කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථීර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

12. සාවද්‍ය තොරතුරු සැපයීම.

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඊට අදාළ නෛතික ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

13. විභාග කොන්දේසි:-

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026.12.13 දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) මේ සමග ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iv) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරග විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(v) බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය බුද්ධි පරීක්ෂණය හා සාමාන්‍ය දැනුම සහ විෂයානුබද්ධ සාමාන්‍ය දැනීම යන ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(vi) සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද නිලධාරීන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

(vii) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතු ය.

සැලකිය යුතු ය:-

(*අ*) අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතු ය.

(*ආ*) අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයාගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධ නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(*ඇ*) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ - හානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(*ඈ*) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(*ඉ*) මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

(ඒ) එසේම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ඔක්තොබර් මස 31 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

ආදර්ශ අයදුම්පත්‍රය

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL03 -2006 -ඒ) විදුලි කාර්මික තනතුරෙහි III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය: ☐ පදිංචි දිස්ත්‍රික්කය : ☐

(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)

(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

01.

(i) මුලකුරු සමග නම :- .....
(සිංහලෙන්/ දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම:- .....
(සිංහලෙන්/ දෙමළෙන්)

(iii) මුලකුරු සමඟ නම :- Mr./Mrs./Miss .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

(iv) සම්පූර්ණ නම :- .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. පදිංචි ලිපිනය

(i) ස්ථිර පදිංචි ලිපිනය:- .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

(ii) ස්ථිර පදිංචි ලිපිනය:- .....
(සිංහලෙන්/ දෙමළෙන්)

03. උපන් දිනය :-

වර්ෂය :					මාසය :			දිනය :		

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

අවු :			මාස :			දින :		

04. ජාතික හැඳුනුම්පත් අංකය :-.....

05. දුරකථන අංකය : පෞද්ගලික (ජංගම):-..... ස්ථාවර:- .....

06. විද්‍යුත් ලිපිනය:- .....

07. ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. ශ්‍රී ලංකා පුරවැසියෙකුද යන්න බව :- ඔව් ☐ නැත ☐

09. විවාහක / අවිවාහක බව:-.....

10. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය:

වර්ෂය :-...../ ..... විභාග අංකය :-...../ .....

අ/අ	*විෂයය*	*සාමාර්ථය*	
		පළමු වර	*දෙවන වර*
01			
02			
03			
04			
05			
06			
07			
08			
09			
10			

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :-...../ ..... විභාග අංකය :-...../ .....

අ/අ	*විෂයය*	*සාමාර්ථය*	
		පළමු වර	*දෙවන වර*
01			
02			
03			
04			

(*ඇ*) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර :

සහතිකය	*නිකුත් කළ ආයතනය*	*වර්ෂය*	*විෂයයන්*

(වෘත්තීය හා කාර්මික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

(*ඈ*) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද:

.....

11. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී තිබේද?

.....

(ඔව් නම් විස්තර සපයන්න):- .....

12. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :-

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :-.....

II. ගෙවූ මුදල :-.....

ලංකා බැංකු ශාඛාවකට රු. 1000/- මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැළවෙන සේ මෙහි අලවන්න.
(අයදුම්පතෙහි සහ ලදුපතෙහි ඡායාපිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදිවූත් තොරතුරු බවට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසිම වන්දියක් නොමැතිව හා ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගයන්ට යටත්ව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

දිනය :-..... .....,

අයදුම්කරුගේ අත්සන.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන.....මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිට දී..... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.....,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන ලද නිලධාරියාගේ,
සම්පූර්ණ නම :-.....
තනතුර :-.....
ලිපිනය :-.....
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දැනට රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ කටයුතු කරන *ගැසට්* නිවේදනයේ දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් පහත කරුණු අදාළ වේ.

15.1. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තරය :

i. නිලධාරියාගේ නම :- .....
ii. ස්ථිර සේවා ස්ථානය හා ලිපිනය :-.....
iii. ස්ථිර සේවා ස්ථානයේ දුරකථන අංකය :- .....
iv. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :- .....
v. විභාගයට අයදුම්කරන අවස්ථාවේදී දරන තනතුර :- .....
vi. එම තනතුරට පත්වීම් ලැබූ දිනය :- .....
vii. එම තනතුරේ ස්ථිරකර තිබේද? (“ඔව්” නම් ස්ථිර කරන ලද දිනය සඳහන් කරන්න) .....
.....
viii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි හා ඊට ආනුශාංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව,

(අ) විනයානුකූල දඬුවමක් ලබා තිබේද?.....
(“ඔව්”නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)
.....

(ආ) මේ වන විට විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද?.....
(“ඔව්”නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)
.....

(ඇ) දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද?.....
(“ඔව්”නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)
.....

මෙම අයදුම්කරු වන ..... මයා / මිය / මෙනවිය, ආයතනයේ ..... වැනි දින සිට ..... (තනතුර සඳහන් කරන්න) සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. ඉහත 15 කරුණ

යටතේ සඳහන් කර ඇති තොරතුරු මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින / නොහරින බවත් මෙයින් සහතික කරමි.

.....,
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :- .....
පදවි නාමය :- .....
දිනය :- .....
දෙපාර්තමේන්තුව / ආයතනය :- .....
(රබර් මුද්‍රාවෙන් සනාථ කරන්න)

11 - 155

කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුවෙහි
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ
ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කම්කරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ ලඝු ලේඛක තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම් මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.12.14 දිනට පහත 3.0 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 **බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව**

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*
1	ලඝු ලේඛක (සිංහල මාධ්‍යය)	09
2	ලඝු ලේඛක (ඉංග්‍රීසි මාධ්‍යය)	01

1.1 තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

	අනුමත තනතුරු නාම	*කාර්යයන්*
1	ලඝු ලේඛක	- කාර්මික අධිකරණයේ නඩු විමසීම්වල කාර්ය සටහන් ලඝු ලේඛනය කිරීම - සේවය අවසන් කිරීමේ අංශයේ සහ කාර්මික සම්බන්ධතා අංශයේ පරීක්ෂණවල කාර්යය සටහන් ලඝු ලේඛනය කිරීම - පඩි පාලක සභා රැස්වීම්වල කාර්යය සටහන් ලඝු ලේඛනය කිරීම - ඉහත අවස්ථාවල දී හා අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්වලදී ලබා ගන්නා සියළුම කාර්යය සටහන් පරිගණක යතුරු ලියනය කර මුද්‍රිත පිටපත් ලබා ගැනීම - තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි

2.0 බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර ප්‍රශ්න පත්‍රයෙන් 40% ට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම විභාගය තරඟ විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු ය. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

විභාගය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන්ට තමාට කැමති ඕනෑම භාෂා මාධ්‍යයකින් ලිඛිත විභාගය සඳහා පෙනී සිටිය හැකිය. ලඝුලේඛක සිංහල තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද ලඝුලේඛක ඉංග්‍රීසි තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම්

3.1.1 සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා

(*අ*)

- සිංහල භාෂාව
- ගණිතය සහ
- තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

3.1.2 ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා

(*අ*)

- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය සහ
- තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

3.2 වෘත්තීය සුදුසුකම් :

- *සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල මාධ්‍යය) පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය විෂයය (සිංහල මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

- *ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි මාධ්‍යය) පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය විෂයය (ඉංග්‍රීසි මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

සටහන: ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ :

- කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල;
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන;
- ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන;
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන.

3.3 කායික සුදුසුකම් :
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.4 වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
- පැවිදි පුද්ගලයෙකු හෝ ආගමික නිකායක පූජකවරයෙකු නොවිය යුතු ය;
- සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4.0 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

5.1 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5.2 III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

5.3 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සම්බන්ධයෙන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුෂාංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

5.4 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.11 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පටිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

5.5 කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවයේ යොදවනු ලැබේ.

6.0 වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN – 1 - 2025 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් ප්‍රමාණය රු. 45,230 – 10×540 - 11×630 - 10×890 – 10×1,190 - රු. 78,360/- වේ.

7.0 ලිඛිත විභාගය හා වෘත්තීය පරීක්ෂණය :

7.1 ලිඛිත විභාගය

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
– සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (සිංහල මාධ්‍යය) – ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (ඉංග්‍රීසි මාධ්‍යය)	පැය 02	100	40%

(*අ*) ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :
සාමාන්‍ය දැනීම හා වාක්‍ය රචනය

- දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම
- කාලීන වැදගත්කමින් යුත් දෙන ලද මාතෘකා අතුරින් තෝරාගත් මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාව, නිවැරදි ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ).

7.2 වෘත්තීය පරීක්ෂණය :

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
– සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල මාධ්‍යය) – ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි මාධ්‍යය)	100	40

(*ආ*) වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

- *සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 70 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

- *ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

08.0 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.
***සැලකිය යුතු යි.*
සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

09.0 විභාග ගාස්තුව:

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 500/- කි. එම විභාග ගාස්තුව කම්කරු කොමසාරිස් ජනරාල් නමින් ඇති මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100169026274 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතු ය.
(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

10.0 අයදුම්කිරීමේ ක්‍රමය :

10.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21 × 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. අංක 1.0 සිට 7.1 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 07.2 සිට 11.2 දක්වා 02 පිටුවේ ද, අංක 12.0 සිට 15.0 දක්වා 03 පිටුවේ ද, අංක

16.0 සිට 17.0 දක්වා 04 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

10.2 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

10.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4 මෙම විභාගය කොළඹ නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ.

10.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.6 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ "**කම්කරු දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

10.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේ ය.

11.0 අයදුම්පත යොමු කිරීම:

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.12.14 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කම්කරු කොමසාරිස් (ආයතන)
කම්කරු දෙපාර්තමේන්තුව
08 වන මහල
"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල
කොළඹ 05

12.0 විභාගයට පෙනී සිටීම:

(*අ*) සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පමණක් විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(*ආ*) අපේක්ෂකයින් හට තමා විසින් ලබා දී ඇති ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවුඩයක් හරහා ද ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීම සඳහා සබැඳියක් (Link) සපයනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ප්‍රවේශ පත්‍රය තැපෑලෙන් නොලැබුණහොත් මෙසේ බාගත කර ගැනීමේ හැකියාව පවතී. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ඇ*) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

13.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

විභාග ශාලාවේදී තමා පෙනී සිටින විෂයයන් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය.

14.0 **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:**

යම් අපේක්ෂකයෙකුට මෙම ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15.0 මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026ක්වූ නොවැම්බර් මස 02,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

කම්කරු දෙපාර්තමේන්තුවෙහි
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ
ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න. අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.)

02. 2.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම : .....
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදාහරණ (SILVA A.B.D.P.A.)

2.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : .....
.....

2.3 සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : .....
.....

03. 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ)
.....
.....

3.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : .....
.....

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (පුරුෂ - 0, ස්ත්‍රී - 1)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. විවාහක/අවිවාහක බව : (අවිවාහක - 1, විවාහක - 2) (අදාළ අංකය කොටුව තුළ ලියන්න) ☐

07. 7.1 උපන් දිනය : අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

7.2 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2026.12.14 දිනට) වයස:

අවුරුදු : ☐☐☐☐ මාස : ☐☐ දින : ☐☐

08. ජංගම දුරකතන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. විද්‍යුත් තැපැල් ලිපිනය : ☐

10. අයදුම්කරන තනතුර (ඉදිරියෙන් √ ලකුණ යොදන්න)

1	ලඝු ලේඛක (සිංහල මාධ්‍යය)	
2	ලඝු ලේඛක (ඉංග්‍රීසි මාධ්‍යය)	

11. *අධ්‍යාපන සුදුසුකම් :*

11.1 අ.පො.ස. (සා / පෙළ) විභාගය පිළිබඳ :
(i) විභාගයේ වර්ෂය හා මාසය - .....
(ii) විභාග අංකය - .....
(iii) ප්‍රතිඵල

	විෂයය	*ශ්‍රේණිය*		*විෂයය*	*ශ්‍රේණිය*
1			6		
2			7		
3			8		
4			9		
5			10		

11.2 අ.පො.ස. (උ / පෙළ) විභාගය පිළිබඳ :
(i) විභාගයේ වර්ෂය හා මාසය - .....
(ii) විභාග අංකය - .....
(iii) ප්‍රතිඵල:

	විෂයය	*ශ්‍රේණිය*
1		
2		
3		
4		

12. *වෘත්තීය සුදුසුකම් :*

හදාරා ඇති පාඨමාලාව	*පිරිනමනු ලැබූ ආයතනය*	*හදාරන ලද කාල සීමාව*	*සහතිකපත් අංකය හා වලංගු දිනය*

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියකදී වැරදිකරු වී ඇත්ද ? .....
එසේ නම්, ඒ පිළිබඳව විස්තර
.....
.....

14. ඔබ මීට පෙර රජයේ සේවයේ යෙදී සිටියදී සේවය අවසන් කර තිබේද ? .....
එසේ නම්, එම විස්තර සහ සේවය අවසන් කිරීමට හේතු
.....
.....

15. විභාග ගාස්තු ගෙවීම -

14.1 ගෙවූ මුදල : .....
14.2 ගෙවන ලද බැංකුව : .....
14.3 ගෙවූ දිනය : .....
14.4 ලදුපත් අංකය : .....

ලදුපත එහි දාරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත)

16. අයදුම්කරුගේ සහතිකය :

ගැසට් නිවේදනයේ සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව විවෘත තරග විභාගයට පෙනී සිටීමට .....
.....වන මම සුදුස්සෙකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නිතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් බඳවා ගැනීම් පරිපාටිය අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ කිසිදු වන්දියක් නොගෙවා, මාගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි. මම මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක රාජකාරි කිරීමට එකඟ වෙමි.

....,
දිනය අයදුම්කරුගේ අත්සන.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම : (*ගැසට් නිවේදනයේ* 10.8 ඡේදය පරිදි විය යුතුය)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .....(අයදුම්කරුගේ සම්පූර්ණ නම) යන අය මම පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ශාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්,..... දින ඔහුගේ / ඇයගේ අත්සන මා ඉදිරියේ දී තබන ලද බවත් මම සහතික කරමි.

දිනය : ....,
(අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන).

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම : .....
තනතුර : .....
ලිපිනය : .....
(නිල මුද්‍රාවකින් සහතික කළ යුතු ය)

11 - 165

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී (සිවිල්/සංඥා/යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී (සිවිල්/සංඥා/යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියේ ඉදිරියෙන් දක්වා ඇති පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම සඳහා 2026.12.14 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 30 ට නොවැඩි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවේ ප්‍රමුඛත්වය මත පුරප්පාඩු සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් පහත දක්වා ඇති තනතුරුවලින් එක් තනතුරකට පත්කරනු ලබන අතර, පත්වීම් ලද පසු තනතුරු අතර මාරුවීම සඳහා අවසර දෙනු නොලැබේ.

	තනතුරු නාමය	*ශ්‍රේණිය*	*පුරප්පාඩු සංඛ්‍යාව*
1.	සැලසුම් ශිල්පී (සිවිල්)	පුහුණු කිරීමේ ශ්‍රේණිය	8
2.	සැලසුම් ශිල්පී (සංඥා)	පුහුණු කිරීමේ ශ්‍රේණිය	1
3.	සැලසුම් ශිල්පී (යාන්ත්‍රික)	පුහුණු කිරීමේ ශ්‍රේණිය	7

01. අයදුම්පත් කැඳවනු ලබන තනතුර :
සැලසුම් ශිල්පී (සිවිල්/සංඥා/යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණිය

02. තනතුරේ රාජකාරී ස්වභාවය :

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර- තාක්ෂණික සේවා ගණයට අයත් සැලසුම් ශිල්පී (සිවිල්), සැලසුම් ශිල්පී (සංඥා), සැලසුම් ශිල්පී (යාන්ත්‍රික) තනතුරුවලට වෙන් වෙන් වශයෙන් පවරා ඇති රාජකාරී ලැයිස්තුවට අනුව රාජකාරී කටයුතු ඉටු කරනු ලැබිය යුතු යි.

03. වැටුප් පරිමාණය : MN - 03 2025

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව, රු.52,250 – 10x800 – 11x1,190– 10x1,320 – /10x1,350 – 100,040/- ක් වන අතර, රු. 52,250/-ක ආරම්භක වැටුප් තලයේ තබා ගෙවීම් කරනු ලැබේ.
(ii) මීට අමතරව රාජ්‍ය සේවකයන් සඳහා මූලික වැටුපට අමතරව ගෙවනු ලබන අනෙකුත් දීමනා සඳහා ද හිමිකම් ඇත.

04. (*අ*) **අධ්‍යාපන සුදුසුකම් :**

(i) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හයකින් (06) එකවර අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් ව තිබීම;

සහ

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සංයුක්ත ගණිතය හා භෞතික විද්‍යාව ඇතුලු භෞතික විද්‍යා විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම;

හෝ

(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය ඇතුළුව තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම.

(*ආ*) **වෘත්තීය සුදුසුකම් :**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

(*ආ*) **පළපුරුද්ද :** අදාළ නොවේ.

(*ඇ*) කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(*ඇ*) **වයස :**

2026.12.14 දිනට වයස අවු. 18 ට නොඅඩු විය යුතු අතර, වයස අවු. 30 ට නොවැඩි විය යුතු ය.

(*ඉ*) **වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

සටහන - 2026.12.14 දිනට ඉහත සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. පොරොත්තු ලේඛනවල තබා බඳවා ගැනීමක් සිදු නොකරයි.

06. බඳවා ගැනීමේ පරීක්ෂණයේ විභාග පටිපාටිය :

i. විභාග ක්‍රමය :

(*අ*) විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පැවැත්වේ.

(*ආ*) සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ ඉහත (04) යටතේ ඉල්ලා ඇති සුදුසුකම් සපුරා ඇති මාධ්‍යයෙනි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ii. විභාගයේ විෂයයන් :

1. බුද්ධි පරීක්ෂණය	කාලය පැය 01	ලකුණු 100
2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය	කාලය පැය 03	ලකුණු 100

(ලිඛිත ප්‍රශ්න පත්‍රය සඳහා සමත් ලකුණු ප්‍රමාණය 40% වේ.)

iii. විෂයය නිර්දේශය :

විෂයය අංක 01 - බුද්ධි පරීක්ෂණය
අපේක්ෂකයාගේ සිතිමේ තර්කානුකූලතාවයත්, සිද්ධි විශ්ලේෂණය කිරීමේ හැකියාවත්, තීරණ ගැනීමේ හැකියාවත් පරීක්ෂා කෙරේ.

විෂයය අංකය 02 - විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය
ඇඳීමේ මූලධර්ම සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ.

iv. තේරීම් පරිපාටිය :

ලිඛිත පරීක්ෂණයේ ලකුණු 40% ක් බැගින් හෝ ඊට වැඩියෙන් ලබාගත් අයදුම්කරුවන් පරීක්ෂණය සමත් වූ අය සේ සලකනු ලැබේ. ලකුණු ලබාගත් අනුපිළිවෙල මත පෙළගස්වා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් මූලික සුදුසුකම් සපුරා ඇති අය අතුරෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු නොවන අතර අයදුම්පත් කැඳවීම් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබෙදැයි පරීක්ෂා කිරීම සිදු කරනු ලැබේ.

v. විභාග ප්‍රතිඵල :

ගැසට් නිවේදනයේ 06 (iv) ඡේදය අනුව ඉහළම ලකුණු ලැබූ අපේක්ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය දුම්රිය සාමාන්‍යාධිකාරී වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ද ප්‍රතිඵල දන්වා යවනු ඇත.

07. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 1,200.00 කි. එය අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට්පත අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ.

08. අයදුම් කිරීමේ ක්‍රමය :

අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය භාවිත කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක, අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 07 තෙක් පළවන පිටුවට ද, 08 සිට 10 තෙක් එහි දෙවන පිටුවට ද, ශීර්ෂ අංක 11 සිට 13 තෙක් තුන්වන පිටුවට ද ඉතිරිය හතරවන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස්කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/ යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිත කළ හැකිය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පතට ඇතුළත් කොට ලදුපත අලවා ඇද්ද යන්න පිළිබඳව නැවත විමසිලිමත් විය යුතු ය. තව ද, මේ පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

(*අ*) අයදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ආ*) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් **2026.12.14** දින හෝ ඊට පෙර හෝ ලැබෙනු පිණිස එවිය යුතු ය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී (සිවිල්/සංඥා/යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026"** යනුවෙන් ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
පත්වීම් ශාඛාව,
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(*ඇ*) අයදුම්පතේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(*ඈ*) අඩුපාඩු සහිත අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී අයදුම්පත්‍රයක් නැතිවීම් හෝ ප්‍රමාදවීම් ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(*ඉ*) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ.

අයදුම්කරුවන් වෙත ලිඛිත විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් පුවත් පත්වල හා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිළ වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුනි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේ දී අයදුම් කළ විභාගයේ නම් අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර විමසීම වඩාත් ඵලදායි වනු ඇත. තව ද, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තුවට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත් තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානම්ව තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

09. විභාගයට පෙනී සිටීම -

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(*ආ*) අයදුම්කරුවකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අයදුම්කරුවකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශ පත්‍රය, අත්සන සහතික කරවා ගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතු ය. සෑම අයදුම්කරුවකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රය* ආරම්භයේ පළකර ඇත.

සටහන - අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10. අයදුම්කරුවන්ගේ අනන්‍යතාව -

විභාග අපේක්ෂක/ අපේක්ෂකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(a.) ජාතික හැඳුනුම්පත;
(b.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(c.) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ.

තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

11. විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට සිදුවේ.

12. සේවා කොන්දේසි :

සැලසුම් ශිල්පී (සිවිල්) / සැලසුම් ශිල්පී (සංඥා) / සැලසුම් ශිල්පී (යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එක් අවුරුදු පුහුණු කාල සීමාවකට යටත් කරනු ලබන අතර පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා වන දීමනාව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025හි උපලේඛන V පරිදි වේ. පුහුණුව අවසානයේ දී පුහුණු අවසන් පරීක්ෂණයක් පැවැත්වෙන අතර ඉන් සමත් වන්නන් අදාළ තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ තබනු ලැබේ.

13. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

(i.) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිතය. දැනටමත් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක වී ඇත්නම් තවදුරටත් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. පත්වීම සඳහා සුදුසුකම් ලබන භාෂා මාධ්‍ය අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 සහ ඊට අනුෂාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කළ යුතු වේ.

iii. තෝරාගනු ලබන අපේක්ෂකයින් ආයතන සංග්‍රහයේ සහ මුදල් රෙගුලාසිවල සඳහන් විධිවිධාන වලටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති ආයතන කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ විධිවිධානවලටත් යටත්ව කටයුතු කළ යුතු ය. එමෙන්ම, විටින් විට රජය විසින් නිකුත් කරන නියෝගයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු උපදෙස්වලට යටත්ව කටයුතු කිරීමට බැඳී සිටියි.

14. (i.) මෙම බඳවා ගැනීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (MN - 03) - තාක්ෂණික සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් සියලුම විධිවිධාන අදාළ වන බව දැනුම් දෙමි.

(ii.) මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කරුණක් පිළිබඳව අවසාන තීරණය ගැනීමේ බලය දුම්රිය සාමාන්‍යාධිකාරී සතු වේ.

(iii.) මෙම නිවේදනයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය නිවේදන අතර කිසියම් අනුකූලතාවක් ඇත්තේ නම් එවැනි විටකදී සිංහල භාෂාවෙන් වන නිවේදනය නිවැරදි බව සලකා කටයුතු කළ යුතු ය.

රවීන්ද්‍ර පත්මප්‍රිය,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2026 ඔක්තෝබර් මස 28 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 355,
ඕල්කට් මාවත,
කොළඹ 10.

(මේ අනුව A - 4 කඩදාසිවල දෙපසම භාවිත කරමින් පිළියෙල කරගත් අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර අයදුම්පත් කැඳවීමේ නිවේදනය කියවා හොඳින් වටහා ගත යුතු ය.)

ආදර්ශ අයදුම්පත

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමණාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී (සිවිල්/සංඥා/යාන්ත්‍රික) පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය:
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඉල්ලුම් කරන තනතුර :
.....

01. සම්පූර්ණ නම :

(i) සිංහලෙන්/ දෙමළෙන් :
.....

(ii) ඉංග්‍රීසියෙන් :
.....
(උදා: GUNAWARDANE, M.P.N.)

02. මුලකුරු සමග නම :

(i) සිංහලෙන්/ දෙමළෙන් : .....

(ii) ඉංග්‍රීසියෙන් : .....

03. ස්ථිර ලිපිනය :

(i) සිංහලෙන්/ දෙමළෙන් : .....

(ii) ඉංග්‍රීසියෙන් : .....

04. දුරකථන අංකය : (i) | | | | | | | | | | |

(ii) Whatsapp | | | | | | | | | | |

05. ස්ත්‍රී/ පුරුෂ භාවය :

ස්ත්‍රී 1
පුරුෂ 0 | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

06. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

07. පදිංචි :

(i) ග්‍රාම නිලධාරී කොට්ඨාසය ..... එහි අංකය : | |

(ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : .....

(ii) දිස්ත්‍රික්කය : .....

08. උපන් දිනය : වර්ෂය : | | | | මාසය : | | දිනය : | |

2026.12.14 දිනට වයස : අවුරුදු : | | | | මාස : | | දින : | |

09. අධ්‍යාපන සුදුසුකම් :

(i) අ.පො.ස. (සා. පෙළ)
විභාග අංකය : ..... වර්ෂය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති සාමාර්ථය*
(i)		
(ii)		
(iii)		
(iv)		
(v)		
(vi)		
(vii)		
(viii)		
(ix)		
(x)		

(ii) අ.පො.ස. (උසස්. පෙළ)

විභාග අංකය : ..... වර්ෂය : .....

අනු. අංකය	*විෂයය*	*ලබා ඇති සාමාර්ථය*
(i)		
(ii)		
(iii)		
(iv)		

(iii) වෘත්තීය සුදුසුකම් :

.....

.....

09. ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?

ඔව් ☐ නැත ☐

(අදාළ කොටුව තුළ X ලකුණ යොදන්න)

11. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සහ / හෝ අසත්‍ය ලෙස සම්පූර්ණ කර තිබීමෙන් අපේක්ෂකත්වය අවලංගු වන බව හොඳින් දැන සිටිමි. ඉන් වන හානිය මම පුද්ගලිකව දරා ගනිමි.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති කරුණු අසත්‍ය බව මා තනතුරට පත්වීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් බව ද ප්‍රකාශ කරමි. ඉන් සිදුවන හානි වෙනොත් ඒවා ද මම පුද්ගලිකව දරා ගනිමි.

(ඇ) 2026 ..... දින ..... බැංකුවේ ..... ශාඛාවට රු. .....ක් ගෙවා ලබාගත් මුදල් බැරපතෙහි පිටපතක් මේ සමග අමුණා එවමි.

(ඈ) මෙම විභාගයේ කොන්දේසි පිළිපැදීමට එකඟ වෙමි.

(ඉ) තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඊ) තව ද, සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරි විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : ....,

අයදුම්කරුගේ අත්සන.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන, ජාතික හැඳුනුම්පත් අංක ..... දරන .... මහතා/ මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා බවත් ඔහු අද දින මා ඉදිරිපට දී අත්සන තැබූ බවත් සහතික කරමි.

....,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම : .....

තනතර : .....

ලිපිනය : .....

දිනය : .....

13. දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය සේවයේ නිරත අයදුම්කරුවන් සඳහා පමණි.)

මෙම අයදුම්පත ඉදිරිපත් කර ඇති ..... මහතා, ... දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ..... දින සිට ..... දක්වා ..... වශයෙන් සේවය කර ඇත. ඔහුට එරෙහිව නොනිමි විනය චෝදනා වාර්තා වී ඇත// නැත. ඔහුගේ / ඇයගේ වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක/ අසතුටුදායක ය. නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත්, එම ලදුපත අමුණා ඇති බවත්, ඔහු/ ඇය දුම්රිය දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයේ සැලසුම් ශිල්පී තනතුරක් සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම දෙපාර්තමේන්තුවෙන්/ ආයතනයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බව දන්වනු කැමැත්තෙමි.

....,
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය : .....
සහතික කරන නිලධාරියාගේ නම : .....
තනතුර : .....
ලිපිනය : .....
(කරුණාකර නිල මුද්‍රාව තබන්න)

ධීවර ජලජ හා සාගර සම්පත් අමාත්‍යාංශය

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණයේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි පුහුණු ශ්‍රේණිය සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය - 2026

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි තනතුරෙහි පුරප්පාඩු 27ක් සම්පූර්ණ කිරීමට පුහුණු ශ්‍රේණියට විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බඳවා ගැනීම තරග විභාගයක ප්‍රතිඵල මත සිදු කරන අතර එම තරග විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් **2027 පෙබරවාරි මස කොළඹ දී පවත්වනු ඇත.**

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services " යටතේ ඇති "Online Applications-Recruitment / E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 නොවැම්බර් මස 16 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 11 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.**

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

1. **තනතුරට පැවරෙන කාර්යයන් :**

මුහුදේදී ධීවර කාර්මිකයන්ට සහ ධීවර යාත්‍රාවලට වන ආපදා සම්බන්ධව කටයුතු කිරීම, දිනපතා ධීවර කාර්මිකයන්ට අදාළ කාලගුණ වාර්තා සැපයීම, ධීවර ප්‍රාදේශීය කාර්යාලවල පණිවුඩ හුවමාරු සඳහා සම්බන්ධ වීම, ධීවර යාත්‍රා සමග පණිවුඩ හුවමාරුව, ඔවුන්ගේ යාත්‍රා හිමියන්ට සහ අවශ්‍ය අයට තොරතුරු ලබා දීම, නවීන තාක්ෂණය මගින් විධිමත්ව ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබාදීමට සලසා ඇති ක්‍රමවේද පවත්වාගෙන යාම හා පැය 24 පුරාම ධීවර කාර්මිකයන්ට තොරතුරු ලබා දීම යන රාජකාරිවලින් සමන්විත තනතුරකි. (රාත්‍රී වැඩ මුර අනිවාර්ය වේ.)

2. **සේවා කොන්දේසි :**

(අ) රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2012.08.14 දින අංක PSC/EST/7/1/36/1/2012 දිනැතිව අනුමත කර ඇති කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 සේවා ගණයෙහි කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියට ද එම පටිපාටියට දැනට කර ඇති හෝ මතුවට කරනු ලබන්නා වූ සංශෝධනවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයකු පුහුණු කාලසීමාව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් අනතුරුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) මෙම තනතුර ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුර විශ්‍රාම වැටුප් සහිත බව දක්වා තිබුණ ද අනාගතයේදී බඳවා ගනු ලබන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ඇ) මෙම පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සාගර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබාගත් පසුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට තෝරා පත්කරනු ලැබේ.

(ඈ) මෙම පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

(ඉ) පුහුණු කාල සීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම් ලද දින සිට වසර 10ක කාලයක් අනිවාර්යයෙන්ම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවට සේවය කළ යුතු ය.

(ඊ) එසේ වසර 10 ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත්, ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්

නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් වගකීමකට බැඳිය යුතු ය.

(ඒ) පුහුණුව අවසානයේ දී ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණයකට යොමු කර, සමත් වන පුහුණු ශ්‍රේණියට අයත් නිලධාරීන් III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්ෂණය අසමත් වන්නන් හට නැවත පැවැත්වෙන පුහුණුව අවසන් පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවස්ථා 02 ක් ලබාදෙන අතර, ඉන් ද, අසමත් වන අයගේ පුහුණු පත්වීම අවසන් කරනු ලැබේ.

3. **වැටුප් කාණ්ඩය සහ පරිමාණය :**

කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 3 නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය අනුව කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි පුහුණු ශ්‍රේණියේ පුහුණු කාලයට අදාළ මාසික දීමනාව රු. 12,000/- ක් වේ.

සාගර විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන මාස හයක (06) පුහුණුව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබාගත් ආධුනිකයන් කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලැබේ. ඊට අදාළ වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන II (MT 1-2025) අනුව රු. 50,090 – 10 X 540 – 11 X 630 – 10 X 1,010 – 10 X 1,190 – රු. 84,420/- (ආරම්භක වැටුප් පියවර - 50,090/-) ක් වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

4. **අධ්‍යාපන සුදුසුකම් :**

I. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

හා

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා/ ගණිත/ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් (03) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වී තිබීම. පැරණි විෂය නිර්දේශය විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.

5. **වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.**

6. **පළපුරුද්ද : අදාළ නොවේ.**

7. **කායික සුදුසුකම් :**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක (ශ්‍රී ලංකා භූමියට අයත් දූපත් ද ඇතුළු) සේවය කිරීමටත් තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

8. **වෙනත් සුදුසුකම් :**

I. සෑම අයදුම්කරුවකුම ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ *ගැසට් පත්‍රයේ* සඳහන් වන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

9. **වයස් සීමාව :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වනවිට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව වයස සම්බන්ධව සුදුසුකම සපුරාලනුයේ උපන් දිනය 2008.12.11 දින හෝ ඊට පෙර හා 1991.12.11 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.)

10. **බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරී පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. පුහුණුව සාර්ථකව සම්පූර්ණ කිරීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාවක් නොලැබෙන අතර එම ආධුනිකයන්ගේ පුහුණුව අවසන් කරනු ලැබේ.

11. **ලිඛිත විභාගය:**

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පමණක් පැවැත්වෙන අතර ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. පහත සඳහන් විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් යුත් ලිඛිත විභාගයක් පැවැත්වේ. එක් එක් විෂයය සමත්වීමට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය පහත සඳහන් පරිදි වේ.

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
1. බුද්ධි පරීක්ෂණය	*පැය 01*	*100*	*40*
2. සාමාන්‍ය දැනුම	*පැය 01*	*100*	*40*

අපේක්ෂකයන් විසින් සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටිය යුතු වන අතර සියලුම ප්‍රශ්න පත්‍රවලට එක් භාෂාවකින් පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

12. විභාගය සඳහා විෂය නිර්දේශය :

ප්‍රශ්න පත්‍රය	*විෂය නිර්දේශ*
බුද්ධි පරීක්ෂණය	සංඛ්‍යානමය හැකියාව, ගැටලු නිරාකරණය, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය යන මාතෘකා යටතේ සකස් කරන ලද විෂයානුබද්ධ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. (කාලය පැය 01 යි.)
සාමාන්‍ය දැනුම	ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ මූල්‍ය, ආර්ථික, වාණිජ, දේශපාලන, ජාත්‍යන්තර සබඳතා, කළමනාකරණ, විද්‍යා හා තාක්ෂණ, අධ්‍යාපන, සෞඛ්‍ය, ක්‍රීඩා, පරිසර, සමාජ හා සංස්කෘතික යන ක්ෂේත්‍රයන්හී වැදගත් සිද්ධීන් ද අදාළව විශේෂයෙන් දේශීය හා විදේශීය ධීවර ක්ෂේත්‍රය පිළිබඳ මූලික දැනුම මැන බැලීම සඳහා සකස් කරනු ලබන බහුවරණ ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ. (කාලය පැය 01 යි.)

13. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ වේ.

14. විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 600/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

සටහන :-

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහාවන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතුවන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරුකිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

15. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

මාර්ගගත (Online) විභාග අයදුම්පත් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අයදුම්පත දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශවීමට භාවිත කරන

ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

16. විභාගයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීම :

(*අ*) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(*ආ*) අපේක්ෂකයකු තමාට නියමකර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු අතර, සෑම අපේක්ෂකයකුම නියමිත විභාග ශාලාවට අදාළ අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය පළමුවෙන් එම ශාලාවේ දී පෙනී සිටින දින එහි ශාලාධිපතිට භාර දිය යුතුය. සෑම අපේක්ෂකයකුම විභාගය සම්බන්ධයෙන් අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළ කර ඇත.

(*ඇ*) අපේක්ෂකයකුට ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

(*ඈ*) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරන ලද නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

17. අපේක්ෂකයාගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

18. පත් කිරීම සඳහා තෝරා ගැනීම :

ලිඛිත පරීක්ෂණයේ ඉහළ ලකුණු ලබන අයදුම්කරුවන් අතරින් බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු ගණනට සමාන සංඛ්‍යාවක් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. පුහුණුව සාර්ථකව නිම කර සහතික පත්‍ර ලබා ඇති අයදුම්කරුවන් කනිෂ්ඨ ගුවන් විදුලි නිලධාරි III තනතුර සඳහා තෝරා පත් කරනු ලැබේ. ඉල්ලූ අවස්ථාවකදී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත සලකා බලනු නොලැබේ.

19. ප්‍රතිඵල නිකුත් කිරීම :

අදාළ ප්‍රතිඵල ලේඛනය "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව" වෙත භාරදීමට අමතරව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams.

gov.lk වෙබ් අඩවිය මගින් නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත. "විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ."

20. සාවද්‍ය තොරතුරු සැපයීම :

අපේක්ෂකයකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත්කර ඇති කිසියම් කරුණක්, ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත්කර ඇති බව හෙළි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට යටත් වේ.

21. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.

22. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පළකරනු ලබන මෙම නිවේදනයෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැළපීමක් හෝ අනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යයෙන් පළකරන ලද දැන්වීම බලාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,

2026 නොවැම්බර් මස වැනි දින,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10.

11 - 152

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) II ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් වන සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) II ශ්‍රේණියෙහි තනතුරු පුරප්පාඩු 1ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් :-

1.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි ප්‍රදානය කරන ආයතනයක් වශයෙන් පිළිගෙන ඇති ආයතනයකින් ඉංජිනේරු විද්‍යාව (යාන්ත්‍රික/ ගොඩනැගිලි සේවා) විෂය ක්ෂේත්‍රවලට අදාළව පන්ති සාමාර්ථයක් සහිතව උපාධියක් ලබා තිබීම.

1.2. වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

1.3. පළපුරුද්ද : අදාළ නොවේ.

1.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

1.5. වෙනත් සුදුසුකම් : (i) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(ii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

2. වයස :- අවම සීමාව 23
උපරිම සීමාව 40

3. වැටුප් පරිමාණය :- රු. 131,300 - 10 x 2,940 - 10 x 3,595 - රු. 196,650

ඒ අනුව මෙම තනතුරට නිමි වැටුප් ක්‍රේතය AC-E1-2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.131,300/- වේ. මීට අමතරව පාර්ලිමේන්තුව විසින් 2026.03.17 තනතුරට අදාළ වන පරිදි අනුමත කර ඇති අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ. (2027.01.01 දිනට පෙර බඳවා ගත හොත් වැටුප් ගෙවනු ලබන්නේ වැටුප් පරිමාණයට අදාළ උපලේඛන II අනුව වේ. එනම් ගෙවන වැටුප රු. 115,095.00 පමණ වේ).

4. බඳවා ගැනීමේ ක්‍රමය - 100% විවෘත පදනමින් බඳවා ගැනේ.

4.1 ලිඛිත විභාගයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.

4.1.1. ලිඛිත විභාගය

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර 2 කින් සමන්විත වේ. විභාගය පවත්වනු ලබන්නේ කොළඹ දී ය.

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සාමාන්‍ය දැනීම හා අභියෝගතාව	100	40
විෂයානුබද්ධ දැනුම	100	40

විභාගය පිළිබඳ සම්පූර්ණ විස්තරය උපලේඛන 1 හි ඇතුලත් වේ.

4.1.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ	*උපරිම ලකුණු ප්‍රමාණය*	*තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය*
1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්	20	60
2. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය	10	
3. පරිගණක සාක්ෂරතාවය	10	
4. විෂයානුබද්ධ දැනුම	30	
5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය	30	
මුළු ලකුණු	100	

සටහන :

(i.) ලිඛිත පරීක්ෂණයේ සියලුම ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සුදුසුකම් ලැබුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එක් එක් ප්‍රශ්න පත්‍රයට 40%ක් වූ අවම ලකුණු ප්‍රමාණය ලබා ගන්නා වූ අයදුම්කරුවන් අතුරින් ව්‍යුහගත

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ පුරප්පාඩු අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් තුන්ගුණයක් හෝ අවස්ථානුකූලව කොමිෂන් සභාව තීරණය කරනු ලබන සංඛ්‍යාවක් පමණි. අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සංඛ්‍යාව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබාදෙනු නොලැබේ.

(ii.) බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

(iii.) ලිඛිත පරීක්ෂණය හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලබාගත් ලකුණුවල එකතුවෙහි ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරුවන් පුරප්පාඩු ගණන අනුව තෝරා ගනු ලැබේ.

5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :-

i. මෙම පත්වීම අංක 2504/07 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනය මගින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට යටත් වේ.

ii. මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ප්‍රතිලාභ හිමිය.

iii. මෙම පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක වීම හා සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධන මට්ටම සළකා බලා සේවය ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

v. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

vi. කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලබන කාර්ය සාධන ඇගයීම් දර්ශක අනුව වාර්ෂිකව ඔබගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව ඉදිරි වැටුප් වර්ධක ලබා දීම සිදුකරන අතර උසස් වීම සඳහාද එම කාර්ය සාධනය උපයෝගී කරනු ලැබේ.

vii. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, අංක 2504/07 හා 2026.09.01 දිනැති ගැසට් නිවේදනයෙහි ඇතුළත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා රීති, ආයතන සංග්‍රහය II, මුදල් රෙගුලාසි හා වරින්වර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීතිවලට සහ චක්‍රලේඛවලට මෙම පත්වීම යටත්ය.

viii. විභාගය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයා කැමති එක් භාෂා මාධ්‍යකින් පමණක් විභාගයට පෙනී සිටින යුතු ය.

ix. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය වේ.

6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-

i. ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

ii. ලිඛිත/ව්‍යුහගත පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

a). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
b). වලංගු විදේශ ගමන් බලපත්‍රය
c). වලංගු රියදුරු බලපත්‍රය

7. විභාග ගාස්තු :- විභාග ගාස්තුව රු. 1500.00 කි. එම ගාස්තුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් නමට ලංකා බැංකුවේ, ටොරින්ටං ශාඛාවේ ගිණුම් අංක 7040057ට බැර වන සේ ගෙවිය යුතු ය. ගෙවනු ලබන විභාග ගාස්තු කවර හේතුවක් නිසාවත් ආපසු ගෙවනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා රිසිට් පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ලඟ තබා ගත යුතු වේ.

8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය,

(i.) අයදුම්පත්, අධ්‍යක්ෂජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, තැ.පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනය සඳහන් කර 2026.12.14 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.

iii. අයදුම්පත් බහා එවන ලිපි කවරය ඉහළ වම් කෙළවරේ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) II ශ්‍රේණියට බඳවා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියෙකු හෝ රජයේ ආයතනයක විධායක නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

v. අයදුම්පත් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

vi. අයදුම්පත්‍රය සමග පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය.

a). ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත;

b). උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත;

c). ඉහත අයදුම්පත්‍රයේ සඳහන් සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්;

d). විභාග ගාස්තු ගෙවන ලද බව සනාථ කෙරෙන ලේඛනය.

සටහන : සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේදී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

9. සාවද්‍ය තොරතුරු සැපයීම.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම/ නොපිරවීම පිළිබඳ අවසාන තීරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ.

11. බඳවා ගැනීම් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

12. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්. එස්. ඒ. දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්

2026 නොවැම්බර් මස 13 වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ. 1431,
36, මලලසේකර මාවත,
කොළඹ 07.

වැඩිදුර විස්තර සඳහා අමතන්න -
දුරකථන අංකය - 011 - 2582864
විද්‍යුත් තැපෑල : da@ciaboc.gov.lk

උපලේඛනය 01

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය

1. විභාගයෙහි නම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

විෂයයන්	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
සාමාන්‍ය දැනීම හා අභියෝගතාව	පැය 02	100	40
විෂයානුබද්ධ දැනුම	පැය 02	100	40

3. පවත්වනු ලබන බලධාරියා: ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය:

ප්‍රශ්න පත්‍රයේ නම		*විෂය නිර්දේශය*
සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය	පාලන හා නඩත්තු	ශ්‍රී ලංකාවේ දේශපාලනමය, සාමාජයීය සංස්කෘතික හා ආර්ථික පරිසරය සහ අධ්‍යාපන ක්‍රමය ඇතුළුව අපේක්ෂකයා ජීවත්වන සහ වැඩ කරන පරිසරය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්වන කාලීන සිදුවීම් මෙන්ම විද්‍යාත්මක හා තාක්ෂණික සංවර්ධනය පිළිබඳ ඔහුගේ ඇති දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රයකි. බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයාගේ තර්කන ශක්තිය මැනීම පිණිස සකසන ලද ප්‍රශ්න පත්‍රයකි.
විෂයානුබද්ධ දැනුම	නඩත්තු	ගොඩනැගිලි නඩත්තුව, විදුලි පද්ධති, ජල නල හා සනීපාරක්ෂක පද්ධති නඩත්තුව පිළිබඳ මූලික දැනුම, ගොඩනැගිලි අලුත්වැඩියාවන් හා යන්ත්‍ර සූත්‍ර නඩත්තු සැලසුම් සකස් කිරීම, සේවා ස්ථානයේ වෘත්තීය ආරක්ෂාව, ගිනි නිවීමේ පද්ධති සහ පරිසර රෙගුලාසි පිළිබඳ දැනුම.

5. විභාගය පවත්වනු ලබන මාධ්‍ය

- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි
- අපේක්ෂකයින් කැමති එක් භාෂාවකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. එම භාෂා මාධ්‍යය බඳවා ගැනීමේ භාෂා මාධ්‍යය වේ. (අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍ය වෙනස් කිරීමට අවසර නැත.)

6. වෙනත් :

- සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
විවෘත පදනම මත සහකාර අධ්‍යක්ෂ (නඩත්තු) II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ අයදුම්පත

මාධ්‍ය

සිංහල	
දෙමළ	
ඉංග්‍රීසි	

(අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතුය)

1.0	1.1	සම්පූර්ණ නම	
	1.2	සම්පූර්ණ නම (සිංහල/ දෙමළ)	
	1.3	මුලකුරු සමග නම	
2.0	2.1	ස්ථිර ලිපිනය	
	2.2	දිස්ත්‍රික්කය	
	2.3	පළාත	
3.0	3.1	ස්ත්‍රී/ පුරුෂ භාවය	
	3.2	ජාතික හැඳුනුම්පත් අංකය	

4.0	4.1	ජංගම දුරකථන අංකය/whatsapp අංකය	
	4.2	ස්ථාවර දුරකථන අංකය	
	4.3	විද්‍යුත් තැපෑල	
5.0	5.1	උපන් දිනය	
	5.2	අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස	අවු: මාස: දින:
6.0	6.1	විවාහක/ අවිවාහක බව	
7.0	8.1	ජාතිය	
8.0	9.1	ආගම	

9.0 අධ්‍යාපන සුදුසුකම්: භාෂා මාධ්‍ය: .....

උපාධිය	
විශ්වවිද්‍යාලය/ ආයතනය	
වර්ෂය	
පන්ති සාමාර්ථය	

12.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම්:

විභාගය/ පාඨමාලාව	*ආයතනය*	*ප්‍රතිඵල*

13.0 ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය:

සුදුසුකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ලේඛන
1.
2.
3.

14.0 පරිගණක සාක්ෂරතාවය:

සුදුසුකම	*ආයතනය*	*කාලය*

15.0 වෙනත් සුදුසුකම්:

.....

.....

16.0 විභාග ගාස්තු ගෙවූ රිසිට් පත පිළිබඳ විස්තර :-

විභාග ගාස්තු ගෙවන ලද ආයතනය .....

දිනය .....

ගෙවන ලද මුදල .....

(මුදල් ගෙවූ රිසිට් පතෙහි මුල් පිටපත නොගැලවෙන සේ මෙහි අලවන්න)

17.0 අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසු හෝ හෙළි වුවහොත් මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය අල්ලස් හෝ දූෂණ වෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගිය හොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය / හෝ පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.

.....
අයදුම්කරුගේ/ අයදුම්කාරියගේ අත්සන.

දිනය .....

18.0 අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන මහතා ..../ මහත්මිය/ මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව මෙයින් සහතික කරමි.

.....
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

අත්සන සහතික කරන නිලධාරියාගේ

සම්පූර්ණ නම :- .....

තනතුර :- .....

ලිපිනය :- .....

දිනය :- .....

විභාග නිවේදනය

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සහ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ පොදු තරග විභාගය - 2026

පහත සඳහන් දීප ව්‍යාප්ත සේවාවන්හි III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
- ශ්‍රී ලංකා පරිපාලන සේවය
- ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය
- ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
- ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය
- ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය
- ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

අදාළ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Application for the Common Recruitment Examination" ඔස්සේ පළකර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් භාර ගැනීම 2026 නොවැම්බර් මස 16 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 11 වැනි දින ප.ව. 09.00ට අවසන් වේ.

දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

සෙසු අයදුම්කරුවන් විසින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී අවශ්‍ය වුවහොත් ඉදිරිපත් කිරීමට තම අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ළඟ තබාගත යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳදරාගත යුතු ය.

1. මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2027 පෙබරවාරි මස සියලු පළාත්වල ප්‍රධාන නගරයේ දී පවත්වනු ඇත. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

- මෙම නිවේදනයේ "පත්කිරීම් බලධරයා" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය හා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය යන සේවාවන් සඳහා වන කල්හි "රාජ්‍ය සේවා කොමිෂන් සභාව" ද, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා වන කල්හි "රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව" ද වේ.

2. **බඳවා ගැනීමේ ක්‍රමය :**

2.1 **මනාපය සටහන් කිරීම :-**

එක් එක් සේවාව සඳහා බඳවා ගැනීමට සපුරා තිබිය යුතු සුදුසුකම් අනුව අයදුම්කරුවකුට සේවා කිහිපයකට හෝ සියල්ලටම අයදුම් කිරීමට හැකියාව ලැබෙන බැවින් අයදුම් කිරීමේ දී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාපය අනුව පමණක් අයදුම්කරුට අදාළ වන එක් එක් සේවාව සඳහා වන ප්‍රශ්න පත්‍ර සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබාදෙනු ලැබේ.

සැලකිය යුතුයි :- අයදුම් කිරීමේ දී අයදුම්කරු විසින් අයදුම්පතේ සටහන් කරනු ලබන මනාපය පසුව සංශෝධනය කිරීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරු විසින් මනාපය සටහන් කර නොමැති සේවාවක් සඳහා පත්වීම් ලබාගැනීමට කරනු ලබන ඉල්ලීම් කිසිදු කරුණක් මත සලකා බලනු නොලැබේ.

2.2 ලිඛිත විභාගය:-

- මෙම තරග විභාගය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් සමන්විතය. එහි පළමු කොටස (පොදු කොටස) සියලුම සේවාවන්

සඳහා අදාළ වේ. පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ ප්‍රශ්න පත්‍ර දෙකෙහිම මුළු ලකුණු ප්‍රමාණයේ එකතුව 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තමන් අයදුම්කරන ලද එක් එක් සේවාවන්ට අදාළ දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස) සඳහා කැඳවනු ලැබේ.

- **ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සහ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා මින් පළමු කොටස (පොදු කොටස) පමණක් අදාළ වන අතර ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සඳහා පළමු කොටසේ බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය පමණක් අදාළ වේ.**

2.2.1 පළමු කොටස (පොදු කොටස)

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත්වීමට ලැබියයුතු අවම ලකුණු ප්‍රමාණය*
1. බුද්ධි පරීක්ෂණය	පැය 1 1/2	100	40
2. අවබෝධය	පැය 02	100	40

2.2.2 දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස)

සේවය	*විෂයය අංකය*	*ප්‍රශ්න පත්‍රය*	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය*
1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය	11	සාමාන්‍ය දැනීම	පැය 01	100	40
	12	විශ්ලේෂණාත්මක අධ්‍යයනය	පැය 1 1/2	100	40
2. ශ්‍රී ලංකා පරිපාලන සේවය	21	සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා	පැය 03	100	40
	22	කළමනාකරණ අභියෝග්‍යතාව	පැය 03	100	40
	23	නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා	පැය 03	100	40
3. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය	31	විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි පර්යේෂණ ධාරාව)	පැය 02	100	40
	32	විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි සංවර්ධන ධාරාව)	පැය 02	100	40
	33	විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි ආර්ථික විද්‍යා ධාරාව)	පැය 02	100	40
4. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	41	සාමාන්‍ය සම්ප්‍රජානනය	පැය 03	100	40
7. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	51	මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය	පැය 03	100	40
	52	උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය	පැය 03	100	40

2.3 **සම්මුඛ පරීක්ෂණය** :- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන් අතරින් සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක්, ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙළ අනුව එක් එක් සේවාවන්ට අදාළ වන පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට හා/හෝ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම සම්මුඛ පරීක්ෂණ පැවැත්වෙන දිනය පත්කිරීම් බලධරයාගේ නියමය පරිදි තීරණය කරනු ඇත.

2.4 **පත් කිරීම**:-

i. එක් එක් සේවාවන්ට අදාළ වන පරිදි ලිඛිත විභාගයේ ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හෝ ලිඛිත විභාගයේ ලකුණුවල හා ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී/ වාචික පරීක්ෂණයේ දී ලබා ඇති ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ මත හෝ එක් එක් සේවාව සඳහා පත් කිරීම් කරනු ලැබේ. මෙහිදී අයදුම්පතේ සටහන් කර ඇති මනාපය පදනම් කරගනු ලැබේ.

ii. පොදු තරග විභාගයේ පළමු කොටස (පොදු කොටස) පමණක් අදාළ වන ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය හා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා පත් කිරීම, **<u>පළමු කොටසට (පොදු කොටසට) අදාළ ලිඛිත විභාගයේ ලකුණු නිකුත් වූ පසු</u>**, එම ලකුණුවල කුසලතා අනුපිළිවෙළ මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවා, තනතුර සඳහා සුදුසුකම් නිබෙදැයි පරීක්ෂා කිරීමෙන් අනතුරුව සිදුකරනු ලබයි.

iii. එනමුත් එම නිලධාරීන් දෙවන කොටසට අදාළ ප්‍රතිඵල මත ඉහත 2.4 ii හි සඳහන් තනතුරට වඩා ඉහළ මනාපයක් සටහන් කර ඇති තනතුරකට පත් වීමට සුදුසුකම් ලබන්නේ නම් එම තනතුරට පත් කරනු ලැබේ.

3. **බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාව :-**

අනු. අංකය	*කේතය*	*සේවය*		*පුරප්පාඩු සංඛ්‍යාව*
1	SLEAS	ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය*		168
2	SLAS	ශ්‍රී ලංකා පරිපාලන සේවය		153
3	SLAgS	ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය	කෘෂි පර්යේෂණ ධාරාව	66
			කෘෂි සංවර්ධන ධාරාව	61
			කෘෂි ආර්ථික විද්‍යා ධාරාව	08
4	SLPS	ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය		74
5	SLAcS	ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය		105
6	SLEngS	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය**		201
7	SLArcS	ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය		10
8	SLSS	ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය***		128

* ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියේ තනතුරු ‘‘සාමාන්‍ය සේවක සංඛ්‍යාව’’ හා ‘‘විශේෂ සේවක සංඛ්‍යාව’’ වශයෙන් කොටස් 2කින් යුක්ත වේ. මෙම විභාගයේදී බඳවා ගනු ලබන්නේ සාමාන්‍ය සේවක සංඛ්‍යාවට අයත් තනතුරු සඳහා පමණි.

** ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු පහත දක්වා ඇති කාණ්ඩ යටතේ බෙදී යනු ඇත.

කාණ්ඩය	*පුරප්පාඩු සංඛ්‍යාව*
සිවිල්	149
යාන්ත්‍රික	25
විදුලි	14
භූ සම්පත්	13
එකතුව	201

*** ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව තවදුරටත් බෙදී ඇති ආකාරය මෙම නිවේදනයේ විද්‍යාත්මක සේවයට බඳවා ගැනීමේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් යටතේ දක්වා ඇත.

3.1 එක් එක් සේවාව සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව සහ පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. අදාළ සේවාවන් සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු සංඛ්‍යාව සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ හා මනාපයේ අනුපිළිවෙළ තරයේම අනුගමනය කරමින් පත්කිරීම් සිදුකරනු ලැබේ. කිසියම් සේවාවක පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ නොපිරවීමට හෝ පුරප්පාඩුවලින් යම් කොටසක් පිරවීමට හෝ නොපිරවීමට හෝ පත්කිරීම් බලධරයාට බලය ඇත.

3.2 අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා හෝ සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය අංක 2310/29 සහ 2022.12.14 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 92වන වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

3.2.1 **ලිඛිත විභාගයේ සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පමණක් බඳවා ගැනෙන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සහ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා <u>පමණක්</u> රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024හි සඳහන් පහත විධිවිධාන අදාළ වේ.**

කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම්ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරාගැනීමක් සිදු කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. මෙම තෝරා ගැනීමේ පටිපාටිය පහත පරිදි කොටස් දෙකකින් යුක්තය.

i. අපේක්ෂකයන්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
ii. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

ලිඛිත පරීක්ෂණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින් පැවැත්වෙනු ඇත. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

4. **බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-**

4.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු නියමයන් හා කොන්දේසිවලට ද එක් එක් සේවාවන්ට අදාළ පහත සඳහන් සේවා ව්‍යවස්ථාවල විධිවිධානවලට ද අදාළ වන පරිදි දෙපාර්තමේන්තු නියෝගවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසිවලට ද අංක 2310/29 සහ 2022.12.14 වන දින දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට (මින් මතුවට කාර්ය පටිපාටික රීති ලෙස හඳුන්වනු ලබන) හා ඉහත පොදු නියමයන් හා කොන්දේසි, නියෝග, විධිවිධාන, රෙගුලාසි හා රීතිවලට දැනටමත් කර ඇති හෝ මින්මතු කරනු ලැබිය හැකි සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් අදාළ සේවයේ III ශ්‍රේණියට පත්කරනු ලැබේ.

සේවය	*සේවා ව්‍යවස්ථාව පළකර ඇති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය හා දිනය*	
	අංකය	*දිනය*
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය	1928/28	2015.08.21
ශ්‍රී ලංකා පරිපාලන සේවය	1842/2	2013.12.23
ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය	1880/26	2014.09.19

සේවය	*සේවා ව්‍යවස්ථාව පළකර ඇති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය හා දිනය*	
	අංකය	*දිනය*
ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	1670/32	2010.09.10
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	1670/33	2010.09.10
ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	1836/6	2013.11.11
ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	1877/28	2014.08.28
ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය	1877/27	2014.08.28

4.2 මෙම තනතුරු ස්ථීරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.3 මෙම පත්වීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්ය. අදාළ සේවයේ III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

4.4 අයදුම්කරු විභාගයට පෙනී සිටිනු ලබන භාෂා මාධ්‍යය පත්වීමට අදාළ භාෂා මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

4.5 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර තුනක් (03ක්) ඉකුත් වීමට පෙර අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු වේ. රාජ්‍ය භාෂාවකින් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ දී එක් රාජ්‍ය භාෂාවක් පිළිබඳව ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

4.6 පත්වීම්ලාභියකු දිවයින තුළ නියම කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

4.7 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා/ හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මහහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කිරීමට පත්කිරීම් බලධරයාට බලය ඇත.

5. **වැටුප් ව්‍යූහය හා මාසික වැටුප් පරිමාණය :-**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි විධිවිධාන අනුව එක් එක් තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.82,150-10x2,400-8x2,940-17x3,900 -195,970/-(SL-1-2025) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමි වේ.

එසේ වුව ද ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අදාළව බඳවා ගනු ලබන අවස්ථාවේදී පූර්ණ වෘත්තීය සුදුසුකම් (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා නිබෙන හෝ බඳවා ගැනීමෙන් පසු ඉංජිනේරුවරයකු පූර්ණ වෘත්තීය සුදුසුකම් ලබා ගත් විට, එම නිලධාරියා සේවයේ III ශ්‍රේණියේ හයවන (06) වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

6. **බඳවා ගැනීමේ සුදුසුකම් :-**

6.1 පොදු සුදුසුකම්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම.
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

6.2 අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ වයස් සීමාව :-

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය සඳහා අවශ්‍ය අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සහ වයස් සීමාවන් පහත දැක්වේ.

ii. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අධ්‍යාපන සුදුසුකම්/අතිරේක අධ්‍යාපන සුදුසුකම් යටතේ සඳහන් වන උපාධි සුදුසුකම හා පශ්චාත් උපාධි සුදුසුකම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් පහත සඳහන් විධිවිධාන අදාළ වේ.

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්;

හෝ

2. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන උපාධියක්

හෝ

3. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් උපාධියක්

සේවය	*වයස් සීමාව*	*අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*	
		අධ්‍යාපන	*වෘත්තීය*
1. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතු ය.	ඉහත 6.2 ii යටතේ පිළිගත් උපාධියක් ලබා තිබීම	අදාළ නැත
2. ශ්‍රී ලංකා පරිපාලන සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතු ය.	ඉහත 6.2 ii යටතේ පිළිගත් උපාධියක් ලබා තිබීම	අදාළ නැත
3. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතු ය.	**කෘෂි සංවර්ධන ධාරාව සහ කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා :-** ඉහත 6.2 ii යටතේ පිළිගත් කෘෂිකර්මය පිළිබඳ සිවි අවුරුදු උපාධියක් ලබා තිබීම. **කෘෂි පර්යේෂණ ධාරාව සඳහා:-** ඉහත 6.2 ii යටතේ පිළිගත් කෘෂිකර්මය පිළිබඳ සිවි අවුරුදු උපාධියක් ලබා තිබීම; *හෝ* ඉහත 6.2 ii යටතේ පිළිගත් උද්භිද විද්‍යාව, රසායන විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව පිළිබඳ සිවි අවුරුදු විද්‍යාවේදී විශේෂ උපාධියක් ලබා තිබීම.	අදාළ නැත
4. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසිදෙක (22)ට නොඅඩු විය යුතු අතර, අවුරුදු තිස් පහ (35)ට නොවැඩි විය යුතු ය.	(i) ඉහත 6.2 ii යටතේ පිළිගත් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ සාමර්ථ්‍යයක් සහිත උපාධියක් ලබා තිබීම; *හෝ*	අදාළ නැත

සේවය	*වයස් සීමාව*	*අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*	
		අධ්‍යාපන	*වෘත්තීය*
		(ii) ඉහත 6.2 ii යටතේ පිළිගත් උපාධියක්; *සහ* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාපනය වූ පුහුණු ආයතනයකින් ප්‍රදානය කෙරෙන යටත් පිරිසෙයින් වසරකට නොඅඩු පාඨමාලා කාලසීමාවක් සහිත පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.	
5. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත්කරන දිනට වයස අවුරුදු විසිදෙක (22) ට නොඅඩුවිය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතුය.	(i) ඉහත 6.2 ii යටතේ පිළිගත් වාණිජ්‍යය/ කළමනාකරණ/ ගණකාධිකරණ/ ආර්ථික විද්‍යා යන විෂයය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම; *හෝ* (ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ/ ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියකු වීම; *හෝ* (iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක 1991 හා 1992-1997 විෂය මාලා යටතේ ආවසරික II හෝ 1998-2004 හා 2005-2009 විෂය මාලා යටතේ අන්තර්මාධ්‍ය පරීක්ෂණය හෝ 2010-2014 විෂය මාලාව යටතේ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ 2015-2019 විෂය මාලාව යටතේ ව්‍යාපාර අදියර විභාගය හෝ 2020-2024 හා 2025-2030 විෂය මාලා යටතේ ආයතනික අදියර විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටීම; *හෝ*	අදාළ නැත

සේවය	*වයස් සීමාව*	*අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*	
		අධ්‍යාපන	*වෘත්තීය*
		(iv) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරිත්ව ආයතනයක් මගින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I වැනි හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටීම ; *හෝ* (v) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටීම; *හෝ* (vi) එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරිවරුන්ගේ වරලත් සංගමයේ I වැනි සහ II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටීම; *හෝ* (vii) එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයන්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී සිටීම; *හෝ* (viii) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටීම.	

සේවය	*වයස් සීමාව*	*අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්*	
		අධ්‍යාපන	*වෘත්තීය*
6. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිඑක (21) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබෙන්නාවූත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථීර කර ඇති නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව අවුරුදු 45 වේ.	(i) ඉහත 6.2 ii යටතේ පිළිගත් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබ ඇති වසර හතරක (04) පූර්ණ කාලීන විද්‍යාවේදී ඉංජිනේරු උපාධි පාඨමාලාවට බඳවා ගනු ලබන විෂය ධාරාවක් යටතේ සාර්ථකව සම්පූර්ණ කර උපාධිය ලබා තිබීම; *හෝ* (ii) ඉහත (i) හි දැක්වෙන උපාධි පාඨමාලාවට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගනු ලැබූ අධ්‍යයන සහ අනෙකුත් සියලු අවශ්‍යතා බඳවාගනු ලබන විෂය ධාරාවක් යටතේ සම්පූර්ණ කර, ඊට අදාළ වලංගු සහතිකය ලබා තිබීම	2017 අංක 04 දරන පනත මගින් ස්ථාපිත ශ්‍රී ලංකා ඉංජිනේරුවරුන්ගේ සභාවේ, අදාළ සේවා කාණ්ඩය යටතේ ආශ්‍රිත ඉංජිනේරුවරයකු හෝ වරලත් ඉංජිනේරුවරයකු ලෙස ලියාපදිංචි වී තිබීම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය හෝ පූර්ණ සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු තත්ත්වය) ලබා තිබීම
7. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය	අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිඑක (21) ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35)ට නොවැඩි විය යුතුය.	ඉහත 6.2 ii යටතේ පිළිගත් පස් අවුරුදු වාස්තු විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; *හෝ* ඉහත 6.2 ii යටතේ පිළිගත් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම ; *හෝ* ඉහත 6.2 ii යටතේ පිළිගත් තුන් අවුරුදු විද්‍යාවේදී නිර්මිත පරිසරය පිළිබඳ උපාධිය සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසර 05ක පළපුරුද්දක් ලබා තිබීම	අදාළ නැත

iii. **ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා අවශ්‍ය අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්, වයස් සීමාවන් සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත දැක්වේ.**

වයස් සීමාව:- අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට වයස අවුරුදු විසිදෙක (22)ට නොඅඩු විය යුතු අතර අවුරුදු තිස්පහ (35) ට නොවැඩි විය යුතු ය.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
01	කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	කාලගුණ විද්‍යාඥ	08	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) භෞතික විද්‍යාව හෝ ගණිතය පිළිබඳ පන්ති සාමාර්ථ්‍යයක් සහිතව වසර හතරක (04) විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) දෙවන පෙළ ඉහළ හෝ ඊට ඉහළ පන්ති සාමාර්ථ්‍යයක් සහිතව භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) භෞතික විද්‍යාව හෝ ගණිතය විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් සමඟ භෞතික විද්‍යාව හෝ ගණිතය හෝ පරිගණක විද්‍යාව හෝ දත්ත විද්‍යාව සහ කෘතිම බුද්ධිය හෝ දේශගුණික විපර්යාස හා පරිසර කළමනාකරණය හෝ සංඛ්‍යානය හෝ දුරස්ථ සංවේදනය (Remote Sensing) යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
02	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	සහකාර වන සංරක්ෂක (වන කළමනාකරණ)	13	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක පෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් සමඟ, වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක පෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
				හෝ (ඇ) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් සහිතව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමග, වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
03	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	සහකාර වන සංරක්ෂක (පර්යේෂණ)	02	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් සමඟ, වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් සහිතව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ,

අනු. අංකය	අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	තනතුර	පුරප්පාඩු සංඛ්‍යාව	අධ්‍යාපන සුදුසුකම්
				වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
04	වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව	සහකාර වන සංරක්ෂක (අධ්‍යාපන)	02	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (අ) පන්ති සාමාර්ථ්‍යයක් සහිතව වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (ආ) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් සමඟ, වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; හෝ (ඇ) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් සහිතව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, වන විද්‍යාව හෝ වන වගා කළමනාකරණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ පරිසර විද්‍යාව හෝ පාරිසරික විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*නනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
05	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	භෞතික විද්‍යාඥ	10	ඉහත 6.2 ii යටතේ පිළිගත්, පන්ති සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව හෝ ඉංජිනේරු භෞතික විද්‍යාව හෝ පරිගණකමය භෞතික විද්‍යාව හෝ ගණිතමය භෞතික විද්‍යාව හෝ ව්‍යවහාරික භෞතික විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම.
06	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	රසඥ	11	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (අ) රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (ආ) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, ආහාර විද්‍යාව හා තාක්ෂණය හෝ ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරණය හෝ ආහාර විද්‍යාව හා නිෂ්පාදනය හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
07	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	පර්යේෂණ නිලධාරි (එන්නත් හා නිෂ්පාදන)	02	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (අ) ප්‍රතිශක්ති විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (ආ) පන්ති සාමාර්ථයක් සහිතව ප්‍රතිශක්ති විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, ප්‍රතිශක්ති විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ අණුක ජීව විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
08	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	පර්යේෂණ නිලධාරී (ජීව රසායන විද්‍යා)	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පන්ති සාමාර්ථයක් සහිතව ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
09	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	ජීව රසඥ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පන්ති සාමාර්ථයක් සහිතව ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, ජීව රසායන විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
10	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	විද්‍යාත්මක නිලධාරී	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, රසායන විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව අතරින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
11	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	කීට විද්‍යාඥ	02	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) කීට විද්‍යාව විෂයය ඒකකයක් (Course Unit) සහිතව සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පන්ති සාමාර්ථයක් සහිතව සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, කීට විද්‍යාව හෝ වෛද්‍ය කීට විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
12	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	අණුක ජීව විද්‍යාඥ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) අණුක ජීව විද්‍යාව හෝ ජීව රසායන විද්‍යාව හෝ ජෛව තාක්ෂණය හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පන්ති සාමාර්ථයක් සහිතව අණුක ජීව විද්‍යාව හෝ රසායන විද්‍යාව හෝ ජෛව තාක්ෂණය හෝ ජීව රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, අණුක ජීව විද්‍යාව හෝ ජෛව තාක්ෂණය හෝ ජීව රසායන විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජෛව තොරතුරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
13	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක	39	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ*

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
				(*ආ*) රසායන විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුලත්ව විද්‍යාවේදී උපාධිය සමග, විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය හෝ චෝහාරික විද්‍යාව හෝ මස්තු විද්‍යාව හෝ ධූළක විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ කාර්මික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
14	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂක	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් සමග, රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව පිළිබඳ SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
15	ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂක (ඩිජිටල් අපරාධ)	05	අ.පොස. (උසස් පෙළ) විද්‍යා/ ගණිත/ තාක්ෂණ විෂය ධාරාවෙන් සමත්ව තිබීම සහ ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිත පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ දත්ත විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ දත්ත විද්‍යාව හෝ විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් සමග, පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය හෝ දත්ත විද්‍යාව පිළිබඳ SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
16	කම්කරු දෙපාර්තමේන්තුව	පර්යේෂණ නිලධාරි	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ගෞරව උපාධියක් සමඟ කාර්මික රසායන විද්‍යාව හෝ බහු අවයවික විද්‍යාව හා කාර්මික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව හෝ වෘත්තීය ස්වස්ථතාව හෝ විෂ විද්‍යාව හෝ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව හෝ බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 9 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත්ව විද්‍යාවේදී උපාධියක් සමඟ කාර්මික රසායන විද්‍යාව හෝ බහු අවයවික විද්‍යාව හා කාර්මික රසායන විද්‍යාව හෝ කාර්මික හා පාරිසරික රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව හෝ වෘත්තීය ස්වස්ථතාව හෝ විෂ විද්‍යාව හෝ වෘත්තීය සෞඛ්‍ය හා ආරක්ෂාව හෝ බහු අවයවික විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
17	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	සහකාර අධ්‍යක්ෂ (සංවර්ධන)	03	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයක් සහිතව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් සමඟ

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
				උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රයන්ට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයක් සහිතව විද්‍යාවේදී උපාධියක් සමග, උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
18	අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ)	09	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; හෝ (*ආ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයක් සහිතව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් සමග, උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රයන්ට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ විෂයයක් සහිතව විද්‍යාවේදී උපාධියක් සමග, උද්භිද/ ශාක විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ අපනයන කෘෂිකර්මය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
19	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	සහකාර අධ්‍යක්ෂ (කීට විද්‍යා)	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව යන ක්ෂේත්‍රයන්ගෙන් එක් ක්ෂේත්‍රයකට අදාළව විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) සත්ත්ව විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත් පන්ති සාමාර්ථයක් සහිතව උපාධියක් සමඟ, කීට විද්‍යා පිළිබඳ SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
20	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව	සහකාර අධ්‍යක්ෂ	07	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) උද්භිද/ ශාක විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය සහ ජලජ විද්‍යාව හෝ ජලජීවී වගාව හෝ සාගර විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් ඇතුළත්ව පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ කාණ්ඩයේ පන්ති සාමාර්ථයක් සහිතව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) ඉහත (අ) හි ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් ඇතුළත්ව දෙවන පන්තියේ පහළ කාණ්ඩයේ පන්ති සාමාර්ථයක් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමඟ, උද්භිද/ ශාක විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
				හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය සහ ජලජ විද්‍යාව හෝ ජලජීවී වගාව හෝ සාගර විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 09 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (ඇ) ඉහත (අ) හි ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළ විෂයයක් ඇතුළත්ව වසර තුනක (03) විද්‍යාවේදී උපාධියක් සමග, උද්භිද/ ශාක විද්‍යාව හෝ සත්ත්ව විද්‍යාව හෝ ශාක ජෛව තාක්ෂණය හෝ ජීව විද්‍යාව හෝ ව්‍යවහාරික ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ ස්වභාවික සම්පත් කළමනාකරණය හෝ වන විද්‍යාව හෝ පරිසර සංරක්ෂණය හා කළමනාකරණය හෝ වන විද්‍යාව හා පාරිසරික කළමනාකරණය හෝ අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය හෝ සත්ත්ව පාලනය සහ ජලජ විද්‍යාව හෝ ජලජීවී වගාව හෝ සාගර විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
21	පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව	පේෂකර්ම තාක්ෂණ විද්‍යාඥ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (අ) පන්ති සාමාර්ථයක් සහිතව පේෂ කර්මාන්ත තාක්ෂණය පිළිබඳ ඉංජිනේරු හෝ වසර හතරක (04) විද්‍යාවේ දී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (ආ) භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් සමඟ ක්ෂේත්‍රයේ විධායක මට්ටමක තනතුරක වසර තුනක පළපුරුද්ද ලබා තිබීම; *හෝ* (ඇ) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇති භෞතීය විද්‍යාව විෂය ක්ෂේත්‍රයේ විද්‍යාවේදී උපාධියක් සමඟ පේෂකර්ම තාක්ෂණය හෝ පේෂකර්ම නිර්මාණකරණය හෝ කර්මාන්ත කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
22	සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	රසායන විද්‍යාඥ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වසර හතරක (04) විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම.; *හෝ* (*ආ*) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී උපාධියක් සමඟ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාබනික රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
23	ආයුර්වේද දෙපාර්තමේන්තුව	විද්‍යාත්මක නිලධාරී (ශාක අභිජනන)	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) ශාක ජෛව තාක්ෂණය හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම.; *හෝ* (*ආ*) උද්භිද/ ශාක විද්‍යාව හෝ වන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී උපාධියක් සමඟ, ශාක අභිජනන හෝ පටක රෝපණය හෝ ප්‍රවේනි විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
24	ආයුර්වේද දෙපාර්තමේන්තුව	විද්‍යාත්මක නිලධාරී (ඖෂධ නවීකරණ)	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) ඖෂධවේදය හෝ රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) උද්භිද/ ශාක විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී උපාධියක් සමඟ, රසායන විද්‍යාව හෝ ඖෂධවේදය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
25	වාරිමාර්ග දෙපාර්තමේන්තුව	සහකාර පස් රසඥ	02	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික රසායන විද්‍යාව හෝ රසායනික තාක්ෂණය හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විශේෂ/ගෞරව විද්‍යාවේදී උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී උපාධියක් සමඟ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කෘෂි ඉංජිනේරු විද්‍යාව හෝ පාංශු විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ භූ අවකාශ තාක්ෂණය (Geospatial Technology) යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.
26	සුරාබදු දෙපාර්තමේන්තුව	සහකාර අධ්‍යක්ෂ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (*අ*) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (*ආ*) රසායන විද්‍යාව පිළිබඳ වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් සමඟ, විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ආහාර විද්‍යාව හෝ අධිකරණ විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාබනික රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 9 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම; *හෝ* (*ඇ*) රසායන විද්‍යාව විෂයයක් වශයෙන් ඇතුළත් විද්‍යාවේදී උපාධියක් සමඟ විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ ආහාර විද්‍යාව හෝ අධිකරණ විද්‍යාව හෝ කාර්මික විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ කාබනික රසායන විද්‍යාව හෝ කාර්මික කාබනික රසායන විද්‍යාව හෝ ව්‍යවහාරික කාබනික රසායන විද්‍යාව හෝ ආහාර විද්‍යාව හා තාක්ෂණය පිළිබඳ SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

අනු. අංකය	*අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව*	*තනතුර*	*පුරප්පාඩු සංඛ්‍යාව*	*අධ්‍යාපන සුදුසුකම්*
27	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	සහකාර අධ්‍යක්ෂ	01	ඉහත 6.2 ii යටතේ පිළිගත්, (අ) පන්ති සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව හෝ පරිසර විද්‍යාව හෝ පරිසර කළමනාකරණය හෝ සත්ත්ව විද්‍යාව හෝ ආහාර විද්‍යාව හෝ උද්භිද/ ශාක විද්‍යාව හෝ ක්ෂුද්‍රජීව විද්‍යාව හෝ අණුක ජීව විද්‍යාව හෝ කෘෂි විද්‍යාව හා කළමනාකරණය හෝ නැනෝ තාක්ෂණය හෝ හරිත තාක්ෂණය හෝ න්‍යෂ්ටික විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව වසර හතරක (04) විද්‍යාවේදී විශේෂ/ගෞරව උපාධියක් ලබා තිබීම; *හෝ* (ආ) රසායන විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව විද්‍යාවේදී උපාධියක් සමඟ, ඉහත (අ) හි සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයකට අදාළව SLQF 10 හෝ ඊට ඉහළ මට්ටමේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

iv. මෙම නිවේදනයේ සඳහන් අධ්‍යාපන සුදුසුකම සපුරාලනුයේ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබාගත් සහතිකයක් මත නම් එම විශ්වවිද්‍යාලය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට කොමිෂන් සභාව වෙතින් ලබාගත් තහවුරු කිරීමේ සහතිකයක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතු වේ.

6.3 **සුදුසුකම් පිළිබඳ සීමාවන් :**

i. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ එදිනට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

ii. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය හා ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සඳහා කුමන හෝ ආගමික පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත. (ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සඳහා මෙම කොන්දේසිය අදාළ නොවේ.)

7. **විභාග කොන්දේසි :-**

7.1 විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගය සඳහා තමා විසින් අයදුම් කරනු ලබන සේවාවන්ට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

7.2

i. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේතුව විසින් භාරගන්නා ලද බව / භාර නොගන්නා

ලද බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් (E-mail) මගින් හෝ දැනුම් දෙනු ලැබේ.

ii. අයදුම්පත මාර්ගගතව ඉදිරිපත් කිරීමෙන් (submit) පසුව **නැවත සංශෝධනය කළ නොහැකි ය.**

iii. එසේම අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබාගැනීමෙන් පසුව, එහි සිදුකරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

iv. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.3 මෙම විභාගයේ පළමු කොටසේ විභාග ගාස්තුව රු.1000/- (දහස) කි. දෙවන කොටස සඳහා එක් ප්‍රශ්න පත්‍රයකට රු.300/- (තුන් සියය) කි. දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවිය යුත්තේ පළමු කොටස සමත් වීමෙන් අනතුරුවය. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත සඳහන් ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්(Any Bank Debit Card with the facility of Internet Transactions).

7.4 ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් (E-mail) මගින් හෝ දන්වනු ලැබේ. විභාගයේ දෙවන කොටස සඳහා විභාග ගාස්තු ගෙවීමේ දී අපේක්ෂකයා අයදුම් කරන ලද සියලු සේවාවන් සඳහා නියමිත ප්‍රශ්න පත්‍ර සියල්ලටම එක් ප්‍රශ්න පත්‍රයකට රුපියල් 300/- (තුන්සියයක්) බැගින් ගෙවිය යුතු ය. මෙම මුදල ගෙවිය යුත්තේ විභාගයේ පළමු කොටස සමත් වීමෙන් පසුව දෙවන කොටසට අදාළ ප්‍රවේශ පත්‍රය ලබා ගැනීම සඳහා වේ. අදාළ වන පරිදි නියමිත මුදලම ගෙවිය යුතු අතර, විභාග ගාස්තු අඩුවෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. එසේම විභාගයේ පළමු කොටස අවසානයේ දී අයදුම්කරුවන් දෙවන කොටස සඳහා සුදුසුකම් ලබා ඇති/ නැති බව විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. විභාගයේ පළමු කොටස සමත් වන අයදුම්කරුවන්ට ඒ බව දැනුවත් කිරීමට කටයුතු කරන බැවින් ඉල්ලුම් පත්‍රයේ සටහන් කර ඇති ජංගම දුරකථන අංකය සක්‍රීයව තබා ගැනීම අයදුම්කරුවන්ගේ වගකීමකි.

7.5 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම හෝ කරනු නොලැබේ.

7.6 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් රාජ්‍ය/ පළාත් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතීඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලය ලත් නිලධාරියකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

සටහන: ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වනුයේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

7.7 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර **මාර්ගගතව පමණක්** නිකුත් කරනු ඇත.

විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විදියට තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

සටහන: ලිඛිත විභාගයේ පළමු කොටස (පොදු කොටස) සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ ප්‍රශ්න පත්‍රදෙකෙහි මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබන අයදුම්කරුවන් සඳහා පමණක් තමන් අයදුම් කරන ලද එක් එක් සේවාවල දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස) සඳහා නැවත ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබේ.

7.8 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

7.9 විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

8. **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-**

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇති බව පත්වීම් ලබා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඔහුගේ/ ඇයගේ පත්වීම් අවලංගු කරනු ලබන අතර අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් ආපසු අය කර ගනු ලැබේ.

9. **පත්වීම් මාධ්‍යය:-**

විභාගයට පෙනී සිටින ලද මාධ්‍යය පත්වීම් මාධ්‍යය ලෙස සලකනු ලැබේ.

10. **විභාග ක්‍රමය, සම්මුඛ පරීක්ෂණ හා පත්කිරීම :-**

10.1 **ලිඛිත විභාගය :-**

10.1.1 පළමු කොටස (පොදු කොටස) :

මෙම කොටස සඳහා සියලුම අයදුම්කරුවන් පෙනී සිටිය යුතු ය.

සටහන : ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය සඳහා <u>**පමණක්**</u> අයදුම්කරන ලද අපේක්ෂකයන් මෙහි බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා පමණක් පෙනී සිටිය යුතු ය.

ප්‍රශ්න පත්‍රය	*විෂය නිර්දේශය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
1. බුද්ධි පරීක්ෂණය	අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනාගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්නවලින් යුක්ත වේ.	බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. මුළු ලකුණු 100 කාලය පැය 1 ½
2. අවබෝධය	අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.	බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ. මුළු ලකුණු 100 කාලය පැය 02

10.1.2 දෙවන කොටස (අදාළ සේවාවට විශේෂ වන කොටස) :

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය, ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය සහ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය යන සේවාවන්ට අදාළව අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවකුම මෙම දෙවන කොටසේ අදාළ සේවාවට විශේෂ වන ප්‍රශ්න පත්‍ර සියල්ලටම පෙනී සිට සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම අවම ලකුණු 40ක් හෝ ඊට වැඩියෙන් ලබා තිබිය යුතු ය.

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස -

(*අ*) ප්‍රශ්න පත්‍රය :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
11. සාමාන්‍ය දැනීම	පැය 01	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. බහුවරණ/ කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්නවලින් සමන්විත වේ.
12. විශ්ලේෂණාත්මක අධ්‍යයනය	පැය 01 2/1	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ.

(*ආ*) විෂය නිර්දේශය :

11. සාමාන්‍ය දැනීම
අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ එනම්, දේශීය අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති, නවීකරණ හා ප්‍රතිසංස්කරණ, දේශීය අධ්‍යාපනයේ ඉතිහාසය හා කාලීන තොරතුරු, අධ්‍යාපනයේ දේශීය හා ජාත්‍යන්තර ප්‍රවණතා ආදී ක්ෂේත්‍රයන් කෙරෙහි වැඩි නැඹුරුවක් සහිතව සහ දේශීය හා විදේශීය අධ්‍යාපනයේ කාලීන තොරතුරු එනම් විද්‍යාත්මක හා තාක්ෂණික, සමාජ-ආර්ථික, දේශපාලනික, භූගෝලීය, නෛතික, පාරිසරික, සංස්කෘතික, ක්‍රීඩා පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ / කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් සමන්විත වේ.

12. විශ්ලේෂණාත්මක අධ්‍යයනය
අපේක්ෂකයා සතු විශ්ලේෂණ, සංස්ලේෂණ සහ නිර්මාණාත්මක හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන සිද්ධි අධ්‍යයනය ඇතුළත්ව, වගු හා ප්‍රස්තාර ආදිය ආශ්‍රයෙන් සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් සමන්විත වේ .

ii. ශ්‍රී ලංකා පරිපාලන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස -

(*අ*) ප්‍රශ්න පත්‍රය :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
21. සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. ව්‍යූහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/ හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ.
22. කළමනාකරණ අභියෝග්‍යතාව	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. ව්‍යූහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/ හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ.
23. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. රචනා/ අර්ධ ව්‍යූහගත රචනාවලින් සමන්විත වේ.

(*ආ*) විෂය නිර්දේශය :

21. සමාජ, ආර්ථික හා දේශපාලන ප්‍රවණතා
දේශීය හා විදේශීය සමාජ, ආර්ථික, දේශපාලන, සංස්කෘතික, විද්‍යා හා තාක්ෂණ තත්ත්වයන් පිළිබඳ විෂය දැනුම හෝ අපේක්ෂකයාට යොමු කරනු ලබන තත්ත්වයන් හා අදාළව නිර්මාණාත්මකව, විශ්ලේෂණාත්මකව හා විචාරාත්මකව සිතීමේ හැකියාව, ප්‍රමුඛතාවය තීරණය කිරීමේ කුසලතාව හා ක්‍රමෝපායාත්මක අනාගත ප්‍රක්ෂේපණ හැකියාව සම්බන්ධයෙන් හෝ අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.
22. කළමනාකරණ අභියෝග්‍යතාව
ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය, ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම සහ භාවමය බුද්ධිය යනාදී වශයෙන් අපේක්ෂකයාට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවන් අනුසාරයෙන් අපේක්ෂකයා සතු කුසලතාව මැන බැලීම මෙයින් අදහස් කෙරේ.

23. නිර්මාණාත්මක, විශ්ලේෂණාත්මක හා සන්නිවේදන කුසලතා
දෙන ලද මාතෘකාවන් / තේමාවන් සමූහයක් අතුරින් අපේක්ෂකයා විසින් තෝරා ගන්නා ලද මාතෘකාවන් / තේමාවන් ඔස්සේ අදහස් හා තොරතුරු විශ්ලේෂණය කිරීම, ගොනු කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයා දක්වන තර්කනය සහ පරිකල්පන ශක්තිය මැන බැලීම මෙන්ම සංකීර්ණ ඡේදයක්, ලියවිල්ලක් හෝ සංදේශයක් වටහාගැනීමට සහ එහි ඇති ප්‍රධාන අදහස් තමාගේම වචනයෙන් සාරාංශ වශයෙන් පැහැදිලිව හා නිවැරදිව ප්‍රකාශ කිරීමට හෝ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

iii. **ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස -**

(*අ*) ප්‍රශ්න පත්‍රය :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
31. විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි පර්යේෂණ ධාරාව)	පැය 02	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ **40**යි. මෙය නියම කර ඇති විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැනුම මැන බැලීම සඳහා පවත්වනු ලබන ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකි. එක් එක් අයදුම්කරුවන් විසින් තමන් ඉල්ලුම් කරනු ලබන තනතුරට හෝ තනතුරුවලට අදාළ වන පරිදි තෝරාගනු ලබන ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ. මෙම ප්‍රශ්න පත්‍ර අදාළ ක්ෂේත්‍රයේ න්‍යායාත්මක දැනුමට වැඩි නැඹුරුවක් වන සේ සකස් කරනු ලැබේ.
32. විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි සංවර්ධන ධාරාව)		
33. විෂයානුබද්ධ දැනුම මැන බැලීම (කෘෂි ආර්ථික විද්‍යා ධාරාව)		

(*ආ*) විෂය නිර්දේශය :
එක් එක් තනතුරට අදාළ විෂය නිර්දේශ පහත දැක්වේ.

සැලකිය යුතු යි: **<u>කෘෂි පර්යේෂණ ධාරාව සඳහා</u>** පහත (අ) සහ (ආ) හි සඳහන් කොටස් ඇතුළත් ප්‍රශ්න පත්‍ර 2කින් සමන්විත වන අතර අයදුම්කරුවන්ගේ මනාපය පරිදි **<u>ඉන් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා පමණක්</u>** පිළිතුරු සැපයිය යුතු යි.

එලෙස පෙනී සිටීමට අදහස් කරන ප්‍රශ්න පත්‍රය සඳහා මනාපය, අයදුම් කරන අවස්ථාවේදීම සටහන් කළ යුතු අතර එය කිසිදු කරුණක් මත පසුව සංශෝධනය කිරීමට ඉඩ දෙනු නොලැබේ.

<u>31 කෘෂි පර්යේෂණ ධාරාව සඳහා ප්‍රශ්න පත්‍ර:</u>
<u>(අ) කොටස</u> 01. කෘෂිකාර්මික උද්භිද විද්‍යාව: බෝගවල වර්ගීකරණ මූලධර්ම, බෝග වර්ධන හා කායික විද්‍යාත්මක මූලධර්ම. 02. ප්‍රවේණි විද්‍යාව හා ශාක අභිජනනය: මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති අනුක ප්‍රවේණිය, සෛල ප්‍රවේණි විද්‍යාව, ප්‍රමාණාත්මක ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය, පරාගනය සහ අභිජනන සංකල්ප, විසංයෝගීතාව, මහා සහ නුමුහුන් ජේලිවරණය, බහුලව භාවිත වන අභිජනන ක්‍රම හා වර්තමාන නැඹුරුව.

03. ශාක ව්‍යාධි විද්‍යාව:

ව්‍යාධි ජනක ජීවී කාණ්ඩ, ආසාදන, ඒවාට පැළෑටි දක්වන සංවේදිතාව, ආසාදන ආකාර, මේවා පාලනයේ මූලධර්ම, ශාක ව්‍යාධි විද්‍යාවේ සහ රෝග පාලනය පිළිබඳව වර්තමාන නැඹුරුව, රෝග විනිශ්චය කිරීමේ තාක්ෂණික ක්‍රම, රෝග ලක්ෂණ විද්‍යාව, කොක්ගේ උපකල්පිතය, රෝග විනිශ්චයේ නව තාක්ෂණ ක්‍රම **(ELISA)** හා වර්තමාන නැඹුරුව.

04. කීට විද්‍යාවේ මූලධර්ම:

සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

05. බීජ තාක්ෂණය:

බීජ කායික විද්‍යාව, බීජයක ව්‍යූහය, සුප්තතාව, ප්‍රරෝහණය, ජීව්‍යතාව, බීජ පරීක්ෂණ සහ පාරිශුද්ධතාව සඳහා පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථා, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

06. පටක විද්‍යාව:

මූලධර්ම, පටක විද්‍යාවේ පහසුකම් හා අවශ්‍යතාව, මාධ්‍යයන්, පටක විද්‍යා රෝපණ ක්‍රම භාවිත කරන අවස්ථා, ප්‍රාක්ප්ලාස්මීය රෝපණය, විකෘති බිහිවීම, කලල බේරා ගැනීම, නලස්ථ සංස්ථේනය, ජානයේ පරිණාමය , ප්‍රාක් සංරක්ෂණය.

07. කෘෂිකාර්මික රසායන විද්‍යාව:

ජීව රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ජීව රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, ආහාර රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ආහාර රසායන විද්‍යාවේ ප්‍රායෝගික භාවිතයන්, විශ්ලේෂණාත්මක රසායන විද්‍යාවේ මූලධර්ම හා කෘෂිකර්මාන්තයේදී ප්‍රායෝගික භාවිතයන්

හෝ

(ආ) කොටස

01. ශෂ්‍ය විද්‍යාව:

කෘෂි දේශගුණික විද්‍යාව, පරිසර විද්‍යාව, භූමි සංවර්ධනය, භූමි සැකසීම, බෝග වර්ධනයේ හා කායික විද්‍යාවේ මූලධර්ම, බෝග වර්ධන මිනුම්, අස්වනු පරාමිති, පොහොර නිර්දේශ හා කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව හා පාලනය, ජල සම්පාදන ක්‍රමවල මූලධර්ම, බෝග පාංශු හා ජල සම්බන්ධතාවේ මූලධර්ම.

02. බෝග විද්‍යාව:

වී, උස් බිම් ධාන්‍ය, මාෂ බෝග, අල බෝග හා අනෙකුත් ක්ෂේත්‍ර බෝගවල කායික විද්‍යාව, වර්ධන ප්‍රචාරණ ක්‍රම, රෝපණ ක්‍රම, බෝග පාලනයේ භෞතික, රසායන හා ජීව විද්‍යාත්මක ක්‍රම, විද්‍යාත්මක තෘණ බිම් ඇති කිරීම හා ඒවා පාලනය, දැව නිෂ්පාදන හා පලතුරු නිෂ්පාදන මූලධර්ම.

03. පාංශු විද්‍යාව:

පස නිර්මාණය, පසක භෞතික හා රසායනික ගති ලක්ෂණ, බෝග වගාවට අදාළව පසෙහි ඇති ගැටලු, පසෙහි සාරවත් බව පාලනය, ජල පෝෂණය පාලනය, පැළෑටි පෝෂක, පැළෑටි වර්ගීකරණ මූලධර්ම.

04. ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි අභිජනනය:

මූලධර්ම, මෙන්ඩල්ගේ නියම, ගහණ ප්‍රවේණි විද්‍යාව, විකෘති, අනුක ප්‍රවේණි විද්‍යාව, සෛල ප්‍රවේණි විද්‍යාව, ශාක අභිජනනයේ මූලධර්ම, ජාන සම්පත් ආරක්ෂා කිරීම හා ජෛව විවිධත්වය.

05. පැළෑටි ව්‍යාධි විද්‍යාව:

පැළෑටි ආසාදන, ආසාදනවලට පැළෑටිවල සංවේදිතාව, ජෛව පාලනය, රෝග පාලනයේ නූතන ප්‍රවණතා.

06. කීට විද්‍යා මූලධර්ම:

සත්ත්ව වර්ගීකරණයේ මූලධර්ම, කෘමීන් වර්ග විලාසයන්, ජීවන තොරතුරු සහ හානි, කෘමි හානිවල ආර්ථික වැදගත්කම, කෘමි ගහණ හා හානි තක්සේරු කිරීම.

07. ක්ෂේත්‍ර පර්යේෂණ මූලධර්ම හා මූලධර්මයන් **(Statistical Principles)** සහ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි වැදගත් සංඛ්‍යාලේඛන පිළිබඳ දැනුම.

08. කීට විද්‍යා:

කෘෂිකර්මාන්තයේදී ආර්ථික වශයෙන් වැදගත් කෘමීන්, ඔවුන්ගේ වර්ගීකරණය, බාහිර සහ අභ්‍යන්තර ගති ලක්ෂණ, විවිධ පද්ධතිවල නිර්මාණය හා ඒවායින් කෙරෙන කාර්යයන්, පළිබෝධ පාලනය, පළිබෝධ හානිවල වැදගත්කම, පළිබෝධ හඳුනා ගැනීම, ඔවුන්ගේ හානිය හා පාලනය, ඒකාබද්ධ පළිබෝධ පාලනය.

09. ක්ෂුද්‍ර ජෛව විද්‍යාව:

ක්ෂුද්‍ර ජීවීන් හා කෘෂිකාර්මික පරිසරය, ජෛව තාක්ෂණය කෘෂිකර්මය සඳහා භාවිතය, පාංශු ජීවීන් හා කෘෂිකර්මයට ඔවුන්ගේ බලපෑම.

10. ජීවමිතිය හා ව්‍යවහාරික යෙදවුම් සංඛ්‍යානය:

සංඛ්‍යානය සම්බන්ධ මූලික දැනුම, කෘෂිකාර්මික පර්යේෂණ, සැලසුම් විශ්ලේෂණ, දත්තයන් ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

32. කෘෂි සංවර්ධන ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. සාමාන්‍ය කෘෂිකර්මය:

ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප, ඉඩම් සංවර්ධනය, භූමි සැකසීම හා ආම්පන්න, බෝග ස්ථාපනය හා ඒ සඳහා අවශ්‍ය කරන යන්ත්‍ර සූත්‍ර, පස හා පසෙහි සාරවත් බව, තවාන් හා තවාන් පාලනය, රෝපණ ද්‍රව්‍ය, පළිබෝධ පාලනය, පැළෑටි සංරක්ෂණය, උපකරණ, බෝග වගා ක්‍රම, ජලසම්පාදන ක්‍රම, ඒකාබද්ධ ගොවිතැන, ආරක්ෂිත කෘෂිකර්මය, ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම, අස්වැන්න නෙලීම හා අස්වැන්න නෙලන උපකරණ, පසු අස්වනු හානි, ගොවිපළ නිෂ්පාදන සකස් කිරීම, විශේෂිත ප්‍රදේශවල වගාකිරීමට සුදුසු එළවළු වර්ග, පලතුරු, පියළි බෝග සහ ධාන්‍ය තෝරාගැනීමේදී සැලකිය යුතු කරුණු, ඒකාබද්ධ පළිබෝධ පාලනය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ පද්ධති, ශාක ආරක්ෂණ පනත, පාංශු සංරක්ෂණ පනත.

02. බෝග නිෂ්පාදනය:

ශෂ්‍ය විද්‍යාව, කෘෂි දේශගුණික සහ පරිසරය, භූමි සංවර්ධනය සහ බිම් සැකසීම, බෝගවල වැඩීමේ මූලධර්ම සහ පැළෑටි භෞතවේදය, බෝගවල වැඩීම මැනීම, අස්වනු සංරචක, පොහොර නිර්දේශ හා ඒවායේ කාර්යක්ෂමතාව, වල් පැළෑටිවල ජීව විද්‍යාව සහ පාලනය, ජල සම්පාදනය, ශෂ්‍ය විද්‍යාව, බෝග හා ජලය අතර සම්බන්ධතාවේ මූලධර්ම.

03. ක්ෂේත්‍ර බෝග:

හැඳින්වීම, පාරිසරික අවශ්‍යතාවන්, ශාක විශේෂ හා ප්‍රභේද, පැළෑටි වර්ධනයේ භෞතවේදය, අස්වැන්න තීරණය කිරීමේ කායික විද්‍යාත්මක මූලධර්ම, වී බෝගයේ ශෂ්‍ය විද්‍යාව, බෝග පාලනය හා නිෂ්පාදනය, උස්බිම් ධාන්‍ය, රනිල, අල බෝග සහ වෙනත් වැදගත් ක්ෂේත්‍ර බෝග (දුම්කොළ, ලූණු, කෙඳි බෝග සහ තෙල් බෝග)

04. බෝග පාලනය:

අතුරු බෝග වගාව, අස්වැන්න නෙලීම හා සැකසීම.

05. උද්‍යාන බෝග නිෂ්පාදනය:

පලතුරු නිෂ්පාදනය, පෝෂණ අගය, සාමාජීය හා ආර්ථික සාධක, ආරම්භය හා ව්‍යාප්තිය, පාරිසරික අවශ්‍යතාවන්, වගා ක්‍රම, නව තාක්ෂණික ක්‍රම භාවිතය.

06. පලතුරු, එළවළු හා මල් නිෂ්පාදනය:

තවාන් පාලනය, උද්‍යාන පාලනය, බෝග ආශ්‍රිත නව තාක්ෂණයන් හා වගා ක්‍රම, පලතුරු හා එළවළු බෝග වැඩි දියුණු කිරීම, පලතුරු හා එළවළු මූලික වූ බෝග වගා ක්‍රම, පසු අස්වනු හානි, පලතුරු හා එළවළුවල පසු අස්වනු හානි වළකා ගැනීම, ජෛව තාක්ෂණය, පලතුරු හා එළවළුවලට දේශීය හා විදේශීය වෙළඳපොළවල්, නූතන සීමාවන් හා අනාගත උපාය මාර්ග, එළවළු නිෂ්පාදනය සඳහා අවශ්‍යතාවන්, එළවළු මූලික බෝග වගා ක්‍රම, අලෙවිය, මල් වගා කර්මාන්තය, ප්‍රවාරණ තාක්ෂණය, වගා ක්‍රම, ප්‍රශස්ත පරිමිති , භූමි අලංකරණ මූලධර්ම.

07. කෘෂිකර්ම ව්‍යාප්තිය හා පුහුණුව:

කෘෂිකර්ම ව්‍යාප්තිය අර්ථ දැක්වීම හා පරමාර්ථ, කෘෂිකාර්මික සංවර්ධනය හා කෘෂිකර්ම ව්‍යාප්තිය, අනුවර්තනය හා නව්‍යතා විසරණය, සන්නිවේදනය, ව්‍යාප්ති ඉගැන්වීමේ ක්‍රම, ශ්‍රී ලංකාවේ භාවිත කෙරෙන ව්‍යාප්ති ප්‍රවේශයන්, පර්යේෂණ ව්‍යාප්ති සම්බන්ධතාව, ව්‍යාප්ති වැඩසටහන් සැලසුම් කිරීම, සමාලෝචන හා ඇගයීම , ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යාප්තිය හා සම්බන්ධ වූ ආයතන, වැඩිහිටි අධ්‍යාපනය, පුහුණු කිරීමේ ක්‍රියාවලිය, පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමට භාවිත කෙරෙන විවිධ ක්‍රම, පාඩම් සැලසුම් සැකසීම, පුහුණුව ඇගයීම, පුහුණුව සඳහා ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ භාවිතය.

08. බීජ තාක්ෂණය:

බීජ කායික විද්‍යාව, බීජ ව්‍යුහය, බීජ රූප විද්‍යාව, බීජ ප්‍රරෝහණය, බීජ ප්‍රරෝහණ ශක්තිය, බීජ පරීක්ෂා කිරීම, බීජ ප්‍රරෝහණ ශක්තිය හා පාරිශුද්ධතාව පිළිබඳ පරීක්ෂණ, බීජ නිෂ්පාදනයේ අවස්ථාවන්, බීජ සහතික කිරීම, බීජ ගබඩා කිරීම.

09. මී මැසි පාලනය:

මී මැසි ඝණාවාසයක මී මැසි වර්ග හා වද වර්ග, මී මැසි පෙට්ටිවල කොටස් , මී මැසි ඝණාවාස අල්ලා ගැනීම, තැන්පත් කිරීම, කට්ටි බෙදීම, මී මැසි ඝණාවාසයක රෝග හා පළිබෝධ.

33. කෘෂි ආර්ථික විද්‍යා ධාරාව සඳහා ප්‍රශ්න පත්‍රය

01. කෘෂිකාර්මික නිෂ්පාදන ආර්ථික විද්‍යාව හා ගොවිපළ පාලනය:

කෘෂිකාර්මික නිෂ්පාදනයේදී ගොවිපළ පාලනයේ ඇති වැදගත්කම, මූලික සංකල්ප, නිෂ්පාදන ශ්‍රිතය, නිෂ්පාදන ශ්‍රිතයන්හි ස්වරූප, නිෂ්පාදන ශ්‍රිතයේ හැඩය, නිෂ්පාදන උපේක්ෂා වක්‍ර ත්වරණය, සම ආදායම් රේඛාව, උපයන සම්පත් සම්බන්ධතාව හා පිරිවැය අවම ප්‍රමාණයට අවදානම පිළිබඳ මූලධර්ම, හීනවන ඵලදා න්‍යාය, ආදේශය හා ආදායම් ප්‍රතිවාපාක, කෘෂිකර්මයේ ඇති අවදානම හා අඩමානයට මුහුණදීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ නැමියාව හා විවිධාංගීකරණය, කෘෂිකාර්මික මිල නියම කිරීමට අදාළ වන පරිදි මිල න්‍යාය, බෝග සහ සත්ත්ව සංයෝග අගය කිරීම, ගොවිපල් ප්‍රමාණය හා පරිමාණුකූල ඵල, පවුල් ගොවිපල්වල වැදගත්කම හා සාපේක්ෂ වාසිය පිළිබඳ මූලධර්ම, ගොවිපල් යාන්ත්‍රීකරණයේ ශක්තිමත් හා දුර්වල කරුණු නිර්ණය කිරීමේදී වාර්තාවල ඇති වැදගත්කම හා උපරිම කරන ආකෘති සඳහා මෙම තොරතුරු ඇතුළත් කිරීම.

02. කෘෂිකාර්මික අලෙවිය: අලෙවි කිරීමේ මූලධර්ම, නිෂ්පාදනයේ හා අලෙවියේ සාපේක්ෂ වැදගත්කම, ශ්‍රී ලංකාවේ අලෙවිය පිළිබඳ කටයුතු කරන ආයතන, අලෙවි මාර්ග වර්ධනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමෙහිලා එවැනි ආයතනයක කාර්ය භාරය, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නිෂ්පාදන අලෙවි කිරීමේදී මුහුණ පෑමට සිදුවන ගැටලු හා අලෙවි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට අදාළ මූලධර්ම. 03. ඉඩම් ආර්ථික විද්‍යාව: ආර්ථික විද්‍යාත්මක සංකල්ප ඉඩම් පරිශීලනයට බලපාන අයුරු, ශ්‍රී ලංකාවේ ඉඩම් සඳහා ඉල්ලුම හා සැපයුම, ඉඩම් පරිශීලන කටයුතු ශ්‍රී ලංකාවේ සැලසුම් කරන අයුරු, ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීමේ හා මිනිසුන් පදිංචි කරවීමේ වැඩසටහනේ වැදගත්කම.

iv. **ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස**

(*අ*) ප්‍රශ්න පත්‍රය

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
41. සාමාන්‍ය සම්ප්‍රජානනය	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ **40**යි. ව්‍යූහගත රචනා, බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි ප්‍රශ්නවලින් සමන්විත වේ.

(ආ) විෂය නිර්දේශය

41. සාමාන්‍ය සම්ප්‍රජානනය
ශ්‍රී ලංකාවේ භූගෝලීය, දේශපාලනීය, ආර්ථික, සාමාජයීය හා සංස්කෘතික පරිසරය ඇතුළු ශ්‍රී ලංකාවේ මුළු පරිසරය පිළිබඳව සහ අන්තර්ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කාලීන තත්ත්වයන් මෙන්ම විද්‍යාත්මක සහ තාක්ෂණ වර්ධනයන් පිළිබඳව අපේක්ෂකයාගේ සම්ප්‍රජානනය පිරික්සීම සඳහා වූ ප්‍රශ්නවලින් සමන්විත වේ.

v. **ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස**

(*අ*) ප්‍රශ්න පත්‍රය

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
51. මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ. (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි. II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි.)
52. උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය	පැය 03	මුළු ලකුණු 100, සමත් අවම ලකුණ 40 යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ. (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි. II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි.)

(අා) විෂය නිර්දේශය

51. මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02කින් යුක්ත වන අතර ප්‍රශ්න 08කින් සමන්විත වේ)

I කොටස - මූල්‍ය ගණකාධිකරණය

මෙම කොටස ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න හතරෙන් (04) දෙකක් (02) තෝරාගත යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1.අනිවාර්යය ප්‍රශ්නය :

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අනු කොටස් පහක් ඇති අතර සෑම කොටසකටම ලකුණු 04 ක් හිමි වේ.

මෙම ප්‍රශ්නය යටතේ පහත දැක්වෙන ශ්‍රී.ලං.ගි.ප්‍රමිති ආවරණය කරනු ලැබේ.

- මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී.ලං.ගි.ප්‍ර.1
- දේපල, පිරියත හා උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.16
- අයභාරය –ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 7
- තොග - ශ්‍රී.ලං.ගි.ප්‍ර.2
- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.8
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිද්ධි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.10
- කල්බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.17
- ආදායම් බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.12
- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර.37
- මූල්‍ය උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.39

2. මූල්‍ය ප්‍රකාශ සඳහා සංකල්පමය හා නියාමන ආකෘති රාමුව

පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශවල අරමුණු, යොදාගන්නා වූ උපකල්පන, මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම හා මිනුම් කිරීම, ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප, ආයතනික පාලනයට අදාළ විධිවිධාන, සමාගම් පනත සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසි හා නීති

3. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඇතුළු සීමිත වගකීම් සමාගම් වල මූල්‍ය ප්‍රකාශ

වගකීමෙන් සීමිත සමාගමක් සඳහා ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගැනීම, කොටස් හා ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කිරීම, කළමණාකාරීත්වයේ කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා පළ කිරීම.

4. ලාභ නොලබන සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

5. මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය, මූල්‍ය ප්‍රතිඵල අර්ථ නිරූපණය හා සන්නිවේදනය කිරීම හා මූල්‍ය නොවන වාර්තාකරණය

II කොටස - කළමනාකරණ ගණකාධිකරණය

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. පිරිවැය ගිණුම්කරණයේ අංග
පිරිවැය වර්ගීකරණය, පිරිවැය හැසිරීම, ඇස්තමේන්තුගත කිරීම, ද්‍රව්‍ය හා තොග පාලනය, ශ්‍රම පිරිවැය, නිශ්චිත හා අඛණ්ඩ ඇණවුම් පිරිවැය

2. පිරිවැය ගිණුම්කරණ ක්‍රම
අන්තර්ග්‍රහණ පිරිවැයකරණය හා ආන්තික පිරිවැයකරණය, ක්‍රියාකාරකම් පාදක පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ප්‍රතිදාන ගිණුම්කරණය, නූතන කළමනාකරණ ගිණුම්කරණය

3. ව්‍යාපාර සඳහා මූල්‍ය ගණිතය හා ව්‍යාපෘති ඇගයීම් මූලිකාංග සංයෝග, වට්ටම් කිරීම

4. ප්‍රමිත පිරිවැයකරණය හා විචලතා විශ්ලේෂණය

5. ව්‍යාපාර කටයුතු සඳහා ගණිතය

6. අයවැයකරණය හා පුරෝකථනය, අයවැයකරණය, අයවැය පිළියෙල කිරීම හා අයවැය පාලනය කිරීම

7. අවිනිශ්චිතතාව යටතේ තීරණ ගැනීම
කෙටිකාලීන හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා වන තොරතුරු, පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණය, වැඩිදුර විස්තීර්ණ සැකසීමේ මිලකරණය, බහුවිධ අවභිරතා යටතේ තීරණ ගැනීම

8. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

52. උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුතු අතර, ප්‍රශ්න 08 කින් සමන්විත වේ.)

I කොටස - උසස් විගණනය

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 05 කින් සමන්විත වන අතර ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. විවිධ විගණන විධි හා එම විගණනයන්වල අරමුණු
මූල්‍ය විගණනය, පද්ධති විගණනය, අනුකූලතා විගණනය, මුදලට අගය විගණනය, කාර්යසාධන විගණනය, වෝහාරික විගණනය, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, කළමනාකරණ විගණනය යනාදිය

2. විගණන සැලසුම්කරණය හා පාලනය
විගණන සැලසුම්කරණය, කාල නිශ්චය, අන්තර් හා අවසන් විගණනය, කාර්යයන් සඳහා වගකීම් පැවරීම, අභ්‍යන්තර පාලනයේ භාවිතය ඇතුළු සිදුකරන ලද කටයුතු වාර්තා කිරීම, අභ්‍යන්තර පාලනය ඇගයීම සඳහා ප්‍රශ්නාවලි හා ආකෘති පත්‍ර පිළියෙල කිරීම.

3. වෘත්තීයමය හැසිරීම හා ආචාර ධර්ම
අවංක බව, ඒකරාශී වීමේදී දක්වන විෂය මූලිකභාවය, විගණන කටයුතු පිළිබඳ තොරතුරු ඇගයීම හා තොරතුරු සන්නිවේදනය කිරීම, තොරතුරුවල රහසිගතභාවය, වෘත්තීයමය බැඳියාව, දැනුම, කුසලතා හා පළපුරුද්ද යොදා ගැනීමේ දක්ෂතාව.

4. නෛතික අයිතිය හා වගකීම්
ගණකාධිකාරීවරුන්ගේ හා විගණකවරුන්ගේ නීතිමය වගකීම් හා අදාළ නීතිමය විධිවිධාන

5. අවදානම් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම හා කළමනාකරණය
විවිධ අවදානම් වර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම හා උපකරණ හඳුනා ගැනීම.

6. විගණන ප්‍රමිතීන්
අන්තර්ජාතික විගණන ප්‍රමිති (ISAs) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs)

7. අභ්‍යන්තර විගණනයේ කාර්යයන්
අභ්‍යන්තර විගණනයේ කාර්යයන් හා අභ්‍යන්තර විගණනයේ අරමුණු හඳුනා ගැනීම, විගණන කමිටු

8. සාක්ෂි රැස් කිරීම
සාක්ෂි එකතු කිරීමේ විවිධ ක්‍රම හා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලි හඳුනා ගැනීම, සාක්ෂිවල වලංගුභාවය සහතික කිරීම

9. වාර්තාකරණ කාර්යයන්
වාර්තා වර්ග, වාර්තාකරණ ප්‍රමිතීන්, ව්‍යූහයන්, වාර්තා කිරීමේ ක්‍රියාවලිය, විගණන මත හා පසු විපරම් ක්‍රියාවලි යනාදිය.

II කොටස - ආර්ථික විශ්ලේෂණය

පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් මෙම කොටස සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමි වේ.

1. සාර්ව ආර්ථික විචල්‍යයන් අවබෝධ කර ගැනීම
සාර්ව ආර්ථික විචල්‍යයන් හා ප්‍රධාන දර්ශක, සාර්ව ආර්ථික විචල්‍යයන් තක්සේරු කිරීමේ අරමුණ, සාර්ව ආර්ථික විචල්‍යයන් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය හඳුනා ගැනීම.

2. ජාතික ආදායම් නිශ්චය කිරීම හා ජාතික ආදායම් ගිණුම්කරණය
ජාතික ආදායම් මැනීමේ ක්‍රම, ජාතික ආදායමේ ආංශික දායකත්වය, ප්‍රාග්ධන පරිභෝජනය සහ ප්‍රාග්ධන පරිභෝජන ගැළපුම්, රාජ්‍ය පරිභෝජනය සහ පෞද්ගලික පරිභෝජනය, ජාතික නිෂ්පාදන හා සුභසාධනය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

3. අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය
අන්තර්ජාතික වෙළඳ න්‍යාය, අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය, ගෙවීම් හා විනිමය අනුපාතයේ හැසිරීම තුලනය කිරීම සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

4. විදේශ මූල්‍ය, විදේශ සෘජු ආයෝජන, සංවර්ධනය වන රටවල ණය, තිරසර ණය කළමනාකරණය, වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

5. ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය අතරමැදියන් හා මූල්‍ය උපකරණ

6. මුදල් ප්‍රතිපත්තිය

7. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

10.2 **සම්මුඛ පරීක්ෂණය**

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය

(අ) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

(i) කුසලතා අනුපිළිවෙළේ රැඳී සිටින අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සහ එම සංඛ්‍යාවෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකහි එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(ii) බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ.

(iii) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය/මණ්ඩල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලැබේ.

(ආ) වාචික සම්මුඛ පරීක්ෂණය :-

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් වාචික පරීක්ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන්ගේ තර්කනය හා ගැටලු විසඳීම, සන්නිවේදන කුසලතාව හා පෞරුෂත්වය මැන බැලීම සඳහා වාචික පරීක්ෂණය පවත්වනු ලැබේ.

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට සනාථ කරන ලද අයදුම්කරුවන් වාචික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

(iii) වාචික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේදී සලකා බලනු ලබන නිර්ණායක

විෂයය ක්ෂේත්‍රය	*උපරිම ලකුණු*
1. තර්කනය හා ගැටලු විසඳීම	10
2. සන්නිවේදන කුසලතාව	10
3. පෞරුෂත්වය	05
එකතුව	**25**

(iv) මෙම *ගැසට්නිවේදනයේ* සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේදී ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු ප්‍රමාණය හා වාචික සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

(v) පළමු වටයේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය හා වාචික පරීක්ෂණය පවත්වා එමඟින් පත්වීම් ලබා දී අවසන් කළ පසුව තවදුරටත් පුරප්පාඩු පවතී නම්, දෙවන වටයකට සම්මුඛ පරීක්ෂණ පවත්වා ඉතිරි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

ii. ශ්‍රී ලංකා පරිපාලන සේවය

පොදු කොටසේ සහ විශේෂිත කොටසේ සියලුම ලිඛිත ප්‍රශ්න පත්‍ර සඳහා නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය වශයෙන් කොටස් දෙක (02) කින් යුක්ත වේ.

(*අ*) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

(i) කුසලතා අනුපිළිවෙළේ රැඳී සිටින අයදුම්කරුවන් අතරින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සහ එම සංඛ්‍යාවෙන් 25%ක ප්‍රමාණයක් යන දෙකහි එකතුව වශයෙන් ගැනෙන සංඛ්‍යාවක් පමණි. සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව ඉහත දැක්වෙන සංඛ්‍යාවට වඩා අඩු වුවහොත් එවැනි අවස්ථාවන්හිදී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ එසේ සුදුසුකම් ලැබූ අපේක්ෂකයන් සංඛ්‍යාව පමණි.

(ii) බඳවා ගැනීමේ සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා එහි සඳහන් සුදුසුකම් පිළිබඳ සීමාවන්ට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.

(iii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලැබේ.

(*ආ*) ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් අයදුම්කරුවන්ගේ කළමනාකරණ කුසලතාව, නායකත්ව ගුණාංග සහ සන්නිවේදන කුසලතාව සහ පෞරුෂත්වය මැන බැලීම සඳහා පහත සඳහන් පටිපාටිය අනුව ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසිපහ (25)කි.

	විෂයය ක්ෂේත්‍රය	*උපරිම ලකුණු*
01	කළමනාකරණ කුසලතා කුසලතාව	10
02	නායකත්ව ගුණාංග	05
03	සන්නිවේදන කුසලතා	05
04	පෞරුෂය	05
	එකතුව	**25**

(ii) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීමේ සියලු සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව සනාථ වූ අයදුම්කරුවන් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් ලබයි. ඉහත සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අයදුම්කරුවන් අතරින් කිසියම් සංඛ්‍යාවක් ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබීම සඳහා සුදුසුකම් නොලැබුව ද එසේ සුදුසුකම් නොලැබූවන් වෙනුවට වෙනත් අයදුම්කරුවන් නැවත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු නොලැබේ.

(iii) මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව අපේක්ෂිත සංඛ්‍යාව බඳවා ගැනීමේදී ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු ප්‍රමාණය හා ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තුන (III) ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

iii. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවය

(i) විභාගයේ පොදු කොටසේ සහ විශේෂිත කොටසේ ප්‍රශ්න පත්‍රවලට ලබා ගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවෙන් උපරිමයේ සිට අනුපිළිවෙළ පදනම් කරගනිමින් එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන් අතරින් මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් පසුව සුදුසුකම් සනාථ කරන අයදුම්කරුවන් අතරින් විභාගයේ පොදු කොටසේ සහ විශේෂිත කොටසේ සියලු ප්‍රශ්න පත්‍ර සඳහා ලබා ගත් ලකුණුවල එකතුවෙන් උපරිමයේ සිට අනුපිළිවෙළ මත මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ඇත. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදු කරනු නොලැබේ.

(ii) ඉහත තනතුරු එකකට වැඩි ගණනකට අයදුම්කොට, එකී තනතුරු කිහිපයක් සඳහා තෝරා ගනු ලැබීමට සුදුසුකම් ඇතිව, ප්‍රමාණවත් ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන ඇති අයදුම්කරුවන්, ඔවුන්ගේ ලිඛිත විභාගයේ ලකුණුවල කුසලතාව හා මෙම විභාගයට අයදුම් කරන අවස්ථාවේ දී තනතුරුවලට ලබාදෙන මනාප අනුපිළිවෙළ සැලකිල්ලට ගෙන තනතුරකට තෝරාගනු ලැබේ. එවැනි අයදුම්කරුවන් තනතුරු සඳහා වූ තම මනාප අනුපිළිවෙළ අයදුම්කරන අවස්ථාවේදී සටහන් කළයුතු අතර, එය කිසිම හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

iv. ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය

(i) සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතරින් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන අපේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අදාළ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලව රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

(ii) ඒ අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අපේක්ෂකයන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර එහිදී මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කෙරෙන අපේක්ෂකයන් කුසලතා අනුපිළිවෙළ අනුව මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සේවයේ III ශ්‍රේණියේ පුරප්පාඩුවලට පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

(i) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වෙන අතර පොදු කොටසේ සහ විශේෂිත කොටසේ සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්, මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සඳහා පමණක් කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේදී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ඇත. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමක් සිදු කරනු නොලැබේ.

vi. ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

(i) අයදුම්කරුවන් ලිඛිත විභාගයේ පළමු කොටසේ බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය සඳහා ලබා ගන්නා ලකුණු අනුපිළිවෙළ මත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
(ii) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන ප්‍රමාණය පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.
(iii) එහිදී ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා ව්‍යවස්ථාවේ හා මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබෙදැයි පරීක්ෂා කිරීම හා කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සිදුකරයි.
(iv) මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදුකරනු නොලැබේ.

vii. ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

(i) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වෙන අතර පොදු කොටසේ සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්, මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු සංඛ්‍යාව සඳහා කුසලතා අනුපිළිවෙළ සැලකිල්ලට ගෙන සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේදී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා අයදුම්පතෙහි සඳහන් කර ඇති මනාපය අනුව පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ. තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ඇත. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදුකරනු නොලැබේ.

(ii) ලිඛිත විභාගයේ පළමු කොටස එනම්, පොදු කොටස පමණක් මෙම සේවාවට අදාළ වන බැවින් එම අදියරෙහි ප්‍රතිඵල නිකුත් කළ පසු මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කෙරෙනු ඇත.

(iii) ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ තනතුරක් සඳහා පත්වීමක් ලැබූ අයදුම්කරුවකු මෙම තරග විභාගයේ ප්‍රතිඵල මගින්ම තම ඉහළ මනාපය පළ කර ඇති වෙනත් දීප ව්‍යාප්ත සේවාවක තනතුරකට පත්වීමක් ලද අවස්ථාවක දී එමඟින් ඇතිවන ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ පුරප්පාඩුව එම සේවයේ ලකුණු කුසලතා අනුපිළිවෙළෙහි ඊළඟට සිටින සුදුසුකම් සනාථ කරන ලද අයදුම්කරුගෙන් සම්පූර්ණ කෙරෙනු ඇත.

viii. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පමණක් පැවැත්වෙන අතර පොදු කොටසේ සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන්, මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් පුරප්පාඩු ගණන සඳහා කුසලතා අනුපිළිවෙළ අනුව පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සංඛ්‍යාව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේදී ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා මෙම විභාගයට අයදුම්කරන අවස්ථාවේ දී තනතුරුවලට ලබා දී ඇති මනාප අනුපිළිවෙළ පදනම්ව පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ඇත. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමක් සිදුකරනු නොලැබේ.

සැලකිය යුතුයි :-

හුදෙක් සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

11. විභාග ප්‍රතිඵල :

11.1 විභාගයට පෙනී සිටි සියලු අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lkවෙබ් අඩවිය මගින් හෝ සිදුකරනු ලැබේ.

11.2 විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

12. මෙහි විධිවිධාන සලසා නොමැති කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ අයිතිය පත්කිරීම් බලධරයා සතුවේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ එකඟතාව සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2026 නොවැම්බර් මස 13 වැනි දින.

11 - 272

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට සීමිත පදනමින් බඳවා ගැනීමේ තරග විභාගය - 2026

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියේ තනතුරුවල පවත්නා පුරප්පාඩු 74ක් සීමිත පදනම මත සම්පූර්ණ කිරීමට පවත්වන සීමිත තරග විභාගය සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඒ සඳහා වන අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment / E.B Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. අයදුම්පත් 2026 නොවැම්බර් මස 16 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 11 වැනි දින ප.ව.09.00ට අවසන් වේ.

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

මෙම විභාගය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන නියමයන්ට යටත්ව, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2027 පෙබරවාරි මස කොළඹ දී පමණක් පවත්වනු ඇත. රට තුළ උද්ගතවිය හැකි විශේෂ තත්ත්වයක් මත පමණක් විභාගය දිවයින පුරා පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එතකුදු වුවත් කිසියම් විභාග මධ්‍යස්ථානයකට ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කර නොමැති අවස්ථාවක දී එම මධ්‍යස්ථානයට මනාපය පළ කර ඇති අයදුම්කරුවන් වෙනත් විභාග මධ්‍යස්ථානයකට යොමු කරනු ලැබේ (මේ පිළිබඳ වැඩිමනත් විස්තර අයදුම්පතේ සඳහන් කර ඇත). රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට යටත්ව මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට විභාග කොමසාරිස් ජනරාල්ට බලය ඇත.

1. මෙම නිවේදනයේ "**පත්කිරීමේ බලධරයා**" යනුවෙන් අදහස් කරනුයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ද "**සේවය**" යන පදයෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය ද වේ.

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1. ලිඛිත විභාගය :- දීප ව්‍යාප්ත සේවාවන් සහ රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පොදු තරග විභාගය මෙයට අදාළ වේ. මෙම තරග විභාගය පහත සඳහන් පරිදි කොටස් දෙකකින් සමන්විතය. පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% හෝ ඊට වැඩි සහ මුළු ලකුණු ප්‍රමාණය 100ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

පළමු කොටස (පොදු කොටස) :

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය*
1. බුද්ධි පරීක්ෂණය	පැය 1 1/2	100	40
2. අවබෝධය	පැය 02	100	40

දෙවන කොටස :

සේවය	*විෂය අංකය*	*ප්‍රශ්න පත්‍රය*	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් වීමට ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය*
ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය	51	මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය	පැය 03	100	40
	52	උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය	පැය 03	100	40

2.2. සම්මුඛ පරීක්ෂණය :- ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටි අයදුම්කරුවන්ගෙන් සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්කිරීමේ බලධරයා විසින් තීරණය කරන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, එම අයදුම්කරුවන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන්

සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

3. මෙම තනතුර සඳහා පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය අනුව තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ල පිරවීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත. අවසාන පුරප්පාඩුව සඳහා හෝ අවසාන පුරප්පාඩු කිහිපය සඳහා සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා සිටින අවස්ථාවක දී එම පුරප්පාඩු සංඛ්‍යාව පිරවීම පිළිබඳ තීරණය, අංක 2310/29 දරන 2022.12.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිහි 92 වගන්තිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලබා දෙනු ලැබේ.

4. බඳවා ගැනීමේ පොදු කොන්දේසි :-

4.1. අංක 1670/33 සහ 2010.09.10 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයට දැනටමත් සිදුකර ඇති හා මතුවට කරනු ලබන සංශෝධනවලට යටත්ව එම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධානවලට ද අංක 2310/29 සහ 2022.12.14 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

4.2. මෙම පත්වීම ස්ථිරය. එනමුත්, පත්වීම්ලාභීන් එක් වර්ෂයක පරිවාස කාලයකට යටත්වන අතර එම පරිවාස කාලය තුළ දී යථා පරිදි සියලු අවශ්‍යතා සපුරාලීමට සමත් වුවහොත් පමණක් පරිවාස කාලය අවසානයේ පත්වීම ස්ථිර කරනු ලැබේ.

4.3. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. පත්වීම්ලාභීන් විසින් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

4.4. අයදුම්කරු විසින් විභාගය සඳහා පෙනී සිටීමට අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය පත්වීම් ලැබීමට සුදුසුකම් ලබන භාෂා මාධ්‍යය වේ.

4.5. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව පත්වීම්ලාභීන් විසින් අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතුය.

4.6. පත්වීම් ලැබ වසර 03ක් ගතවීමට පෙර සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන ආකාරයට පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

4.7. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත් කරන ලද තනතුරක හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි බලය ඇත.

5. වැටුප් ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය :-

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට අදාළ මාසික වැටුප් පරිමාණය රු.82,150 – 10 x 2400 – 8 x 2940 – 17 x 3900 - රු.195,970/- (SL 1 – 2025) වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

6. බඳවා ගැනීමේ සුදුසුකම් :-

(*අ*) i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. විශිෂ්ට චරිතයකින් යුක්ත වීම
iii. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත වීම.

(*ආ*) **අධ්‍යාපන/වෘත්තීය/පළපුරුද්ද සඳහා වූ සුදුසුකම්** :-

i. පහත කවර හෝ සුදුසුකමක් සහිතව සිය පත්වීමෙහි ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය පළකරන දිනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි වැටුප් කේත අංක MN -1-2025 හෝ ඊට සමාන හෝ ඊට ඉහළ කේතයක් යටතේ වැටුප් ලබන සේවයක හෝ තනතුරක වසර පහ (05) කට නොඅඩු අඛණ්ඩ, සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

a. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් හෝ වාණිජ්‍යය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ උපාධියක් ලබා තිබීම;

හෝ

b. ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ /ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියකු විය යුතු ය;

හෝ

c. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක 1991 හා 1992 - 1997 විෂයය මාලා යටතේ ආවසරික II හෝ 1998 - 2004 හා 2005 - 2009 විෂයය මාලා යටතේ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ 2010-2014 විෂයය මාලාව යටතේ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ 2015 - 2019 විෂයය මාලාව යටතේ ව්‍යාපාර අදියර විභාගය හෝ 2020 - 2024 හා 2025 - 2030 විෂයය මාලා යටතේ ආයතනික අදියර විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත්වී සිටිය යුතු ය;

හෝ

d. එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් කළමනාකරණ ගණකාධිකාරීත්ව ආයතනයක් මඟින් පවත්වන පිරිවැය සහ කළමනාකරණ පරීක්ෂණයේ I හා II වැනි කොටස් හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත් වී සිටිය යුතු ය;

හෝ

e. එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ ගණකාධිකරණ ආයතනයේ I වැනි වෘත්තීය මට්ටමේ හෝ වඩා උසස් මට්ටමක පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය;

හෝ

f. එක්සත් රාජධානියේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ වරලත් සංගමයේ I වැනි සහ II වැනි කොටසට අයත් පරීක්ෂණය හෝ ඊට ඉහළ පරීක්ෂණයකින් සමත් වී සිටිය යුතු ය ;

හෝ

g. එක්සත් රාජධානියේ ලේකම්වරුන්ගේ හා පරිපාලකයන්ගේ වරලත් ආයතනයේ අවසාන පරීක්ෂණය සමත් වී සිටිය යුතු ය;

හෝ

h. ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත්වී සිටිය යුතු ය.

හෝ

(ii) සිය පත්වීමෙහි ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය පළ කරන දිනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි වැටුප් කේත අංක

MN -1-2025 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන (පූර්වයෙන් වැටුප් කේත අංක MN -1 හෝ ඊට ඉහළ MN වැටුප් කේත යටතේ වැටුප් ලබා පසුව එම වැටුප් කේත වෙනත් වැටුප් කේතයකට සංශෝධනය කරන ලද සේවා / තනතුරු ද ඇතුළත්ව) හෝ SL-1-2025 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන සේවයක හෝ තනතුරක වසර දහය (10) කට නොඅඩු සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ඇ) සුදුසුකම් පිළිබඳ සීමා :-

i. මෙම විභාගය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනය ප්‍රකාශයට පත් කරන දිනට හෝ ඊට පෙර වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

ii. කුමන හෝ ආගමක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම තරග විභාගයට අයදුම් කිරීමට හෝ පෙනී සිටීමට හෝ අවසර නොමැත.

iii. අයදුම් කිරීමට සුදුසුකම් ලැබීමට පූර්වාසන්නයෙන් වූ වසර පහක/දහයක කාලසීමාව තුළ නියමිත දිනයන්හි දී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

iv. සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා වක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

v. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීම සඳහා පැවති සීමිත තරග විභාග (උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා පවත්වන විශේෂ සීමිත තරග විභාගය ඇතුළුව) වාර තුනකට වඩා පෙනී සිටීමට කිසිදු තැනැත්තකුට අවසර නොමැත.

7. විභාග කොන්දේසි :-

I. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකිය. අපේක්ෂකයන් මෙම විභාගයට අදාළ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි සඳහන් කරනු ලබන විභාග මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව /භාර නොගන්නා බව ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති පොදු උපදෙස් පත්‍රිකාව (Common Instruction) බාගත කරගන්න. අයදුම්පත පිරවීමේදී මෙම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් පසුව කරනු ලබන විමසීම්වල දී ඉදිරිපත් කිරීමට ළඟ තබා ගත යුතු ය. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

III. මෙම විභාගයේ විභාග ගාස්තුව රු.1200කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකුවක ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card);

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකුවක හර කාඩ්පතක් මඟින් (Bank Debit Card with Internet Payment Facility);

(iii) ලංකා බැංකු මාර්ගගත බෑන්කින් ක්‍රමය / Flex යෙදවුම මඟින් (Bank of Ceylon Online Banking Method / Flex App);

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Bank of Ceylon any Branch).

සටහන - ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

IV. ගෙවීම ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් දන්වනු ලැබේ. අදාළ වන පරිදි නියමිත මුදලම ගෙවිය යුතු අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

V. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිදු හේතුවක් මත ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම සිදු කරනු නොලැබේ.

VI. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

සටහන : ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුළු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය පමණි. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේදී විභාගයට පෙනී සිටිය යුතු ය.

VII. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VIII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

IX. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

i. ජාතික හැඳුනුම්පත;
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

8. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :-

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කරනු ලැබේ.

පත්වීම් ලබා ගැනීමෙන් පසුව ඉහත සඳහන් කරුණු පිළිබඳව අනාවරණය වුවහොත්, අදාළ පත්වීම යටතේ වැටුප් හා දීමනා ලෙස රජය/පළාත් සභා විසින් ගෙවා ඇති සියලු මුදල් ආපසු අය කර ගනු ලැබේ.

9. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

10. විභාග ක්‍රමය, සම්මුඛ පරීක්ෂණ හා පත්කිරීම:-

10.1. ලිඛිත විභාගය :

(I) ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

විෂය අංකය	*ප්‍රශ්න පත්‍රය*	*කාලය*	*ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය*
1.	බුද්ධි පරීක්ෂණය	**පැය 1** 1/2	ලකුණු 100, සමත් **අවම** ලකුණ 40 යි. බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි **ප්‍රශ්නවලින්** සමන්විත වේ.
2.	**අවබෝධය**	පැය 02	ලකුණු 100, සමත් **අවම** ලකුණ 40 යි. බහුවරණ ප්‍රශ්න සහ/හෝ කෙටි **ප්‍රශ්නවලින්** සමන්විත වේ.
51.	මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය	පැය 03	ලකුණු 100, සමත් **අවම** ලකුණ 40 යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ) (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි)
52.	උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය	පැය 03	ලකුණු 100, සමත් **අවම** ලකුණ 40 යි. ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ) (I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි)

(II) විෂය නිර්දේශය

බුද්ධි පරීක්ෂණය
අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ.

අවබෝධය
අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ.

මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුක්ත වන අතර ප්‍රශ්න 08 කින් සමන්විත වේ)

I කොටස - මූල්‍ය ගණකාධිකරණය

මෙම කොටස ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න හතරෙන් (04) දෙකක් (02) තෝරාගත යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1.අනිවාර්යය ප්‍රශ්නය :

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අනු කොටස් පහක් ඇති අතර සෑම කොටසකටම ලකුණු 04ක් හිමිවේ.

මෙම ප්‍රශ්නය යටතේ පහත දැක්වෙන ශ්‍රී.ලං.ගි.ප්‍රමිත ආවරණය කරනු ලැබේ.

- මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී.ලං.ගි.ප්‍ර.1
- දේපල, පිරියත හා උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.16
- අයභාරය–ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18
- මුදල් ප්‍රවාහන ප්‍රකාශය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. 7
- තොග - ශ්‍රී.ලං.ගි.ප්‍ර.2
- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.8
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිද්ධි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.10
- කල්බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.17
- ආදායම් බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.12
- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර.37
- මූල්‍ය උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.39

2. මූල්‍ය ප්‍රකාශ සඳහා සංකල්පමය හා නියාමන ආකෘති රාමුව

පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශවල අරමුණු, යොදාගන්නා වූ උපකල්පන, මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම හා මිනුම් කිරීම, ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප, ආයතනික පාලනයට අදාළ විධිවිධාන, සමාගම් පනත සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසි හා නීති

3. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඇතුළු සීමිත වගකීම් සමාගම්වල මූල්‍ය ප්‍රකාශ

වගකීමෙන් සීමිත සමාගමක් සඳහා ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගැනීම, කොටස් හා ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කිරීම, කළමණාකාරීත්වයේ කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා පළ කිරීම.

4. ලාභ නොලබන සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

5. මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය, මූල්‍ය ප්‍රතිඵල අර්ථ නිරූපණය හා සන්නිවේදනය කිරීම හා මූල්‍ය නොවන වාර්තාකරණය

II කොටස - කළමනාකරණ ගණකාධිකරණය

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. **පිරිවැය ගිණුම්කරණයේ අංග**
   පිරිවැය වර්ගීකරණය, පිරිවැය හැසිරීම, ඇස්තමේන්තුගත කිරීම, ද්‍රව්‍ය හා තොග පාලනය , ශ්‍රම පිරිවැය, නිශ්චිත හා අඛණ්ඩ ඇණවුම් පිරිවැය
2. **පිරිවැය ගිණුම්කරණ ක්‍රම**
   අන්තර්ග්‍රහණ පිරිවැයකරණය හා ආන්තික පිරිවැයකරණය, ක්‍රියාකාරකම් පාදක පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ප්‍රතිදාන ගිණුම්කරණය, නූතන කළමනාකරණ ගිණුම්කරණය
3. ව්‍යාපාර සඳහා මූල්‍ය ගණිතය හා ව්‍යාපෘති ඇගයීම් මූලිකාංග
   සංයෝග, වට්ටම් කිරීම
4. ප්‍රමිත පිරිවැයකරණය හා විචලතා විශ්ලේෂණය
5. ව්‍යාපාර කටයුතු සඳහා ගණිතය
6. අයවැයකරණය හා පුරෝකථනය අයවැයකරණය, අයවැය පිළියෙල කිරීම හා අයවැය පාලනය කිරීම
7. **අවිනිශ්චිතතාවය යටතේ තීරණ ගැනීම**
   කෙටිකාලීන හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා වන තොරතුරු, පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණය, වැඩිදුර විස්තීර්ණ සැකසීම් මිලකරණය, බහුවිධ අවභිරතා යටතේ තීරණ ගැනීම
8. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුතු අතර, ප්‍රශ්න 08 කින් සමන්විත වේ.)

I කොටස - උසස් විගණනය

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 05 කින් සමන්විත වන අතර ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. විවිධ විගණන විධි හා එම විගණනයන්වල අරමුණු

   මූල්‍ය විගණනය, පද්ධති විගණනය, අනුකූලතා විගණනය, මුදලට අගය විගණනය, කාර්යසාධන විගණනය, වෝහාරික විගණනය, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, කළමනාකරණ විගණනය යනාදිය

2. විගණන සැලසුම්කරණය හා පාලනය

   විගණන සැලසුම්කරණය, කාල නිශ්චය, අන්තර් හා අවසන් විගණනය, කාර්යයන් සඳහා වගකීම් පැවරීම, අභ්‍යන්තර පාලනයේ භාවිතය ඇතුළු සිදුකරන ලද කටයුතු වාර්තා කිරීම, අභ්‍යන්තර පාලනය ඇගයීම සඳහා ප්‍රශ්නාවලි හා ආකෘති පත්‍ර පිළියෙල කිරීම.

3. වෘත්තීයමය හැසිරීම හා ආචාර ධර්ම

   අවංක බව, ඒකරාශී වීමේදී දක්වන විෂය මූලිකභාවය, විගණන කටයුතු පිළිබඳ තොරතුරු ඇගයීම හා තොරතුරු සන්නිවේදනය කිරීම, තොරතුරුවල රහසිගතභාවය, වෘත්තීයමය බැඳියාව, දැනුම, කුසලතා හා පළපුරුද්ද යොදා ගැනීමේ දක්ෂතාවය

4. නෛතික අයිතිය හා වගකීම්

   ගණකාධිකාරීවරුන්ගේ හා විගණකවරුන්ගේ නීතිමය වගකීම් හා අදාළ නීතිමය විධිවිධාන

5. අවදානම් තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රම හා කළමනාකරණය

   විවිධ අවදානම් වර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම හා උපකරණ හඳුනා ගැනීම

6. විගණන ප්‍රමිතීන්

   අන්තර්ජාතික විගණන ප්‍රමිති (ISAs) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs)

7. අභ්‍යන්තර විගණනයේ කාර්යන්

   අභ්‍යන්තර විගණනයේ කාර්යන් හා අභ්‍යන්තර විගණනයේ අරමුණු හඳුනාගැනීම, විගණන කමිටු

8. සාක්ෂි රැස්කිරීම

   සාක්ෂි එකතු කිරීමේ විවිධ ක්‍රම හා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලි හඳුනාගැනීම, සාක්ෂිවල වලංගුභාවය සහතික කිරීම

9. වාර්තාකරණ කාර්යයන්

   වාර්තා වර්ග, වාර්තාකරණ ප්‍රමිතීන්, ව්‍යුහයන්, වාර්තා කිරීමේ ක්‍රියාවලිය, විගණන මත හා පසු විපරම් ක්‍රියාවලි යනාදිය.

II කොටස - ආර්ථික විශ්ලේෂණය

පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් මෙම කොටස සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. සාර්ව ආර්ථික විචල්‍යයන් අවබෝධ කර ගැනීම

   සාර්ව ආර්ථික විචල්‍යයන් හා ප්‍රධාන දර්ශක, සාර්ව ආර්ථික විචල්‍යයන් තක්සේරු කිරීමේ අරමුණ, සාර්ව ආර්ථික විචල්‍යයන් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය හඳුනාගැනීම.

2. ජාතික ආදායම් නිශ්චය කිරීම හා ජාතික ආදායම් ගිණුම්කරණය

   ජාතික ආදායම් මැනීමේ ක්‍රම, ජාතික ආදායමේ ආංශික දායකත්වය, ප්‍රාග්ධන පරිභෝජනය සහ ප්‍රාග්ධන පරිභෝජන ගැලපුම්, රාජ්‍ය පරිභෝජනය සහ පෞද්ගලික පරිභෝජනය, ජාතික නිෂ්පාදන හා සුභසාධනය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

3. අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය

   අන්තර්ජාතික වෙළඳ න්‍යාය, අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය, ගෙවීම් හා විනිමය අනුපාතයේ හැසිරීම තුලනය කිරීම සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

4. විදේශ මූල්‍ය, විදේශ සෘජු ආයෝජන, සංවර්ධනය වන රටවල ණය, තිරසර ණය කළමනාකරණය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

5. ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය අතරමැදියන් හා මූල්‍ය උපකරණ

6. මුදල් ප්‍රතිපත්තිය

7. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

10.2. **සම්මුඛ පරීක්ෂණය**

I. සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් හෝ ඊට වැඩි ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් ලබා ඇති ලකුණුවල කුසලතා අනුපිළිවෙළ හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරන අපේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට අදාළ කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලව රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලැබේ.

II. ඒ අනුව, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අපේක්ෂකයන්ගේ සුදුසුකම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ. මෙම සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙනු නොලබන අතර එහිදී මූලික සුදුසුකම් සපුරා ඇති බවට තහවුරු කෙරෙන අපේක්ෂකයන් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III ශ්‍රේණියට පත්කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

සැලකිය යුතුයි :-

හුදෙක් සම්මුඛ පරීක්ෂණයන්ට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

10.3. පත්කිරීමේ බලධරයා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ලැබේ.

11. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එස්. ආලෝකබණ්ඩාර,
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2026 නොවැම්බර් මස 13 වැනි දින.
11 - 296